

# ජනපති පිය සමර

(ඩී.ඒ.රාජපක්ෂ 40 ගුණ සමරුව නිමිත්තෙන් පුවත්පත්වල පළ කිරීමට සකස් කර එවූ මුල් ලිපි එකතු කර මෙම ග්‍රන්ථය සකස් කරන ලදී)

සංස්කරණය - අමරසිංහ කුඹිගල්ආර

ප්‍රකාශන සම්බන්ධීකරණය - චන්ද්‍රපාල ලියනගේ

නිර්මාණය :- ජේ.ඒ. වජිර ශාන්ත ජයසිංහ

# ජනපති පිය සමර

(ඩී.ඒ.රාජපක්ෂ 40 ගුණ සමරුව නිමිත්තෙන් පුවත්පත්වල පළ කිරීමට සකස් කර එවූ මුල් ලිපි එකතු කර මෙම ග්‍රන්ථය සකස් කරන ලදි)

සංස්කාරක - අමරසිංහ කුඩගල්ආර

ජනාධිපති ලේකම් කාර්යාලය පුස්තකාලය
06 DEC 2007

ප්‍රකාශන සම්බන්ධීකරණය:
චන්ද්‍රපාල බියනගේ

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

2 – H 29785

3479
929.3(548.1)

| | |
|---|---|
| පරි. අංක | 3479 |
| වර්ග අංකය | ~~[illegible]~~ 808.4 |
| දිනය | 2007.12.06 |


**ජනපති පිය සමර**


සංස්කරණය : අමරසිංහ කුඩගල්ආර

පළමු වන මුද්‍රණය : 2007

ප්‍රකාශනය සම්බන්ධීකරණය : චන්ද්‍රපාල ලියනගේ

නිර්මාණය : ජේ.ඒ.වජිර ශාන්ත ජයසිංහ

සම්බන්ධීකරණය : ආර්.එම්. ජයවීර

පරිගනක අකුරු සැකසුම : සුසන්ති ප්‍රදීපිකා

මුද්‍රණය : රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව




ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

| | |
|---|---|
| ACC. NO. | |
| CLASS NO. | |
| DATE. | |

# පිළිගැන්වීම

*අතිගරු ජනාධිපති*
මහින්ද රාජපක්ෂ මැතිතුමා

*ගරු අමාත්‍ය*
චමල් රාජපක්ෂ මැතිතුමා

*ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී*
බැසිල් රාජපක්ෂ මැතිතුමා

*ආරක්ෂක ලේකම්*
ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා

ඇතුළු
ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන්ගේ
දූ දරුවන් වෙත



3 - H 29785

# ලේඛකයෝ


01. **අපේකමට පණදුන් ඩී.ඒ. රාජපක්ෂ**
පල්ලන්තර සුමනජෝති නාහිමි
ශ්‍රී සුභද්‍රාරාම පුරාණ විහාරය, මලිගස්පෙ,ගාල්ල

02. **වසර 40 කින් සැබෑ වූ සිහිනයක්**
ආචාර්ය අලුත්වැව සෝරත නා හිමි කතරගම
කිරිවෙහෙර රජමහා විහාරාධිපති, රුහුණු මාගම් පත්තුවේ
ප්‍රධාන සංඝනායක ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කුලපති

03. **දෙවන රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිටි රුහුණේ සිංහයා**
මාතර වැල්ලබඩ පත්තුව ඇතුළු හම්බන්තොට පලාතේ
ප්‍රධාන සංඝනායක මැල්ලකැටිගොඩ සද්ධානන්ද නා හිමි

04. **ගිරුවා දනව්වේ ඩී.ඒ.රාජපක්ෂ** – ආචාර්ය ඕමල්පේ සෝභිත හිමි

05. ජන හදගැස්ම හඳුනා ගත් ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා
ගරු අග්‍රාමාත්‍ය රත්නසිරි වික්‍රමනායක මැතිතුමා

06. **ඩී.ඒ.රාජපක්ෂ චරිතය**
දි.මු. ජයරත්න මැතිතුමා - වැවිලි කර්මාන්ත අමාත්‍ය හා පොදු ජන එක්සත් පෙරමුණේ මහ ලේකම්

07. **ගැමියන් අතර ගැමියෙක් වූ ඩී.ඒ. රාජපක්ෂ මැතිඳු**
මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මහ ලේකම්, කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍ය

08. **රුහුණේ ප්‍රතාපවත් පාලකයා**
අමරසිරි දොඩන්ගොඩ (පා.ම) අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය

09. **Rajapaksa Tradition and the Mahinda Chintana**
by prof. wiswa-warnapala Minister of Higher Education

10. **ගොවි දිවිය සරු කළ රුහුණේ නායකයා**
ඇස්.ඩී බණ්ඩාරනායක මැතිතුමා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී - ගම්පහ

11. **පොදුජන හිතකාමී ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා**
ලක්ෂ්මන් ජයකොඩි මහතා ජනාධිපති උපදේශක

12. **හෙළය එළි කළ රුහුණු මහ පහන**

විමල් රූබසිංහ මහතා

13. ஜனாதிபதியின் தந்தை அமரா டீ.ஏ.ராஜபக்ஷ

සෙල්ලමුත්තු සෝමචන්ද්‍රන්

සම්බන්ධීකරණ ලේකම්, නැගෙනහිර පළාත් සිංහල,දමිළ,මුස්ලිම් සාම සංවිධානය

14. **ඩී. ඒ. රාජපක්ෂ මහතාගේ ජාතික මෙහෙවර අද වඩාත් දීප්තිමත්ව තිබේ** - මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගේ

# පටුන


| | |
|---|---|
| සමරු සටහන | i |
| ඩී.ඒ.රාජපක්ෂ මැතිතුමාගේ ගමන් මග | ii |
| ඩී.ඒ. රාජපක්ෂ මැතිඳු | 14 |
| වසර 40 කින් සැබෑ වූ සිහිනයක් | 15-23 |
| දෙවන රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිටි | 24-27 |
| ගිරුවා දනව්වේ ඩී.ඒ. රාජපක්ෂ | 28-34 |
| ජන හද ගැස්ම හඳුනාගත් | 36-41 |
| ඩී. ඒ. රාජපක්ෂ චරිතය | 42-48 |
| ගැමියන් අතර ගැමියෙක් වූ ඩී.ඒ. රාජපක්ෂ | 50-55 |
| රුහුණේ ප්‍රතාපවත් පාලකයා | 56-59 |
| Rajapaksa Tradition and the | 60-67 |
| පොදුජන හිතකාමී ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා | 68-71 |
| ගොවි දිවිය සරු කළ රුහුණේ නායකයා | 72-78 |
| ஜனாதிபதியின் தந்தை அமரர் டீ.ஏ.ராஜபக்ஷ | 79-84 |
| හෙළය එළි කළ රුහුණු මහ පහන | 86-92 |
| ඩී. ඒ. රාජපක්ෂ මහතාගේ ජාතික මෙහෙවර | 93-96 |

# සමරු සටහන

ඩී.ඒ.රාජපක්ෂ මැතිඳුන් දිවංගත වී 2007.11.07 වැනි දිනට වසර 40 සම්පූර්ණ විය. උතුම් මිනිසෙකු උදාර නායකයෙකු හා සැබෑ ජනතා පුත්‍රයකු වූ එතුමන්ගේ දිවංගත වීම සිහිවන විට ජනහද කම්පිත කරවයි.

කුරහන් සුවඳ ගැමි සුවඳක් සේ අර්ථවත් කරමින් ජනදුක නිවාලන්නට එතුමා ගත් වෙහෙස දැරූ උත්සාහය හා කළ කැපකිරීම අමරණීය වේ. දුරදක්නා නුවනින් ක්‍රියාකළ ආකාරය තැබූ සාර්ථක පියවරයන් නව යුගයක් නිර්මාණය කිරීමටත් ජනතා නව නායකත්වයක් බිහි කිරීමටත් මං පෙත් හෙළි කිරීමකි. එතුමාට නිවැරදි අනාගත දැක්මක් මෙන්ම නිවැරදි දර්ශනයක් ද විය. එතුමා කළ කී දේත් විමර්ශනයට ලක්කළා වූ දැනට ප්‍රකාශිත දේත් වර්තමානයට මෙන්ම අනාගතයට දායාද කර දී ඇති දේත් එය සනාථ කරයි. එතුමාගේ 40 වැනි ගුණ සමරුව වෙනුවෙන් ආගමික නායකයින්, දේශපාලන නායකයින්, හා විද්වතුන් පුවත්පත් වල පළ කිරීමට සකස් කර එවූ ලිපි එකතුවක් මෙසේ පළ කරමු.

මෙසේ ග්‍රන්ථයක් සේ එකී ලිපි සකස් කිරීමට මා දිරිමත් කළ චන්ද්‍රපාල ලියනගේ මහතාට සහ සහයෝගය ලබාදුන් ආර්.එම්.ජයවීර මහතාටත්, සුසන්ති ප්‍රදීපිකා මෙනවියටත් පිටකවරය හා නිර්මාණකාර්ය කරදුන් ජේ.ඒ.වජිර ශාන්ත ජයසිංහ මහතාටත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ අධිපති හා එතුමන්ගේ කාර්ය මණ්ඩලයටත් අපගේ හෘදයාංගම ස්තුතිය හිමිවේ.

සංස්කාරක

# ඩී.ඒ.රාජපක්ෂ මැතිතුමාගේ ගමන් මග

**දෙවැනි රාජ්‍ය මන්ත්‍රණ සභාව**
හම්බන්තොට දිස්ත්‍රික්කයේ රාජ්‍ය මන්ත්‍රණ සභා මන්ත්‍රී 1945.07.14 අතුරු මැතිවරණයෙන් නිතරගයෙන් තේරී පත්වී 1945.08.08 දින අසුන් ගත්තේය.

**කෘෂිකර්ම හා ඉඩම් විධායක කාරක සභාවේ සාමාජික**
1945.08.08 - 1947.07.01 දක්වා

**පළමු වැනි පාර්ලිමේන්තුව - බෙලිඅත්ත පාර්ලිමේන්තු මන්ත්‍රී**
1947.10.14 - 1952.04.02 දක්වා

**දෙවැනි පාර්ලිමේන්තුව - බෙලිඅත්ත පාර්ලිමේන්තු මන්ත්‍රී**
1952.06.09 - 1956.02.18 දක්වා

**තුන්වැනි පාර්ලිමේන්තුව - බෙලිඅත්ත පාර්ලිමේන්තු මන්ත්‍රී**
1956.04.19 - 1959.12.05 දක්වා

**ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයාගේ පාර්ලිමේන්තු ලේකම්**
1956.04.21 - 1956.06.09 දක්වා

**කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයාගේ පාර්ලිමේන්තු ලේකම්**
1956.06.25 - 1959.09.17 දක්වා


**වැඩ බලන කෘෂිකර්ම ඉඩම් අමාත්‍යවරයා**
1957.09.17 දින සිට ස්ථිර අමාත්‍යවරයා වැඩ බාරගන්නා තෙක්

**කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයා**
1959.09.26 - 1959.10.10 දක්වා (ඉල්ලා අස්විය)

**පස්වැනි පාර්ලිමේන්තුවේ බෙලිඅත්ත පාර්ලිමේන්තු මන්ත්‍රී**
කාරක සභා නියෝජ්‍ය සභාපති
1960 -11.16 - 1964.02.11

**නියෝජ්‍ය කතානායක හා කාරක සභා සභාපති**
1964.02.11 - 1964.11.26 දක්වා

(ඩී. ඒ. රාජපක්ෂ 40 ගුණ සමරුව නිමිත්තෙන් වූ පුවත්පත් ලිපි එකතුව)



# ජනපති පිය සමර

# ඩී.ඒ. රාජපක්ෂ මැතිඳු

දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝනායක, මහොපාධ්‍යාය,
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති පල්ලත්තර
ශ්‍රී සුමනජෝති නාහිමි.

ශ්‍රී සුබද්‍රාරාම පුරාණ විහාරය, මාලිගස්පෙ, ගාල්ල.

ශ්‍රී ලංකාවේ දකුණු දෙස අතිශයින් ඓතිහාසික වැදගත්කමක් ඇති භූමිභාගය ගිරුවා ජනපදයයි. මෙය දොළොස් දහස් රට හා අටදහස් රට යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා පාලනය කළ බව හෙළි වේ. ප්‍රාග් ඓතිහාසික සමයේ සිට රුහුණේ අගනුවර වූයේ මාගම් පුරයයි. පසු කාලවල උඳුන්දොර ද එයට පසු කාලයෙහි මහානාගපුර ද ප්‍රධාන නගර වශයෙන් පැවති බව ඉතිහාසයෙන් හෙළි වේ. විජය දවස සිට රෝහණාය නමින් හැඳින්වුණු මෙම ජනපදය රුහුණ යනුවෙන් හෙළ බසින් ජනවහරෙහි දී ප්‍රචලිත විය. හෙළ දිවයිනේ මුල් අගනුවර අනුරාධපුරය වුවත් රුහුණ ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ජනාවාසව පැවති බව මහාවංශයෙන් හා සෙල්ලිපිවලින් හෙළි වේ. බෝවත්තෙගල සෙල් ලිපිවලට අනුව ද සැබෑ රජවරුන්ගේ රාජධානිය පිහිටා තිබුණේ තිස්ස, මාගම, කතරගම ආදී පෙදෙස් ආවරණය කරගෙන ය.

ඉතිහාසයෙහි පෙනෙන පරිදි පණ්ඩුකාභයට දුටුගැමුණුට, වලගම්බාට, මහවිජයබාට, මහපැරකුම්බාට, සුගලාට ආදී එදා මෙරට පාලනය කළ අතිශය සාර්ථක පාලකයන්ට සේනා සැපයුණේ රුහුණෙනි. විශේෂයෙන් ගිරුවායෙනි. දිවයිනේ වෙනත් කවර පළාතක වුවත් රාජවංශිකයන් හිඟ වුවත් රුහුණේ හැමදාම රාජවංශිකයෝ සිටියහ. වෙනත් ප්‍රදේශවලට අවශ්‍ය රාජ කුමාරවරුන් බොහෝවිට සැපයුණේ

රුහුණෙනි. රුහුණ හැමදාම ස්වයංපෝෂිත දේශයක් විය. සුවිශාල කෙත්වතුවලින් පිරී පවතින රුහුණ කුරහන්, තල, මෙනේරි, මුං, ඉරිඟු ආදී කටුසර බෝගවලින් හා විවිධ අල වර්ගවලින් ද නොයෙක් එළවළු වර්ගවලින් ද කොස්, දෙල්, අඹ, මුරුංගා හා විවිධ පලාවර්ගවලින් ද ගහන භූමිභාගයකි. එසේම මෙහි වැසියෝ පිත්තල, මැටි පහන් ආදී විවිධ ගෘහ කර්මාන්තවල යෙදෙමින් දහදිය මහන්සියෙන් උපයා සපයා ගන්නා දෙයින් අනුන්ට අතනොපා අභිමානවත්ව සිය ජීවිතය රැක ගත්හ.

මාවැලි, කිරිඳි, මැණික්, වලවේ ආදී ගංගාවලින් ලැබෙන දියවර මුහුදට ගලායන්නට නොදී වැව් අමුණු මඟින් එය රැකගෙන තුන්සිය හැටපස් දවසෙම වගාව තුළින් තම දිවි සරුකර ගනිමින් ස්වශක්තියෙන් අනුන්ට ගැති නොවී නිදහස් නිවහල් දිවියක් ගෙන ගිය රෝහණයන්ට පසුකලෙක විදේශීය සුදු ජාතිකයන්ගේ ආක්‍රමණ නිසා ඔවුන්ගේ ජීවනෝපාය තරමක් වෙනස් කරන්නට සිදු විය. පෘතුග්‍රීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යන ත්‍රිවිධ ජාතීහු පහතරට මුහුදු බඩ පෙදෙස් යටත් කරගෙන ස්වදේශිකයන් ඔවුන්ගේ සුවච, කීකරු සේවකයන් බවට පත්කර ගැනීම සඳහා ඔවුන්ගේ බස, ඔවුන්ගේ ඇඳුම් පැළඳුම්, ඔවුන්ගේ ආගම, ඔවුන්ගේ සිරිත් විරිත් ආදිය හා තාන්නමාන්න ද දීමෙන් ඔවුන් සෙසු දේශීය සංස්කෘතිය අගය කළ සිංහලයන්ගෙන් වෙන් කළහ. එහෙත් සාඩම්බරයෙන් කිව යුතු කරුණක් නම් රුහුණේ ගිරුවා දනව්වේ වැසියන්ගෙන් සියයට එක් අයෙක්වත් පරදේසක්කාරයන්ගේ ග්‍රහණයට හසු නොවී ය.

මා හිතන පරිදි ඉපැරණි දේශීය අනන්‍ය ලක්ෂණ ආගම, භාෂාව, සිරිත්විරිත්, ඇඳුම් පැළඳුම් ආදී හැම දෙයකින්ම කැපී පෙනෙන වෙනසකට පත් නොවූ එකම ජන කොට්ඨාශය ගිරුවා ජනපද වැසියෝ ය. ඔවුන් විදේශිකයන් යටතේ පාලනය වුවත් ඔවුන් තම පාලකයා

ලෙස පිළිගත්තේ කන්දඋඩරට සිංහල රජතුමා ය. එහෙයින් විදේශිකයන් යටතේ සිටි ස්වදේශීය ජාතිමාමක නිලධාරීන් හා මහා සංඝයා විදේශීය පාලන ප්‍රදේශවල ඔත්තු සොයා උඩරට රජතුමාට රහසින් දැන්වීම තමන්ගේ යුතුකමක් සේ සැලකූහ. මේ නිසා රුහුණේ වැසියන් කෙරෙහි විදේශිකයන් ක්‍රියා කළේ නිතරම සැකසංකාවෙනි.

අතීතයේ සිට ම සිය ප්‍රෞඪත්වය රැකගත් ගිරුවා ජනපද වාසීහු අදත් එම උරුමය රැකගෙන සිටින බව කියන්නේ සාඩම්බරයෙනි. ගිරුවා ජනපදිකයන්ගේ මේ අනන්‍යතාව රැකදීමට දිවි දෙවැනි කොට පෙරමුණ ගත්තෝ භික්ෂූන් වහන්සේ ය. උන්වහන්සේ අතර දකුණේ සංඝයාගෙන් කවරදාකවත් හිස් නොවූ ඓතිහාසික විහාරස්ථාන වන මූලගිරි මහා විහාරය, තිස්ස මහා විහාරය ආදී ස්ථාන මුල්තැනක් ගත් බව පෙනේ. එහෙත් 1815 න් පසු සමස්ත ලංකාව ම ඉංග්‍රීසීන්ට යටත් වීමෙන් පසු වසර සියගණනක් තිස්සේ ඔවුන් විසින් තැනූ ගතින් දේශීය වුවත් සිතින් විදේශීය වූ ඉංගිරිසිය කථාකරන කලිසම අඳින මුදලි මුහන්දිරම් පට්ටම් ලැබූ ස්වදේශිකයන් අතළොස්සකට තම ජාතියත්, තම ආගමත්, තම භාෂාවත්, තම සිරිත්විරිත් ආදී තවත් බොහෝ දේ අමතක විය. අනගාරික ධර්මපාල තුමා කීවාක් මෙන් කළු සුද්දන් බවට පත් වූ ඔවුහු පොදු මහජනයාගෙන් වෙන්ව "හාමුදුරුවො" යන විශේෂණයෙන් හැඳින්වූ විශේෂ කොටසක් බවට පත් වූහ. මොවුන්ගේ නිවෙස් "වලව්" නමින් හැඳින්විණි. දරුවෝ "හාමුලා" වූහ. බිරින්දෑ "ළමාතැනී" වූවාය. කුඩා ළමයි "බේබිලා" වූහ. පන්සලේ හාමුදුරුවන් පවා මොවුන් ළඟට ගියේ භයපක්ෂපාතීවයි. මෙම තත්ත්වයෙන් වැජඹීමට හැම සුදුසුකමක්ම තිබුණ වීරකැටියේ බුද්දියාගම රාජපක්ෂ පවුල මහනුවර සමයේ සිංහල රජුන් දවස සිටම පැහැදිලිවම වලව් පෙළැන්තියට අලුත් පවුලක් වුවත් ඔවුන් හැම විටම ක්‍රියා කළ බව පෙනෙන්නේ පොදු මහජනතාවගේ සුබසිද්ධිය සඳහා ය. මේ පරපුරේ නුදුරාතීතයෙහි විසූ රාජපක්ෂ ප්‍රභූවරු සුපිරි

පරගැති දාසයන් මෙන් සුද්දන්ට බැලමෙහෙවර කිරීමෙන් වැළකී මවුබසට ගරුකරමින්, දේශීය ඇඳුමට ගරු කරමින්, දේශීය ආහාරපාන අනුභව කරමින් ඉහත කී අතළොස්සක් කළු සුද්දන් මෙන් ආරූඪ කරගත් මහන්තත්ත්වයෙන් බැහැරව සුපුරුදු ගමරාළවරු (ගම්ප්‍රධානීන්) මෙන් ජනතාව අතර ම ජීවත් වූහ. ගොවිතැන, ගවපාලනය, වතුපිටි වගාව වැනි දේශීය ජීවන රටාව අගය කළ රාජපක්ෂවරු, මඩ සෝදාගත් ගොවියා රජකමට සුදුසුය යන රොබට් නොක්ස්ගේ ප්‍රකාශය සනාථ කරමින් ගැමි සුවඳ, මඩ සුවඳ තම කෘෂික ජීවන රටාවේ ප්‍රෞඪ ලක්ෂණ ලෙස සැලකූහ. පරගැති ප්‍රභූ පන්තියේ ඇත්තන් පොදු ජනයා දෙස බැලූයේ පර්වතයන් මත සිට පර්වතය පාමුල සිටින අසරණයන් දෙස බලන්නාක් මෙන් වුවත් රාජපක්ෂවරුන් පොදු ජනතාව දෙස බැලුවේ තම සොහොයුරු සොහොයුරියන් දෙස බලන්නාක් මෙනි.

සමානාත්මතාවාදී, දුක සැප හඳුනන, එය සමව බෙදාගන්නා, අසරණයාට පිහිට වන, අසරණ දුකින් ගොඩ ගැනීමට යත්න දරන රාජපක්ෂවරුන් රුහුණු වැසියන් සැලකුවේ තමන්ගේ ගැලවුම්කාරයන් ලෙස ය. ඇත්තෙන් ම එය එසේ විය.

බුද්දියාගම රාජපක්ෂ පරපුරේ නුදුරු අතීතයෙහි විසූ නායකයා වූයේ දොන් දාවිත් රාජපක්ෂ විදානආරච්චි රාළහාමි ය. ඔහු මේ වන විට ගමේ පමණක් නොව මුළු ගිරුවා පත්තුව ම දන්නා හඳුනන සම්භාව්‍ය ගම් වැසියෙකි. එම නිසා ඉංග්‍රීසීන්ට ඔවුන්ගේ ගැත්තන් සඳහා වෙන්කොට තිබුණ "විදානාරච්චි" නිලය අකමැත්තෙන් වුවත් මෙතුමාට දෙන්නට සිදු විය. මේ නිලය ගැනීම තමාට නුසුදුසු වුවත් ඒ මඟින් පොදු මහජනතාවට කිසියම් සේවයක් කළ හැකි බව සිතූ දොන් දාවිත් රාජපක්ෂ මහතා එම නිලය භාර ගත්තේ ය. රාජපක්ෂ විදානාරච්චි රාළහාමිගේ දයාබර පතිනිය වූයේ දෝන ගිමාරා වීරකෝන් රත්නායක මැතිනියයි. මේ දෙදෙනාට දාව පුතුන් තිදෙනෙකුත් එක්

දියණියකුත් ඉපිද සිටියහ. දෙටු පුතා ඩී.සී. රාජපක්ෂ නමින් ද දෙවන පුතා ඩී.ඇම්. රාජපක්ෂ නමින් ද තෙවන පුතා ඩී.ඒ. රාජපක්ෂ නමින් ද මා පියෝ නම් කළහ. මේ තිදෙනා ම ඉගෙනීම සඳහා යොමු කළේ ගාල්ලේ රිච්මන්ඩ් විද්‍යාලයටයි. පසුකල ඩී.ඇම්. රාජපක්ෂ මහතා "ගාල්ලෙ මහත්තයා" නමිනුත් ඩී.ඒ. රාජපක්ෂ මහතා පොඩිරාළහාමි (පසුව කෝර්නර් රාළහාමි) නමිනුත් ගැමියන් අතර ප්‍රචලිත වූහ.

රදළකම, තනතුරු හා ධන බලය ආදිය නිසා උදම් වූ පරගැති ප්‍රභූවරු සාමාන්‍ය ගැමියන් සැලකුවේ තම අතවැසියන් වශයෙන් නොහොත් ඔවුන්ගේ බැලමෙහෙවර කරන්නන් වශයෙනි. මෙම ධනපති උද්දච්ච රදළයන්ගේ බලය තුට්ටුවකටවත් ගණන් නොගත් රාජපක්ෂ පුතුන් තිදෙනාගෙන් මද්දුමයා හෙවත් ඩී.ඇම්. රාජපක්ෂ ගාල්ලෙ මහත්තයා දුක්විඳින පෑගුණ පොදු ජනතාවගේ පෙරමුණ ගෙන ඔවුන් ඉදිරියට මෙහෙයවමින් ඔවුනට ජවය, ශක්තිය ලබාදුන්නේ මුළු ගිරුවායම අවදිකරමිනි. "රුහුණේ සිංහයා" යන විරුදාවෙන් ගැමියන් හැඳින්වූ ගාල්ලෙ මහතාගේ ඉදිරි ගමන වළකන්නට රුහුණේ රදළයන් නොකළ විරුද්ධ කමක් නොවීය.

ඒ එදිරිවාදිකම් කිරීම් ඔහුගේ ඉදිරි ගමනේ ජව වේගය වඩ වඩාත් තියුණු කිරීමට හේතු වූවා මිස අල්පමාත්‍රවූ ද පසු බැසීමකට හේතු නොවී ය. මෙහි අවසන් ප්‍රතිඵලය වූයේ හම්බන්තොට පමණක් නොව මුළු ගිරුවාපත්තුවේ ම පැවැති රදළ බලය සුණු විසුණු කොට 1936 දෙවන ඩොනමෝර් ආණ්ඩුවේ හම්බන්තොට රාජ්‍ය මන්ත්‍රීවරයා වශයෙන් මහජනතාව විසින් තෝරා පත්කර ගැනීමයි. ගිරුවා පත්තුවේ පොදු ජනතාව රදළ ග්‍රහණයෙන් මුදාගත් ඩී.ඇම්. රාජපක්ෂ වීරයාගේ ඊළඟ කාර්යය වූයේ ඔවුනට දෙපයින් නැගී සිටීමට ධෛර්යය දීමයි. විශේෂයෙන් ගිරුවායට ආවේණික වූ කෘෂිකර්මාන්තය නගාලීමටත් වෙනත් කර්මාන්ත ආරම්භ කිරීමටත් කටයුතු කළ මේ පොදුජන

හිතෛෂියා කිසිවෙක් නොසිතූ අවස්ථාවක රාජ්‍ය මන්ත්‍රණ සභාවේ දීම රෝගීව අභාවයට පත් විය. මේ වනවිට කිංචිගුණේ මැදමුලනේ රාජපක්ෂවරුන්ගේ මහගෙදර සිටියේ බාල මළණුවන් වූ පොඩි රාළහාමි හෙවත් ඩී.ඒ. රාජපක්ෂ මහතායි.

ඩී.ඇම්. රාජපක්ෂ මන්ත්‍රීවරයාගේ වාසස්ථානය වූයේ වීරකැටියේ කොන්දගල කන්ද පාමුල පිහිටි නිවස ය. ගැමියන් එය හැඳින්වූයේ කොන්දගල බංගලාව යනුවෙනි.

ඩී.ඒ. රාජපක්ෂ පොඩිරාළහාමි සිය පාරම්පරික නිවසෙහි පදිංචිව සිටිමින් ඉඩකඩම් සොයා බලාගෙන එමෙන්ම තමන් සතු මී ගව සම්පත ද රැකගෙන අසල්වැසි ගැමි ජනතාව සමඟ අතිශය සුහදත්වයෙන් නිහඬ දිවියක් ගත කළ ප්‍රභූවරයෙකි. කාර්යබහුල දිවියක් ගත කළ සොහොයුරු මන්ත්‍රීතුමාට ද අවශ්‍ය අවස්ථාවල සහාය වෙමින් ක්‍රියාකළත් කිසිවිටෙක දේශපාලනයට සම්බන්ධ වූයේ නොවේ. එහෙත් ඩී.ඇම්. රාජපක්ෂ මැතිතුමාගේ හදිසි අභාවය නිසා ඔහුට මෙතෙක් ගත කළ නිහඬ නිදහස් ජීවිත ගමන ඒ අයුරින් ම යාමට ඩී.ඇම්. රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ ළාබාල දරුවන් හා පොදු මහජනතාවත් මහා සංඝයා වහන්සේත් ඉඩ නොදුන්හ. මන්ත්‍රීතුමාගේ දරුවන් ළාබාල වයසේ පසු වූ බැවින් ඔවුනට මන්ත්‍රී ධුරය සඳහා ඉදිරිපත් වීමට නොහැකිවීම මෙයට ප්‍රධාන හේතුවයි. පවුලේ අයත් පොදු මහජනතාවත් මහා සංඝයා වහන්සේත් අතුරු මැතිවරණයට ඉදිරිපත් වන්නටයැයි නිරන්තරයෙන් කළ ඇවටිල්ල පොඩිරාළහාමිට මහත් ඉවසුම් නොදෙන්නක් විය. ඩී.ඇම්. රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ ආදාහනයට මුලගිරි විහාරයෙන් රැගෙන ගොස් තිබුණ භාණ්ඩ වගයක් නැවත පන්සලේ නායක හාමුදුරුවන්ට ගෙනත් දීමට විශ්‍රාමලත් විදුහල්පති බෙලිගල්ලේ අමරසේන මහතාත් ඩී.ඒ. රාජපක්ෂ කෝර්නල් රාළහාමිත් මුල්කිරිගලට පැමිණ එම භාණ්ඩ භාරදුන් අවස්ථාවේ මමත් ඒ අසළ

සිටියෙමි. ඔවුන් හා සතුටුසාමීචියෙහි යෙදුණ එවකට මූලගිරි විහාරාධිපති අතිගරු මොදරවානේ සෝමානන්ද නා හිමියෝ ස්කෝලේ මහත්තයෝ, කවුද මීළඟට මන්ත්‍රීකමට ඉදිරිපත් කරන්නෙ? කියා ඇසූහ.

එයට උත්තර දුන් ස්කෝලෙ මහතා "නායක හාමුදුරුවනේ" වෙන කවුද? අපි දැන් තීරණය කරල තියෙන්නේ කෝර්නල් රාළහාමි ඉදිරිපත් කරන්න යි" එවිට නායක හාමුදුරුවො රාළහාමිගෙ මූණ දෙස බැලූහ. කිසිවක් කථානොකළ පොඩි රාළහාමි මඳ සිනහවක් පෑවේ ය. නායක හාමුදුරුවෝ බොහොම හොඳයි, බොහොම හොඳයි යනුවෙන් එය අනුමත කළහ.

කෙසේ වුවත් අතුරු මැතිවරණයට ඉදිරිපත් නොවී ඉන්න ජනතාව මෙතුමාට ඉඩ නොදුන්නේ එවිට ඒ සඳහා සිටි එකම සුදුස්සා එතුමා බව නිගමනය කොට තිබුණු හෙයිනි. ඒ අනුව නාම යෝජනා භාරදුන් අවස්ථාවේ අන්කිසිවෙකු තවත් ඉදිරිපත් නොවූයෙන් 1954 සිට ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා හම්බන්තොට මන්ත්‍රීවරයා වශයෙන් නිතරගයෙන් පත් විය.

නගරයෙන් ඈත පිහිටි මැදමුලන වැනි සුන්දර ගමක ඉපිද ගැමි පරිසරයෙහි හැදුන වැඩුන පොඩි රාළහාමි කිසිවිටෙක නාගරික පරිසරය ප්‍රියකරන්නෙක් නොවී ය. මා කුඩාකල නොයෙක් අවස්ථාවල එතුමා දැක ඇතත් කවරදාකවත් කලිසමක් ඇඳ සිටිනු දැක නැත. දෙටු සොහොයුරාගේ ප්‍රතිපත්ති අනුගමනය කළ හේ සුදු රෙද්ද හා අත්දිගට මැසූ බැණියම ඇඳ ගිරුවාය සංකේතවත් කළ කුරහන් ධාන්‍ය වර්ගයේ පාට පිළිඹිබු කරන දුඹුරුවර්ණ සාටකය අයියා මෙන් මෙතුමා ද දැරීය.

එම පිළිවෙත එතුමාගේ පුත්‍ර ශ්‍රී ලංකාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මෙන්ම ගරු චමල් රාජපක්ෂ ඇමතිතුමා හා බැසිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ද අනුගමනය කරයි. මෙය අපි කුරහන් තලප බුදින ජවසම්පන්න ගිරුවා වීර පුත්‍රයෝ ය යන්න අන්වර්ථ කරන්නකි.

ඩී.ඒ. රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ දේශපාලන ගමන් මඟ සරසා දුන්නේ එතුමා ම වැනි ගැමිකතක් වූ "පාලටුවේ දෝන දන්දිනා සමරසිංහ දිසානායක" මැතිණියයි. චාම් පැවතුම්වලින් තම දිවිය සරසාගත් මෙතුමිය පරිසමාප්ත්‍යයෙන්ම අහිංසක නිහතමානී ගැමි කතකි. තම දරුවන් නව දෙනාට පමණක් නොව අසල්වැසි සියලු දෙනාට ම ඇය මවක් වූවා ය. සිය සැමියාට මාතෘ භාර්යාවක් මෙන් උපස්ථාන කළ මෙතුමිය සිය සැමියා දේශපාලනයෙහි නිරත වුවත් රාජපක්ෂවරුන් සතු පාරම්පරික ඇවැතුම් පැවැතුම් මෙන්ම සිරිත් විරිත් හා ආගමික හැදියාව ද තම දරුවන්ට මැනවින් පුගුණ කළා ය. බොහෝ ප්‍රභූයැයි හඳුන්වා ගන්නා පවුල්වල රාජපක්ෂ පවුලේ දරුවන් වැනි උගත් බුද්ධිමත් ජාති මාමක, ආගම් මාමක, සියරට දේ ගරු කරන, දේශීය සංස්කෘතිය අගයන, ලොව ඉපැරණි ශ්‍රේෂ්ඨ බසක් වන අපේ සිංහල බස දොඩන, එය අන් කවර බසකටත් වඩා උතුම් කොට සලකන, ප්‍රභූ පන්තියේ පුද්ගලයින් දකින්නටත් නොමැති අද වැනි දවසක රාජපක්ෂවරුන්ගේ ජාතිමාමකත්වය අති ශ්‍රේෂ්ඨ ය. එය අපට මැනවින් ප්‍රත්‍යක්ෂ කර වූ අසහාය පුද්ගලයා වත්මන් ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ ගිරුවා පුත්‍රයා ය. මෙරට සිටින තානාපතිවරුන් ගෙන්වා සිදුකළ පළමු කථාවේ දී ම එතුමා ඔවුනට මෙසේ කී බව පුවත්පත්වල පළ විය. "මහත්වරුනි, අද මා ඔබ සමඟ ඉංගිරිසියෙන් කථා කළාට මින් මත්තට මා කථාකරන්නේ මගේ මවුබස වන සිංහලෙනුයි" තානාපතිවරුන්ට එසේ කී ජනාධිපතිතුමා එක්සත් ජාතීන්ගේ මහා

සභා රැස්වීමට සහභාගී වෙමින් සිංහල භාෂාවෙන් එම උත්තරීතර සභාව ඇමතීම සිංහලය දෙවනුවත් සිහසුන් ගතකිරීමක්. යයි මට සිතේ. ගිරුවායේ මහින්ද රාජපක්ෂ රජනොවන්න ඉකුත් පාලකයන් දවස මෙන්ම ඉදිරියටත් සිංහල බස එක්සත් ජාතීන්ගේ උත්තරීතර මණ්ඩලය වෙත ගෙන යාම මේ රටේ අන්කිසිවෙකුගෙන් සිද්ධ නොවන්නකි. තොප්පිගල කැලෑවක් අල්ලා ගැනීම මොන මෝඩ ක්‍රියාවක් දැයි කී අය මේක ඊටත් වඩා නිරර්ථක නන්දෙඩීමක් යයි නොකියන්නේ නම් පුදුමයකි.

ඩී.ඇම්. රාජපක්ෂ සොහොයුරාගෙන් පුරප්පාඩු වූ හම්බන්තොට අසුනට නිතරඟයෙන් 1945 පත් වූ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා එතැන් සිට පාර්ලිමේන්තුවේ බෙලිඅත්ත ආසනය නියෝජනය කරමින් 1964 වන තෙක් විවිධ තනතුරු දරමින් විශේෂයෙන් ගිරුවායටත් පොදුවේ මුළු රටටත් සේවය කළේ නිශ්ශරණාධ්‍යාසයෙනි. ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයාගේ පාර්ලිමේන්තු ලේකම් වශයෙනුත් අනතුරුව ඉඩම් හා කෘෂිකර්ම ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් වශයෙනුත් පසුව වැඩබලන හා ස්ථිර ඉඩම් අමාත්‍යවරයා වශයෙනුත් සේවය කොට 1960 සිට 1964 තෙක් පාර්ලිමේන්තු කාරක සභාවේ නියෝජ්‍ය සභාපති 1964 නියෝජ්‍ය කථානායක හා කාරක සභාවේ සභාපති වශයෙනුත් සේවය කළේ ය.

මෙසේ ව්‍යවස්ථාදායකයේ හා විධායකයේ විවිධ තනතුරු දැරූ ඩී. ඒ. රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ එකම අපේක්ෂාව වූයේ වර්තමාන දේශපාලකයෙක් මෙන් යමක්කමක් පරම්පරා ගණනකට හරි හම්බකර ගැනීම නොව තමා සතු ඉඩකඩම් පවා උකස් කොට මහජනතාවට කිසියම් සේවාවක් කිරීමයි.

විශේෂයෙන් එතුමා නියෝජනය කළ හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් ගිරුවාපත්තුව ඉතිහාසයේ ආරම්භක අවදියේ සිට ම කෘෂිකාර්මික ප්‍රදේශයකි. එහි වැසියන්ගෙන් සියයට අනූපහක් පමණ දක්ෂ ගොවියෝ ය. පොළොවෙන් තුනෙන් දෙකක් පමණ තිබුණේ කුඹුරු හා හේන් සඳහා ය. මේ පාරම්පරික ගොවි ජනතාව නගා සිටුවීම සඳහා කිරම ඔය ව්‍යාපාරය, උඩුකිරිවිල ව්‍යාපාරය, චන්ද්‍රිකා වැව ව්‍යාපාරය ආදිය ආරම්භ කළ මෙතුමා කපුවගාව, කඩදාසි කම්මල, තේක්ක වගාව ආදිය ඇරඹී ය. ගම්මිරිස් වගාව, එලවළු වගාව ආදිය දියුණුකොට ගොවි ජනතාවගේ අතමිට සරුකරලීමට පියවර ගත්තේ ය. සමස්ත රටවැසියන්ගේ ම සුබසිද්ධිය සලකා සමූපකාරය, දේශීය වෛද්‍ය ක්‍රමය නගාසිටුවීම, අධ්‍යාපන පහසුකම් සැලසීම ආදී අතිශය ඵලදායී සුබසාධන ක්‍රියා රාශියක් සිදු කළේ ය. මහත්මා දේශපාලනයෙහි ඉහළ ම තලයේ සිටි මෙතුමා මෙන් ම දෙටු සොහොයුරා ඩී.ඇම්. ඇතුළු තත්කාලීන දේශපාලකයෝත් ඔවුන් දෙදෙනාගෙන් පැවත එන රාජපක්ෂ පරපුරේ කිසිවකුත් තනතුරෙන් වැජඹෙන්නට හෝ තනතුරෙන් ධනවත් වන්නට හෝ හොර මැරකම් කරන්නට හෝ අදත් එදත් නොපෙළඹුනහ. තමන්ගේ මුතුන්මිත්තන් හම්බකර තැබූ වස්තුව, ඉඩකඩම්, අන්සතු වෙද්දී රටට සේවය කළේ අනුන්ගේ දුක දන්නන් වශයෙනි. වර්තමානයේ දේශපාලන ක්ෂේත්‍රයෙහි සිටින ගිරුවායේ රාජපක්ෂවරුන් හා හිටපු රාජපක්ෂවරුන් යන අටදෙනා ම මන්ත්‍රීවරුන් වූයේ මහජනයාගේ උවමනාවට මිස ඔවුහු කිසිවෙක් බලයෙන් චණ්ඩිකමින් ධන ලෝභයෙන් හා තනතුරු ලෝභයෙන් එතැනට ගියෝ නොවෙති. ඔවුන් හම්බ කළේ මහජන කැමැත්ත ය. මහජනයාගේ හොඳ හිත ය.

පෙරදිග මුතුඇටය යන විරුදාවලියෙන් ලොව ගෞරවයට පාත්‍ර වූ මේ හෙළ බිමේ දකුණු කෙළවර ඓතිහාසික ගිරුවා ජනපදය නිජබිම

කරගෙන මැදමුලන වැනි පිටිසර ගම්මානයක පහළ වූ රාජපක්ෂවරු දුටුගැමුණු, සද්ධාතිස්ස, මහවිජයබා, මහපැරකුම්බා, වලගම්බා ආදී අතීත රෝහණ වීරයන් ගිය ස්වර්ණමය මාර්ගය වසර ගණනකට පසු යළිත් කලහෙළි කළෝ වීරකැටියේ බුද්ධියාගම රාජපක්ෂවරු ය. ඔවුන්ගේ ආදී පුරුෂයන් මෙන් ම ශ්‍රී ලංකා ජනාධිපතිවරයා ඇතුළු වර්තමාන අනුප්‍රාප්තිකයන් ද ඒ මඟ ම අදත් යන බව මෙරට පොදු ජනතාව වටහා ගෙන මිසදිටුවන්ගෙන් සිංහල බෞද්ධයන්ට වන ගැහැටත් ඔවුන් මුදාගන්න අපේ සංඝයා වහන්සේලා එදා සිටි නායකයා හමුවී තම දුක්ගැනවිල්ල කී විට ඔහු කීවේ "හාමුදුරුවරු ආවේ ආණ්ඩුවට බුද්ධං සරණං ගච්ඡාමි කියන්න කියා මට කියන්නද"? කියා ය. ලෝකයේ යටත්විජිත වශයෙන් පැවති ඉන්දියාව, පකිස්ථානය ආදී හැම රටක් ම නිදහස ගත්ත අවස්ථාවේ ම සිය රටේ ප්‍රධාන භාෂාව රාජ්‍ය භාෂාව වශයෙන් සම්මත කළත් අපේ මිනිසුන්ට ඉංගිරිසිය අත්හරින්නට නොහැකි වූයේ රට ගැන, ආගම ගැන, සංස්කෘතිය ගැන අල්ප මාත්‍රවත් දැනීමක් තබා තැකීමක් වත් නොවූ නිසා ය. ඔවුන් සිතුවේ පැතුවේ වැඩ කළේ පරගැත්තන් වශයෙනි. ඔවුන්ට තිබුණේ දීන මානසිකත්වයකි. ඒ පරපුරේ අදත් අපේ කරපිටින් පාර්ලිමේන්තුවට ගොස් සුරසැප විඳින තුප්පහි සංස්කෘතියට වැඳුම්පිදුම් කරන නාගරික ප්‍රභූවරුන් වශයෙන් පෙනී සිටින්නන් හා ඔවුන්ගේ ඉඳුල් කකා පස්සෙන් යන ගම්බද අතලොස්සක් ක්‍රියාකරන්නේ ඔවුන් ගයන බෙරපදයට අනුව ය. මෙබඳු සංකර වූ බලයෙන් මුසපත් වූ රට, ජාතිය, ආගම තණපතක් සේ නොසළකන මොවුන්ට රාජපක්ෂවරුන් සුව නොවන හිසරදයකි. එහෙත් පොදු ජනතාවට ඔවුන්ගේ සේවය අමාවකි.

ගැමියකු වශයෙන් මොලොව ඉපිද, ගැමියන් අතර හැදුන, වැඩුන, මවුබස දෙඩුව, කොස්, දෙල්, කුරහන්,අල, බතල ආහාරයට ගත්ත ජාතික සංස්කෘතිය මෙන්ම ජාතික සිරිත් විරිත් අනුගමනය කළ සැදැහැවත් බෞද්ධ පරාර්ථකාමී ඩී.ඒ. රාජපක්ෂ මන්ත්‍රීතුමා තම

දෙටු සොහොයුරා ගිය මඟ යමින් ඔහුට කරන්නට නොහැකි වූ මහජන සේවා වඩාත් පෘථුල ලෙස කරගෙන ගිය අතර ඉතිරි සේවා තමාගේ හා තම සොහොයුරාගේ දරුවන්ට භාර කොට 1967 නොවැම්බර් මස මෙයට වසර 40 කට පෙර මුළු ගිරුවා ජනතාව ම සෝසයුරේ ගිල්වමින් සදහටම ඔවුන් හැර ගියේ ය. මෙරට සමහර දේශපාලකයන් මිය යන විට එම අඩුව පුරවන්නට ඔවුන්ගෙන් පැවැත එන්නෙකු නැත. සමහරුන් හිටියත් බොහෝවිට ඒ එක් අයෙකු පමණක් විය හැකි ය. සමහරවිට ඔවුන්ගෙන් පැවැතෙන්නෝ තමනුත් රටත් වනසන්නෝ ය. ඔවුන් පිළිබඳ අත්දැකීම් අපට අපමණ තිබේ. ඔවුන්ගේ දේශපාලන උරුමය එක්කෙනාගෙන් දෙන්නගෙන් අවසන් වේ. එහෙත් ගිරුවායේ රාජපක්ෂ පවුලේ තත්ත්වය එයට වඩා හාත්පසින් ම වෙනස් වූවකි. ඩී.ඇම්. රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ දරුවන් වූ ලක්ෂ්මන් රාජපක්ෂ හා ජෝර්ජ් රාජපක්ෂ යන පුතුන් දෙදෙනා මෙන්ම ජෝර්ජ් රාජපක්ෂ ඇමතිවරයාගේ දියණිය වන නිරූපමා රාජපක්ෂ ද අනුප්‍රාප්තිකයන් වශයෙන් දේශපාලනයට සම්බන්ධ වූයේ පියාගේ අඩිපාරේ ගිය නිසයි. අද අපේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා හා චමල් රාජපක්ෂ ඇමතිතුමාත් බැසිල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත් යන තිදෙනාම ඩී. ඒ. රාජපක්ෂ මැතිඳුගේ අතිජාත පුත්‍රයෝ ය.

අට දෙනෙකු ම අඛණ්ඩ ව ගිරුවාය කේන්ද්‍ර ගෙන දේශපාලනයෙහි නිරත වූ රාජපක්ෂ පවුල විසින් තබන ලද ඉතිහාසය මේ රටේ වෙනත් කිසිම දේශපාලන පවුලකට අත්කර ගන්නට නොහැකි වීම ද විශේෂයකි. අනික ඔවුන් හැම දෙනාම තනතුරු ලෝභීහු නොවෙති. ඔවුහු ජාති හිතෛෂී හු ය. දේශ හිතෛෂීහු ය. වාම් පැවතුම් ඇති අව්‍යාජ පුද්ගලයෝ ය. තුප්පහි කළු සුද්දෝ නොවෙති. සැබෑ සිංහල බෞද්ධයෝ ය. මහා ධනවත්තු නොවූහ. ධන කාමයෙන් බලකාමයෙන් දේශපාලනයට බටුවෝ නොවෙති. ඔවුන් දේශපාලනය කළේ මහජනතාවගෙන් යමක් සූරාගෙන එකතු කරගන්න නොවේ. පරපුරෙන්

හිමිව තිබුණ ඉඩකඩම් ටිකත් විකුණා දමමිනි. මේ නිසා මහත්මා දේශපාලනයෙහි නියුක්ත රාජපක්ෂවරු එදත්, අදත්, කවදත් ජනාදරයට පත් වූවෝ වෙති. කෘතහස්ත ශ්‍රේෂ්ඨ දේශපාලනඥයකු වූ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමාගේ ගුණ 40 වන වසරටත් මෙසේ සැමරීම කෘතවේදී සත්පුරුෂයන්ගේ උතුම් ගුණයක් වන අතර, එතුමාට නිවන් සුව අත් වේවා යි පතමි.

***දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝ නායක, මහෝපාධ්‍යාය, රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, පල්ලත්තර ශ්‍රී සුමනජෝති නා හිමි***
ශ්‍රී සුභද්‍රාරාම පුරාණ විහාරය
මලිගස්පෙ, ගාල්ල.

5.9/3479

## වසර 40 කින් සැබෑ වූ සිහිනයක්.

**කතරගම කිරිවෙහෙර රජමහා විහාරාධිපති, රුහුණු මාගම් පත්තුවේ ප්‍රධාන සංඝනායක,ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කුලපති,මහෝපාධ්‍යාය ආචාර්ය අලුත්වැව සෝරත නාහිමියෝ.**

අනගාරික ධර්මපාලතුමාගේ අප්‍රකට අත් ලිපි මැයින් වූ අගනා කෘතියක් කියැවීමට අවස්ථාවක් මෑතක දී මට ලැබුණි. ධර්මපාලතුමා සිය අතවැසි දේවප්‍රිය වලිසිංහයන්ට වරින් වර ලියා තිබූ ලිපි එකතුවක් ලෙස එළි දක්වා තිබුණු එම කෘතිය, ධර්මපාලතුමාගේ පෞද්ගලික ජීවිතය හා පොදු අරමුණු හඳුනාගන්නට වටිනා අත්වැලකි.

රට,ජාතිය,ආගම වෙනුවෙන් ස්වකීය ධනය, කාලය හා ශ්‍රමය පමණක් නොව මුළු ජීවිතය ම කැප කළ මේ ශ්‍රේෂ්ඨ යුග පුරුෂයාට සමාජයෙන් වැඩියෙන් ලැබී තිබුණේ කිත් පැසසුම්වලට වඩා, අභූත චෝදනා, දෝෂාරෝපන, අවමන් සහ ගැරහුම් බව එතුමාගේ ලියුම් කියුම්වලින් මොනවට හෙළිදරව් වෙයි. ස්වකීය පරමෝත්කෘෂ්ට අපේක්ෂාවන් හඳුනා ගැනීමට අපොහොසත් වූ හෝ හඳුනාගන්නට වෑයම් නොකළ ලාංකිකයා පිළිබඳව එතුමා කෙතරම් කම්පාවටත්, කළකිරීමටත් පත්වී ද යත් අන්තිමේ දී ලංකාව අත්හැර ගොස් ජීවිතාන්තය දක්වා භාරතයේ

වාසය කළා පමණක් නොව යළි ඉපදීමට ප්‍රාර්ථනා කළේ ද භාරතයේ ය. එහෙත් එතුමාගේ අභාවයෙන් පසු අපි එතුමා සමරමින් උත්සව පවත්වමු. ගුණ ගයමින් සේවය අගයමු. දකුණේ ශ්‍රේෂ්ඨ යුග පුරුෂයකු' ලෙස අවිවාදයෙන් පිළිගන්නා ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන්ගේ හතළිස් වන ගුණ සමරුවේ දී එතුමා ගැන කථා කිරීම තිබිය දී අනගාරික ධර්මපාලතුමා ගැන කථා කිරීම කෙනෙකුගේ විමතියට හේතුවිය හැකි ය. එහෙත් මා එතැනින් පටන් ගත්තේ සහේතුකව ය.

කෙනෙකුගේ අගය දැනෙන්නට පටන්ගන්නේ ඒ තැනැත්තා මිය ඇදුනාට පසුව යැයි කියමනක් අපේ ජන වහරේ පවතී. සැබවින් ම එය යථාර්තවාදී කියමනකි. ලෝකයේ වෙනත් රටවල කෙසේ වෙතත්, මොන අවාසනාවකට හෝ අපේ රටේ නම් සැබෑ තත්ත්වය එයයි.

ධර්මපාලතුමාගේ වටිනාකම අපේ ඇත්තන්ට තේරෙන්නට පටන් ගත්තේ එතුමාගේ අභාවයෙන් පසුව ය. රුහුණේ උත්කෘෂ්ට සමාජ සේවකයකු මෙන් ම සදාදරණීය ජනතා නායකයකු වූ ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන්ගේ වටිනාකම අපේ ඇත්තන්ට තේරෙන්නට පටන්ගෙන ඇත්තේ දැන් ය. ඩී.ඒ. රාජපක්ෂයන්ගේ ගුණ ගයන්නට අද ඕනෑතරම් පිරිස් සිටිති. ඒ වෙනුවෙන් උත්සව සංවිධානය කරන්නට එකිනෙකා පරයමින් පෙරමුණ ගන්නට වෑයම් කරන්නෝ ද වෙති. මේ අපූරු උනන්දුව, ඇත්තනේ ම රාජපක්ෂ චින්තනය දැන හඳුනා ගැනීම නිසාම හද පත්ලෙන් පැන නඟින කෘතවේදීභාවයෙන් ඇතිවූවක් ද එසේ නැතහොත් රාජපක්ෂ චින්තනය ඔටුණු පැළඳීම නිසා පැන නැගුණු ආත්මාර්ථකාමී රංගනයක් දැයි තෝරා බේරා ගැනීම පවා අසීරු ය. එතුමාගේ සටන් මගට අකුල් හෙලූ පැලැන්තිය පවා අද රාපක්ෂ චින්තනයේ වටිනාකම පිළිබඳ ගුණ ගයති.

ඓතිහාසික අතින් ප්‍රෞඩ අතීතයකට උරුමකම් කියන රුහුණ, දේශගුණික අතින් ඉතාම කටුක පරිසරයක් උරුම කරගත් දුෂ්කර ප්‍රදේශයකි. අවුරුද්දේ මාස දෙක තුනක් පමණක් ලැබෙන වර්ෂාව හැරුණු විට ඉතිරි මුලු කාලයම දැඩි වියළි ස්වභාවයක් උසුලයි. මේ කර්කශ ස්වභාවය නිසා ම සතා සීපාවා පමණක් නොව රුහුණු වැසියා ද නිරතුරුව ම ජීවත් වන්නේ අනේක විධ දුක්ඛදෝමනස්සයන් කර පින්නාගෙනය.

සෞභාග්‍යමත් අතීතියේ පැවති වාරිමාර්ග ව්‍යුහය නටබුන් වී යාම නිසා උපතින් ම ගොවියන් වූ රුහුණේ ජනතාවට සිය ජීවනෝපාය කරගෙන යාම සඳහා අවශ්‍ය ජලය සපයා ගැනීම බරපතල ගැටළුවක් බවට පත්ව තිබිණි. මඩ ගොවිතැනට එල්ල වූ ඒ බාධකය ජය ගන්නට රුහුණු වැසියන් උත්සාහ කළේ ගොඩ ගොවිතැනට නැඹුරුවීමට ය. එහෙත් ඉංග්‍රීසින් විසින් කොල්ලකාගන්නා ලදුව ආණ්ඩුවේ ඉඩම් හැටියට රුහුණු ජනතාව සන්තක ඉඩම් රජය විසින් අයත් කරගෙන තිබීම නිසා ගොඩ ගොවිතැන් කිරීමට බිමක් ද තිබුණේ නැත. මේ වාතාවරණය යටතේ අන්ත අසරණ තත්ත්වයට පත්ව සිටි රුහුණු වැසියා වෙනුවෙන් හඬක් නගන්නට ඉදිරිපත් වූයේ රාජපක්ෂවරුන් පමණි. බලය ඇතත් නැතත්, දුක් විඳින ජනතාවගේ හදගැස්ම හඳුනාගත් රාජපක්ෂවරු අඩ සියවසකට අධික කාලයක් තිස්සේ සිය යුතුකම ඉටුකරලීමේ අඛණ්ඩ අරගලයේ දී අධිරාජ්‍යවාදී ඉංග්‍රීසින්ගෙන් පමණක් නොව ඉංග්‍රීසින්ට බැලමෙහෙවර කරමින් තම මඩි තරකර ගැනීමේ නියැලී සිටි අනුකාරක නායකයන්ගෙන් හා අනුකාරක නිලධාරි පැලැන්තියෙන් රාජපක්ෂවරුන්ට සිදු වූ මඳි පුංචිකම්, කෙණෙහිලිකම්, නොපහත්කම් අනන්ත ය. අප්‍රමාණ ය.

එක්තරා දුගී දැරියක අත තිබුණු නොවටිනා මල් මාලයක් මහා තෙරුන්වහන්සේගේ කුශලතාවයෙන් මහාර්ඝ රන් මාලාවක් වූ බව සඳහන් වන කථා පුවතක් බෞද්ධ සාහිත්‍යයේ එයි. අධිරාජ්‍යවාදීන් හා ඔවුන්ගේ ඇම්බැට්ටයන්ගෙන් රාජපක්ෂවරුන්ට එල්ල වූ අප්‍රමාණ බාධකයක් ජයග්‍රහණයේ මං සළකුණු බවට පත්වූයේ ද ඒ අන්දමට ය.

අධිරාජ්‍යවාදයේ බලපෑම්වලින් පීඩාවට පත්ව සිටි රුහුණේ ජනතාව වෙනුවෙන් යුක්තිය, සාධාරණත්වය, මානව හක්තිය වෙනුවෙන් හඬ නැඟූ රාජපක්ෂවරුන් ට අර විදියේ බාධක වැඩි වැඩියෙන් එල්ලවෙද් දී ඊට වඩා වැඩියෙන් ජනතාවගේ ආශිර්වාදය ලැබෙන්නට වීමේ ප්‍රතිඵලය වුයේ අධිරාජ්‍යවාදීන්ට එරෙහිව, දුක්විඳින ජනතාව වෙනුවෙන් අභීතව හඬ නඟන්නට අධිරාජ්‍යවාදීන්ගේ ම බලකොටුව වූ පාර්ලිමේන්තුව ට පිවිසීමේ වරය රාජපක්ෂවරුන් ට හිමිවීම යි. ගිරුවාපත්තුවේ කෘතවේදී ජනතාවගේ ඡන්දයෙන් 1936 දී පැවති දෙවන තෝරා ගැනීමේ මැතිවරණයෙන් ඩී.ඇම්. රාජපක්ෂ මැතිතුමා මැති සබයට පිවිසෙන්නේ මේ පසුබිම යටතේ ය.

රුහුණු වැසියාගේ ජීවන තත්ත්වය නංවාලීමේ එකම අරමුණ පෙරදැරි කර ගනිමින් අඛණ්ඩ අරගලයක යෙදුණු ඩී.එම් ඒ තත්ත්වයට හේතු වූ කච්චේරි ක්‍රමයට හා මුදලිවරුන් ට එරෙහි ව මැති සබය තුළත්, ඉන් පිටතත් ගෙන ගිය මහා අරගලය කෙබඳු තත්ත්වයක් යටතේ හෝ අත්හැරියේ නැත.

බාධක වැඩිවන තරමට ම එතුමා ලත් පන්නරය ද වඩාත් ප්‍රබල විය. තම ජීවිත කාලය තුළ දී එහි මල්පල හටගනු දකින්නට එතුමාට

නොහැකි වුවත්, ඒ සඳහා අවශ්‍ය අනභිභවනීය ශක්තිමත් පරිසරයක් නිර්මාණය කිරීම ට එතුමා ට හැකියාව ලැබිණි.

අපගේ කථා නායකයා වන ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා දේශපාලනයට පිවිසෙන්නේ මේ අතරතුර ය. සහජයෙන් ම නිහඬ දිවියකට ප්‍රිය කළ ඩී.ඒ. රාජපක්ෂයන් උන්නදු වූයේ ගොවිතැන් සරු කර ගනිමින් සහෘද ගැමියාගේ ඕනෑ එපාකම් පිරිමසා ලමින් ජනතා හිතවාදියකු ලෙස ජීවත්වීමට මිස පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස වැජඹෙන්නට නොවේ. සිය සොහොයුරු ඩී.එම්. දේශපාලන කරළියේ පෙරැළි කරන විට පවා ඩී.ඒ. කළේ කුඹුරු සරු කිරීමයි. දුටුගැමුණුගේ සටන් ව්‍යාපාර සාර්ථක කර ගන්නට අවශ්‍ය ආහාර සම්පාදනය කර දීමෙන් සද්ධාතිස්ස කුමරුන් සහයෝගය දුන්නා සේම, ඩී.එම් ගේ දේශපාලන ව්‍යාපාර සඳහා අවශ්‍ය ආර්ථික ශක්තිය ලබා දුන්නේ ඩී.ඒ ය.

ඩී.එම්. ගේ අනපේක්ෂිත අභාවයෙන් වඩාත් කම්පාවට පත් වූයේ රාජපක්ෂවරුන් නොව අසරණ රුහුණු ජනතාවයි. තමන්ට අහිමි වූ විරෝදාර නායකත්වයේ හිඩැස පිරවීම සඳහා ජනතාවගේ බලවත් ඉල්ලීම වූයේ ඩී.ඒ. රාජපක්ෂයන් ට දේශපාලනය ට පිවිසෙන ලෙස පෙරැත්ත කිරීමයි. රාජපක්ෂවරුන් පිළිබඳ ව රුහුණේ විශේෂයෙන් ම ගිරුවා පත්තුවේ ජනතාව තබා තිබුණු විශ්වාසය කෙතරම් ද යත් ඩී.ඒ. රාජපක්ෂයන් හම්බන්තොට මන්ත්‍රීවරයා ලෙස රාජ්‍ය මන්ත්‍රණ සභාවට පත්වූයේ නිතරඟයෙනි. එතුමාට එරෙහිව ජනතාවගේ ඡන්දය ලබා ගැනීම කිසිදාක සිදු නොවන්නක් බව අවබෝධ කරගත් විරුද්ධවාදීන් පවා පසු බා සිටිය හ.

ඩී.ඒ. තම සටන ආරම්භ කළේ ඩී.එම්. නැවැත්වූ තැනිණි. රුහුණු ජනතාවට සිදු වී තිබුණු සමාජ අසාධාරණයට එරෙහිව අධිරාජ්‍යවාදීන්ටත්, ඔවුන්ගේ අනුගාමිකයන්ටත් අභියෝගාත්මක ව මුහුණ දුන් එතුමා, අසාධාරණයට එරෙහිව අධිරාජ්‍යවාදීන්ටත් ඔවුන්ගේ අනුගාමිකයන්ටත් අභියෝගාත්මකව කවර තරාතිරමක ප්‍රබලයකුට හෝ හිස නැමුවේ නැත. ඇතැම් අවස්ථාවල දී අසාධාරණයට උදව් දුන් ප්‍රබලයින්ට කායික වශයෙන් දඬුවම් කිරීමට පවා පෙළැඹුණු ආකාරය අසන්නට ලැබේ.

අධිරාජ්‍යවාදයටත්, සමාජ අසාධාරණයටත් දැඩි ලෙස විරෝධය දැක්වූ ඩී.ඒ. පාර්ලිමේන්තුව තුළදීත්, ඉන් පිටතදීත් නොනවතින අරගලයක් දියත් කළේ ය. තම අපේක්ෂාවන් මුදුන් පත් කර ගැනීම සඳහා කවර තරමේ පරිත්‍යාගයක් හෝ කිරීමට පසුබට නොවූ එතුමා, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා ආණ්ඩු පක්ෂයෙන් ඉවත් වී විපක්ෂයේ අසුන් ගන්නා අවස්ථාවේ දී ඔහුගේ සෙවනැල්ල ලෙසින් විපක්ෂයේ අසුන් ගත්තේ, අධිරාජ්‍යවාදී අනුකාරකයන්ගෙන් සැදුම් ලත් පාලක පක්ෂයෙන් තම අපේක්ෂාවන් ඉටු නොවන බව වටහා ගැනීමෙනි. බල ලෝභී මන්ත්‍රීවරුන් සිටින රටක ඩී.ඒ. රාජපක්ෂ වැනි ශ්‍රේෂ්ඨ පුරුෂයන්ගේ වටිනාකම සිතා ගන්නට පවා අසීරු නොවේ ද ?

අනගාරික ධර්මපාල චින්තනය ඩී.ඒ. රාජපක්ෂයන්ගේ ගමන් මග එළි කිරීමට ප්‍රබල සාධකයක් වූ බව නොරහසකි. මේ නිසාම, දෙස, බස, රැස රැක ගැනීමේ උදාර චේතනාවක් එතුමා තුළ පැලපදියම් ව පැවතිණ. සිංහලයාටත්, සිංහලකමටත් සිදුවන කෙණෙහිලිකම් නොඉවසූ ඔහු ඊට එරෙහිව පතාක යෝධයකු මෙන් සටන් කළේ ය. රුහුණේ හේන් ගොවියාට ඒ සඳහා ඉඩම් ලබාදීමට, සිංහල, ඉංග්‍රීසි

ගුරුවරුන් අතර වූ විෂමතාව නැති කිරීමට පීඩිත ජනතාව ට අධ්‍යාපනයේ සමාන වරප්‍රසාද ලබාදීම ට, තුප්පහි නිලධාරීන්ගෙන් අසරණ ජනතාව ට සිදුවන අකටයුතුකම් නැති කිරීමට එතුමා දැරූ ප්‍රයත්නයෙහි වටිනාකම දැනෙන්නේ දැන් ය. ඒ අරගලයේ වරප්‍රසාද භුක්ති විඳින්නේ වර්තමාන පරම්පරාව ය.1967 නොවැම්බර් මස 07 වැනි දින ජීවිතයෙන් සමුගන්නා තුරු ම ජනතාව සමග ජීවත් වූ මේ විරෝධාර ජන නායකයා, තම නොනිමි මෙහෙවර සපුරාලීම සඳහා ශක්තිමත් පසුබිමක් නිර්මාණය කර තැබීමට තරම් දූර දර්ශී විය. වර්තමාන දේශපාලන කරළියේ ඉහළින් ම වැජඹෙන රාජපක්ෂවරුන් එයට හොඳම උදාහරණයයි.

ඩී.ඒ. රාජපක්ෂයන්ගේ වියෝවත් සමඟ ඒ හිඩැස පුරවන්න ට ඉදිරියට පැමිණි මහින්ද රාජපක්ෂ මැතිතුමා වර්තමාන ජනාධිපති පදවිය හොබවන අතර, චමල් රාජපක්ෂ, බැසිල් රාජපක්ෂ යන දෙසොහොයුරන් එතුමාගේ දෑත් ශක්තිමත් කරන්න ට පාර්ලිමේන්තුව තුළ සිට උර දෙමින් කටයුතු කරනු පෙනේ. මුළු මහත් ජාතියට ම සවිය දෙමින් ආරක්ෂක ලේකම් තනතුර හොබවන ගෝඨාභය රාජපක්ෂ මහතා ශක්තිමත් ගාමක බලවේගයක් බවට පත්ව සිටී. වර්තමානයේ අප දකින මේ රාජපක්ෂවරුන්ගේ සුසංයෝග අහම්බෙන් සිදුවූවක් නොවේ. මා දන්නා හැටියට ඒ වූ කලී ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන්ගේ දුර දර්ශී ජාතික ව්‍යාපාරයේ කූට ප්‍රාප්තියකි. ඩී.එම් ටත් ඩී.ඒ ටත් සිය ජීවිත කාලය තුල සාක්ෂාත් කර ගන්නට නොහැකි වූ ජාතික මෙහෙවර සුපරාලීමට අවශ්‍ය සෑම ශක්තියක් ම අද රාජපක්ෂවරුන් කෙරෙහි ඒක රාශිව පවතී. ඩී.ඒ ට අවශ්‍ය වුයේ ද එයයි. ඒ සඳහා උවමනා කරන ජනතා මනාපය ගොඩ නංවා තැබූයේ එතුමා ය. දුටුගැමුණු ට ලංකාව එක්සේසත් කොට වීරයකුවන්නට හැකියාව ලැබුණේ



5 – H 29785

කාවන්තිස්ස දුර දක්නා නුවණින් සංවිධානය කරන ලද පසුබිම නිසා ය. වර්තමානයේ දී රාජපක්ෂවරුන් ට රට භාර දෙන්න ට තරම් ජනතාව කෘතවේදී වුයේ ද එයයි.

ඒ සඳහා උවමනා කරන ඒ ජනතා මනාපය ගොඩ නංවා තැබුයේ එතුමා ය. දුටුගැමුණුට ලංකාව එක් සේසත් කොට වීරයකුවන්නට හැකියාව ලැබුණේ කාවන්තිස්සගේ දුර දක්නා නුවණින් සංවිධානය කරන ලද පසුබිම නිසා ය. වර්තමානයේ දී රාජපක්ෂවරුන්ට රට භාර දෙන්නට තරම් ජනතාව කෘතවේදි වුයේ එදා ඩී.ඒ. රාජපක්ෂයන් අනුගමනය කළ ජනතාවාදී ප්‍රතිපත්ති නිසා ය.

මීට ඉහත දී ඩී.ඒ. රාජපක්ෂයන්ගේ ගුණානුස්මරණය කරමින් එතුමාට කෘතෝපකාර දැක්වුවාට වඩා ප්‍රායෝගිකව කෘතෝපකාර දැක්වීමට දැන් අපට අවස්ථාව උදාවී තිබේ. ඒ එතුමාගේ අපේක්ෂාවන් මුදුන් පත් කර ගැනීම උදෙසා ප්‍රායෝගිකව පියවර ගැනීමෙනි.

යමෙක් ධර්මය දකී ද, හේ තමා දකින්නේ යැයි එක් අවස්ථාවක දී බුදු රජාණන් වහන්සේ දේශනා කළහ. එහි අදහස සැබෑ බුදුන් පිදීම නම් බුදු දහම අනුගමනය කිරීම බවයි. ඒ අනුව ඩී.ඒ. රාජපක්ෂ වෙනුවෙන් කළ හැකි සැබෑ පූජාව වන්නේ රාජපක්ෂ චින්තනය ක්‍රියාවට නැංවීමයි.වර්තමානයේ ක්‍රියාත්මක වන මහින්ද චින්තනය තුළ ද අන්තර්ගත වී ඇත්තේ රාජපක්ෂ චින්තනය බව සැබෑ ය. එහෙත් අප අදත් අත් දකින යථාර්ථය වී ඇත්තේ සමස්ත සමාජයම සමාජ අසාධාරණයට ගොදුරු වී සිටින බවයි. අධිරාජ්‍යවාදීන්, රදළයින්, මුදලි මුහන්දිරම්වරුන් අද නැතත්, ඔවුන්ගේ හොල්මන් තවමත් පීඩිත ජනතාවට වින කරණු පෙනේ. හේනේ ගොවියාට, කුඹුරු ගොවියාට

සිදු වූ අසාධාරණය තවමත් අවසාන වී නැත. දුප්පත් ජනතාවට රජයේ ආයතනවලින් රාජ්‍ය නිලධාරින්ගෙන් සිදුවන කෙනෙහිළිකම් තවමත් අවසන් වී නැත. රෙද්ද බැනියම අඳින ගැමියා තවමත් දෙවන පංතියේ පුරවැසියන් ලෙස අවතක්සේරුවට ලක්වනුපෙනේ. හම්බන්තොට දිස්ත්‍රික්කය තවමත් සංවර්ධනයෙන් අඩුම දිස්ත්‍රික්කයන් අතර දෙවන තැන ය. අධ්‍යාපනයේ සමාන අවස්ථා තවමත් සැබෑ නොවූ සිහිනයන් පමණි. රාජපක්ෂ චින්තනය වූයේ මේ සකල විධ විෂමතාවයන් නැති කොට සමාජ සාධාරණය ඉටු කිරීමයි. රටේ පවත්නා අහිතකර තත්වයන් යටතේ වුව ද මහින්ද චින්තනය යටතේ යම් ගැටලුවලට යම් ප්‍රමාණයක් විසඳුමක් ලැබෙමින් පැවතීම සතුටට හේතුවක් වෙයි.

ජනතාවගේ ප්‍රශ්න හඳුනා ගන්නට නම් ජනතාව අතර ජීවත්විය යුතුවෙයි. ඩී.ඒ. රාජපක්ෂයන් ජනතාවගේ දුක්ඛ දෝමනස්සයන් අවබෝධ කරගත්තේ එසේ කටයුතු කිරීමෙනි. ජනතාවට ඉහළින් සිට ජනතාවගේ හද ගැස්ම වටහාගත නොහේ. පවත්නා වාතාවරණය යටතේ වර්තමාන දේශපාලඥයන් ට එදා මෙන් ජනතාව අතරට පැමිණීමේ බාධාවක් ඇතත්, ඒ සඳහා ප්‍රායෝගික ව අනුගමනය කළ හැකි විකල්ප ක්‍රම වේදයන් ඕනෑ තරම් තිබෙන බව සිහිපත් කළ යුතු ය. නිලධාරින් හරහා නම් එය කවදාවත් සිදු වන්නේ නැත. ඩී. ඒ. ට එරෙහිව සිටි අනුකාරක නිලධාරි පැලැන්තිය අද නැති බව සැබෑ වුවත් පසුබිම වෙනස් වී ඇත්තේ ඉතාම අවම ප්‍රමාණයකින් පමණක් වීම ඊට හේතුවයි. බොහෝ නිලධාරින් පොදු ජනතාව අතරට ගෙන යන්නේ මහින්ද චින්තනය යන පද දෙක මිස එහි හරය නොවේ.

ඩී.ඒ රාජපක්ෂයන්ගේ අභාවයෙන් දශක හතරක් සපිරෙන මේ මොහොත එතුමාගේ සිහිනය සැබෑ කිරීමට ලැබී ඇති හොඳම

අවස්ථාවයි. එතුමා අපේක්ෂා කළ යුග මෙහෙවර සුපරාලන්නට මීට වඩා හොඳ අවස්ථාවක් යළි උදාවෙතැයි සිතිය නොහේ. උදාවී ඇති මේ අවස්ථාවෙන් උපරිම ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවන අන්දමින් වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම රාජපක්ෂ චින්තනය ක්‍රියාත්මක කරන්නට රාජපක්ෂවරුන් සක්‍රියව පියවර ගන්නේ නම් එය ඩී.ඒ. රාජපක්ෂ නම් වූ විරෝධාර රුහුණු පුත්‍රයාට ශ්‍රේෂ්ඨ ජනතා මිත්‍රයාට දක්වන උසස්ම උපහාරය වනු නිසැක ය.

*කතරගම කිරිවෙහෙර රජමහා විහාරාධිපති,*
*රුහුණු මාගම් පත්තුවේ ප්‍රධාන සංඝනායක,*
*ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කුලපති,*
*මහෝපාධ්‍යාය ආචාර්ය අලුත්වැව සෝරත නාහිමියෝ.*

# දෙවන රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිටි රුහුණේ සිංහයා

**මාතර වැල්ලබඩ පත්තුව ඇතුළු හම්බන්තර පලාතේ ප්‍රධාන සංඝනායක මැල්ලකැටිගොඩ සද්ධානන්ද නාහිමි.**

එදත්, අදත් රුහුණු රට පාලකයන් බිහි කළ ප්‍රදේශයකි. එදා ඩී.එම්. රාජපක්ෂ මැතිඳුන්ගෙන් පටන්ගත් රාජපක්ෂ පරපුර අද දක්වා වූ ජනපති රෝහණ ජන රංජන මහින්ද රාජපක්ෂ මැතිඳුන් තෙක් ගමන් කරයි.

ඩී.එම්. රාජපක්ෂ මැතිඳුන් දේශීය ධනේෂ්වර පන්තියටත්, විදේශීය බලවේගවලටත් නොබියව මුහුණ දුන් රුහුණේ ජන නායකයෙකි. ඔහුගේ සොහොයුරු ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් ද, තම සොහොයුරාට සහාය දැක්වූවා පමණක් නොව ඔහුගේ හදිසි අභාවයෙන් පසු එකී දේශපාලන ව්‍යාපාරය ඉදිරියට ගෙන ගිය අසහාය රුහුණු ජනනායකයෙකි.

රුහුණේ සිංහයා යන විරුදාවලියෙන් එදත් අදත් ජනතාව ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් හඳුන්වනුයේ සිංහ ක්‍රියාකාරිත්වය නිසාවෙනි.



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

රුහුණේ ගොවි කම්කරු ජනතාව වෙනුවෙන් තම කාර්ය භාරය ඉටුකළ ශ්‍රේෂ්ඨතම රුහුණු පුත්‍රයකු ලෙස එතුමා හැඳින්විය හැකි ය. ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් 1945 අගෝස්තු මස 08 වැනි දින හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරමින් දෙවන රාජ්‍ය මන්ත්‍රණ සභාවට නිතරගයෙන් පත්විය. ඉන්පසු එතුමා 1951 ජූලි මස 12 වැනි දින එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිඳුන් එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් වී විපක්ෂයට එක්වුණු මොහොතේ එතුමා සමඟ නොබියව එම මොහොතේ ම පෙර කතිකාවකින් තොරව බණ්ඩාරනායක මහතා පිටු පසින් ගොස් විපක්ෂයේ වාඩි වීමට තරම් එතුමා නිර්භීත රුහුණු පුත්‍රයෙකි. එමෙන්ම එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ මුලිකත්වයෙන් පිහිට වු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යටතේ 1952 වර්ෂයේ පැවති මහ මැතිවරණයේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් පාර්ලිමේන්තුව ට පත්වූ කිහිප දෙනෙකු අතරින් ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් ද සිටීම රුහුණු ජනතාව ට මෙන් ම අප රටට ද භාග්‍යයකි.

එලෙසින් දේශපාලන කරලියේ එතුමා වැජඹෙන්නට විය. එපමණක් ද නොව 1947 වර්ෂයේ සිට 1965 වර්ෂය දක්වා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස බෙලිඅත්ත ආසනය නියෝජනය කළේ ද එතුමා ය.

කලක් ඉඩම් හා කෘෂිකර්ම නියෝජ්‍ය ඇමති වශයෙන් ද, කලක නියෝජ්‍ය කථා නායක වශයෙන් ද, තම සේවය රටට ඉටු කළේ ය. ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් පිළිබඳ තොරතුරු විමසීමේ දී අපට අමතක කළ නොහැකි කරුණු කාරණා රාශියකි. ඒ අතරෙන් ප්‍රධාන කරුණක් වනුයේ එතුමා නාම යෝජනා පත්‍රයට අත්සන් කිරීම යි.

ඩී.ඇම්. රාජපක්ෂ මැතිතුමාගේ අභාවයෙන් පසු හම්බන්තොට ජනතාවගේ එකම හා නිවරැදිම තීරණය වූයේ ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන්ගේ නම යෝජනා කිරීමයි. ඒ සඳහා රුහුණේ ජනතාව අපේක්ෂකයෙකු ලෙස රාජපක්ෂ මැතිඳුන්ට ඉදිරිපත්වන ලෙස ඉල්ලා සිටිය ද එතුමා ඒ සඳහා සිය කැමැත්ත නොදැක්වී ය.

රුහුණු ජනතාව සුදුස්සාම ඒ තනතුරට පත් කිරීම අද මෙන් එදා ද නිවරැදිව සිදු කළේ ය. ඒ මත ජනතාව එතුමා සොයා කුඹුරට යන්නට විය. ජනතාවගේ දැඩි ඉල්ලීම ප්‍රතික්ෂේප කළ නොහැකිව එතුමා වක්කඩෙන් මඩ සෝදා එකී නාම යෝජනා පත්‍රයට අත්සන් කළේ ය. වර්තමාන සමාජය දෙස බලන විට එකල එතුමා තුල පැවති නිහතමානී අව්‍යාජ ගුණයක් ඉස්මතුව පෙනෙයි. තනතුරු, තාන්නමාන්න සොයා ජනතාව දුවන සමාජයක එතුමා සොයා තනතුරු තාන්න මාන්න පැමිණි බව සත්‍යයකි.

රාජපක්ෂ පරපුර අදවන විට රුහුණ පමණක් නොව මුළු සිරි ලකම ජය ගෙන හමාර ය. එහි මූලාරම්භය සිදු කළ ඩී.ඇම්. රාජපක්ෂ මැතිඳුන්ගේ අභාවයෙන් පසු ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමාගේ සිත තුල පහල වූයේ රාජපක්ෂ පරපුර වූ කලී රුහුණටත්, රටටත් සැමදා සේවය කළ පිරිසක් බැවිනි. ඒ මත එතුමා ද ඒ කාර්ය රුහුණු සිංහයෙකු ලෙස ඉටු කළේ ය. ඉන් පසුව ඩී.එම්. රාජපක්ෂ මැතිතුමාගේ දරුවන් වන ලක්ෂ්මන් රාජපක්ෂ, ජෝර්ජ් රාජපක්ෂ යන මහත්වරු ද, දේශපාලන කරලියට ගෙන පාර්ලිමේන්තුවට යවන්නට තරම් එතුමා ක්‍රියාකාරී විය. රාජපක්ෂ පරපුරේ තවත් සුවිශේෂි ලක්ෂණයක් වනුයේ දුටුගැමුණු පරපුර අනුව යමින් සොහොයුරාගෙන් සොහොයුරාට එකී තනතුරු වගකීම් බෙදී යන ආකාරයයි.

වර්තමානය වනවිට රාජපක්ෂ පරපුර ලක් ඉතිහාසයේ නොව ලෝක ඉතිහාසයේ එකම පරපුරෙන් පාර්ලිමේන්තුව නියෝජනය කළ වැඩිම පිරිසක් සිටින පරපුරක් ලෙස සටහන් තබා හමාර ය. එය නිකම්ම සිදුවූවක් නොව ජනතාවට කරන ලද, කරන අසහාය ජනතා සේවය නිසාවෙන්ම ය. එහි නියමුවා ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් ය.

ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් දිවංගත වී වසර 40 ක් ගෙවෙන අවස්ථාවේ දී ද, රුහුණේ මෙන්ම ලක් ජනතාව එතුමා සිහිපත් කරණුයේ ශ්‍රේෂ්ඨ ජන නායකයකු ලෙසිනි. දේශපාලන ජීවිතය ආරම්භ කළ ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් පස්වන පාර්ලිමේන්තුව දක්වා දීර්ඝ කාලයක් දේශපාලනය හා බැඳෙමින් තමන් ට නොව තම පරපුරටද නොව රුහුණේ ජනතාවටත්, රටටත් සුවිශාල සේවාවක් සිදුකර ඇත. එතුමාගේ ශ්‍රේෂ්ඨ සේවය නිසාම රුහුණේ වාසනාවට උපන් අපේම නායකයෙකු ලෙස ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් අදටත් ජනතාව සදා සිහිනයක් කරමින් එකී රාජපක්ෂ පරපුර හා බැඳී සිටියි.

රාජපක්ෂ පරපුරේ නිර්භීත මෙන්ම අවංකකමත් අව්‍යාජකමත්, ශ්‍රේෂ්ඨ කමත් නිරහංකාරකමත් නිසා ජනප්‍රිය බවට පත්වී ය. රුහුණේ සිංහයා නම් වූ ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් ට නිවන් සුව අත්වේවායි පතමි.

*මාතර වැල්ලබඩ පත්තුව ඇතුළු*
*හම්බන්තර පලාතේ ප්‍රධාන සංඝනායක*
*මැල්ලකැටිගොඩ සද්ධානන්ද නාහිමි.*

# ගිරුවා දනව්වේ ඩී.ඒ. රාජපක්ෂ
## ජාතික හෙළ උරුමයේ මහලේකම්
## ආචාර්ය ඕමල්පේ සෝභිත හිමි

ලොව කවර රටෙක, සමාජයක වුව ශ්‍රේෂ්ඨ පුරුෂයන්ගේ පහළ වීම ඉතාම දුර්ලභ ය. එකී ශ්‍රේෂ්ඨ පුරවැසියා ගැන පුරිසාජඤ්ඤ යනුවෙන් අපේ බණ පොතේ දක්වා ඇත. උතුම් පුරුෂයන්ගේ පහළවීම දුලබ සේම එවන්නන් හුදෙක් ආකස්මිකව පහළ නොවෙති. තමන් උපන් දේශයේ, සමාජයේ බහුජනතාව විඳින දුක් ගැහැට, ප්‍රශ්න, කරදර ආදිය නුවණින් දැක, හද ළතෙත් වීම ශ්‍රේෂ්ඨ පුරුෂයෙකු බිහිවන මූලික නිමිත්ත වේ. ශ්‍රේෂ්ඨ පුද්ගලයා ගැන බුදුරජාණන්වහන්සේගේ අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ ඉතා මනහර දේශනාවක මෙසේ සඳහන් වෙනවා.

"චත්තරෝ මේ භික්ඛවේ පුග්ගලා සන්තෝ සංවිජ්ජ මානෝ ලෝකස්මිං කතමේ චත්තරෝ අත්තහිතාච පටිපන්නො පුද්ගලෝ නොපරහිතාච, පරිහිතායච පටිපන්නෝ පුග්ගලෝ නේ අත්තහිතායච, අත්තහිතායච පරහිතායච පටිපන්නෝ පුග්ගලෝ, නේව අත්තහිතායච පරහිතායච පටිපන්නෝ පුග්ගලෝ. "

*(අංගුත්තර නිකාය - චතුක්ක නිපාතය )*

ඉහත අප උපුටා දැක්වූ දේශනාවෙන් බුදුරජාණන් වහන්සේ මෙලොව ජීවත් වන පුද්ගලයන් සතර දෙනෙකු ගැන සඳහන් කරති. ඒ තම යහපත පිණිස කටයුතු කරන, අන් යහපත ගැන නොතකන්නා, අන් යහපත ගැන කටයුතු කරන, තම යහපත ගැන නොතකන්නා, තමන්ගේ සේම අන් යහපත ගැන ද එකසේ සිතා කටයුතු කරන්නා බව මොනවට පැහැදිලි ය.

අප විසින් ගුණ සමරන ඩී.ඒ. රාජපක්ෂයාණෝ එසේ තෙවැනිව සඳහන් කළ ගණයේ අන් වැඩ සේම ලෝ වැඩ සමසේ තැකූ සත්පුරුෂයාන කෙනෙක් වෙති. ඩී.ඒ. රාජපක්ෂ චරිතයේ අලගිය මුලගිය කරුණු විමසන විට පැහැදිලි වන්නේ එබඳු කෙනෙකු පහළ වුයේ ලොව අන් සියල්ල ට පොදු ධර්මතාව පරිදි ඓතිහාසික හා සමාජයීය හේතුසාදක රැසක අන්තර් ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් හැටියට බව යි. අපි එකී කරුණු ගැන අවධානය යොමු කළ යුතු වෙමු.

1761 ලන්දේසි විරෝධී සටන හා 1817-1818 සිංහලයේ මහා කැරැල්ල පෘතුගීසින්ගෙන් පසුව ලන්දේසිහු මෙරට ආක්‍රමණය කළ හ. එය අපේ රජුගේ අදූරදර්ශී රාජ්‍ය ප්‍රතිපත්තිය නිසා සිදුවූවකි. ඔහුම පෘතුගීසින් පළවා හැර ලන්දේසින්ගේ ආක්‍රමණයට ඉඩකඩ සැලසීම ඉඟුරු දී මිරිස් ගැනීමක් හැටියට සඳහන් කළේ ය. රජතුමාගේ වැඩේ කෙසේ වෙතත් කතාවනම් හරියට හරි ගියේ ය. මිරිස්වල සැර ක්‍රමයෙන් දැනෙන්ට විය. ලන්දේසි ආක්‍රමණිකයෝ පොරොන්දු කඩ කර රටේ අභ්‍යන්තර බලය අත්පත් කර ගැනීමට ක්‍රියා කළ හ. රජතුමා ප්‍රධාන විරෝධාර සිංහලයෝ ඊට එරෙහිව කඳවුරු බැඳගත් හ. ලන්දේසි විරෝධී පෙරමුණක් පහත රටින් බලමුළු බැඳගන්නට විය. මුල්කිරිගල

එසේ බැඳගත් ප්‍රධාන ස්ථානයක් විය. එවක මුල්ගිරි විහාරයේ වැඩ විසූ මහා සඟරුවනේ ආශිර්වාද ලබමින් ලන්දේසි විරෝධී සටනට නායකත්වය දුන් වනිගචින්තාමනි මොහොට්ටි දොන් හේන්ද්‍රික් රාජපක්ෂ අප්පුහාමි ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන්ගේ පරපුරේ ඓතිහාසික විකාශය දක්වන ප්‍රබල ලකුණකි.

ලන්දේසින්ගෙන් පසුව ඉංග්‍රීසිකාරයෝ අපේ සිංහල රාජසභාවේ සිදුවනදේ ගැන ඇහැගහගෙන සිට ක්‍රමයෙන් රටේ බලය අත්කර ගැනීමට කටයුතු කළ හ. ඉංග්‍රීසිකාරයෝ 1818 දී ඓතිහාසික උඩරට ගිවිසුම ප්‍රකාරව සිංහලේ ආධිපත්‍ය හිමි කර ගත් හ. එහෙත් සිංහල රජතුමා බලයෙන් පහකර සිංහලේ ආධිපත්‍ය ලබාගත් සුද්දෝ ගිවිසුම තඹදොයිතුවකට මායිම් නොකළ හ. එය කඩවන අයුරින් සිංහල ජනතාව පීඩාවට පත් කරන වැඩ කළ හ. ඉන් ඇතිවූ ප්‍රතිඵලය වුයේ 1817-1818 සිංහලේ මහා කැරැල්ල මගින් ඉංග්‍රීසි රජයට එරෙහි ව සිංහලයන් නැගී සිටීම යි.

එම මහා සිංහල කැරැල්ලට සිංහල රටේ දේශප්‍රේමී, ජාතිප්‍රේමී සිංහලයන්ගේ නොවක් සහයෝගය සහ අනුබලය නොමඳව ලැබිණ. එහි රෝහණ නායකයා වනිග චින්තාමනී මොහොට්ටි රාජපක්ෂ විය. ඉංග්‍රිසිකාරයෝ සිංහලයන්ගේ කෙත් වතු විනාශ කරමින් ද සිංහලයන් සමූල ඝාතනය කරමින්ද ඔවුන්ගේ හරක-බාන නසමින් ද ඉතා අමානුෂික ලෙස කැරැල්ල මර්ධනය කළ හ. මෙකී අමානුෂික ප්‍රාහාර හමුවේ මොහොට්ටි රාජපක්ෂයෝ නැවත රුහුණ ට පසුබසින්න ට වූ හ. වීරකැටිය, බුද්ධියගම, කොන්දගල ඔවුන්ට ඉතා ආරක්ෂිත ස්ථානයක් විය. පසුකාලීනව ගම් මුලදෑනීන්ගේ ප්‍රධානියෙකු ලෙස පත් වූ දාවන් රාජපක්ෂ මැතිතුමා සහ දෝන ගිමාරා වීරකෝන් මැතිණිය

ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන්ගේ දෙමාපියෝ වූ හ. ඩී.එම්. රාජපක්ෂ, ඩී.සී. රාජපක්ෂ යන මහත්වරුන් ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමාගේ වැඩිමහල් සහෝදරයෝ වූ හ.

**ඩී.එම්. සහ ඩී.ඒ**

රුහුණු සිංහයා යන විරුදාවලිය ලත් ඩී.එම්. රාජපක්ෂ මහතා රාජපක්ෂ පරපුරේ දේශපාලන ගමන් මගේ පුරෝගාමියා විය.

එතුමා රුහුණේ ජනතාව වෙනුවෙන් උත්කෘෂ්ඨ කාර්ය භාරයක් ඉටු කළේ ය. එහෙත් 1945 මැයි 18 වනදා ඩී.එම්. රාජපක්ෂ මහතා හදිසියේ කළුරිය කළ අතර, එය රෝහණ ජනතාවගේ හෘද කම්පනයට හේතු විය. ඩී.එම්. ගේ අඩුව රුහුණු ජනතාවට ඉතා බලවත් සේ දැනෙන්නට විය. එකී අඩුවෙන් කම්පිත ප්‍රකම්පිත වූ රෝහණ වාසීහු එය පිරිමැසීමට ඩී.ඒ. රාජපක්ෂයන් ට ආරාධනා කළ හ. කුඹුරේ වැඩ කරමින් සිටින අතරතුර නාම යෝජනාවලට අත්සන් කර 1945 ජූලි මස 14 වැනි දින පැවති අතුරු මැතිවරණයෙන් නිතරගයෙන් තේරී පත් වී 1945 අගෝස්තු මස 08 වැනිදා ආසනය ජය ගත්තේ ය. 1945 අගෝස්තු මස 08 වැනි දින සිට 1947 ජූනි මස 01 වැනි දා දක්වා කෘෂිකර්ම හා ඉඩම් විධායක කාරක සභාවේ සාමාජිකයකු වශයෙන් කටයුතු කළ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා වගා කිරීමට බිම් කැබැල්ලක ද, නැති දුප්පත් ජනතාව වෙනුවෙන් ඉඩම් ලබාදීමටත්, ඔවුන්ගේ ජීවිතය සංවර්ධනය කර ගැනීමටත් ක්‍රියා කළ බව නොරහසකි.

එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා සමඟ එජාප ආණ්ඩුවේ තනතුරු අතහැර විපක්ෂයේ අසුන් ගැනීම.

එජාප වැඩපිළිවෙල ගැන බණ්ඩාරනායක මහතා තුළ මුල සිට ම මනාපයක් නොවී ය. බණ්ඩාරනායක මහතාට ලැබිය යුතු නිසි තැන ද නොලැබුණි. එජාපයේ වැඩපිළිවෙල අධිරාජ්‍යවාදයට හිතවාදී වූ බටහිර ගැති කළු සුද්දන් සනහන එකක් විය. බණ්ඩාරනායක මහතා සියළු තනතුරුවලින් ඉවත්ව විපක්ෂයට ගියේ ය. ඒ මහතාගේ ප්‍රතිපත්තිය අනුමත කරමින් එහි සමගාමී ගමන් කරු වූයේ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා ය. බණ්ඩාරනායක මහතාගේ ඉල්ලීමකින් තොරව ඩී.ඒ. රාජපක්ෂ මහතා එජාප ආණ්ඩුවෙන් ඉවත්වීමෙන් පැහැදිළි වන්නේ අපේකම මුල්කරගත් රටක් පිළිබඳ වූ එතුමාගේ ජාති හිතෛෂී අභිලාෂයයි. ඩී.ඒ. රාජපක්ෂයන් තමාගේ පිටුපසින් ආ සෙවනැල්ලක් නොව තම සමගාමියකු බව කලෙක බණ්ඩාරනායක මහතා ද සඳහන් කළේ ය.

මෙසේ විජාතිකවාදී එජාපයෙන් ඉවත් වූ බණ්ඩාරනායක මහතා ප්‍රධාන ප්‍රබලයෝ දේශීයත්වය අපේකම මුල්තැන්හිලා සලකමින් 1951 සැප්තැම්බර් මස 2 වැනිදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවා ගත්තේය. කෙටි කලක් තුළ මහත් ජයග්‍රහණ රැසක් හිමිකර ගැනීමට සමත් වූ ශ්‍රී.ල.නි.ප ය 56 පෙරළියේ විජයග්‍රහණය රටට අත්කර දීමට මූලික වූයේ ඩී. ඒ. රාජපක්ෂ වැනි රුහුණෙන් පැමිණි නායකයෙකු එහිලා ප්‍රබල වැඩ කොටසක් සිදු කළ පුරෝගාමියෙක් වීම නිසා ය. කිසිදු ලාබ සත්කාරයක් හෝ මැති ඇමැතිකමක් අපේක්ෂා නොකර රට වෙනුවෙන් තම යුතුකම කිරීමට ඩී. ඒ. රාජපක්ෂ ශ්‍රීමතාණෝ තම ප්‍රතිපත්තිය සේ තැකූ හ. එය වඩාත් සනාථ වන්නේ බණ්ඩාරනායක අගමැතිතුමා රාජපක්ෂයන්ට ඇමති තනතුරක් දීමට සූදානම් වූ අවස්ථාවේ එය බාර ගැනීම ප්‍රතික්ෂේප කර ඩී.එම්. රාජපක්ෂ තම

වැඩිමහල් සහෝදරයාගේ පුතුණුවන් වූ ලක්ෂ්මන් රාජපක්ෂ මහතාට එය ලබා දෙන්න යැයි කළ ඉල්ලීමෙනි.

**කුඹුරු පනත**

ගොවියන්ගේ දුක ගැන ඩී. ඒ. රාජපක්ෂ මහතා හොඳින් වටහා ගෙන කටයුතු කළ කෙනෙකි. වෙසෙසින්ම අඳ ගොවියන් ණය බරින් පීඩිත ව විඳින දුක් ගැහැට ගැන ඉතාම සංවේදී විය. ඒ නිසා ම අඳ ගොවියන්ට සහන සැලසීමේ මූලික අරමුණින් පිලිප් ගුණවර්ධන ඇමැතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පනතට සහාය දැක් වූ පුරෝගාමී සහායකයා බවට ඩී. ඒ. රාජපක්ෂ මැතිතුමා පත්විය. ගොවිතැනින් සහන සැලසීමේ මූලික අරමුණින් පිලිප් ගුණවර්ධන ඇමතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පනතට සහය දැක්වූ පුරෝගාමී සහායකයා බවට ඩී.ඒ.රාජපක්ෂ මැතිතුමා පත්විය. ගොවිතැනින් ස්වයංපෝෂිත නොවී රටට නැගීමක් නැති බව තේරුම් ගත් ඩී.ඒ රාජපක්ෂ මැතිතුමා ගොවිබිම වාණිජ භෝග වගාකරණයට එරෙහිව ද කටයුතු කළේ ය. 99 අවුරුදු බදු ක්‍රමයට අක්කරයට ශත පනහක බදු පදනම යටතේ අඳ ගොවියන්ට ඉඩම් රහිත අයට ඉඩම් කැබැලි ලබාදුන් ඔහු ඒවා ජාවාරම් කරුවන් ට විකිණිය නොහැකි වන සේ නීති ප්‍රතිපාදන ද සකස් කළේ ය. සුළු කඳු බෑවුම් සහිත ප්‍රදේශ යටි වගාවක් ලෙස පැඟිරි වැවීමට ජනතාව යොමු කළ රාජපක්ෂ මහතා පසුකාලීනව පැඟිරි තෙල් මිල පහත වැටීම නිසා එම ගොවියන්ට සිදු වූ හානිය වළක්වා ගැනීමට පැඟිරිවලින් කඩදාසි නිපදවිය හැකි අයුරු පෙන්වා දුන්නේ ය. මෙහි ප්‍රතිඵලය වූයේ පසුකාලීනව ඇඹිලිපිටිය වැනි දුෂ්කර ප්‍රදේශයක ට කඩදාසි කම්හලක් ලැබීමයි. සාම්ප්‍රදායික

යැපුම් කෘෂිකර්මාන්තය කර්මාන්තකරණය සමග ඒකාබද්ධ කොට අතුරු නිෂ්පාදන ඇති කිරීමේ වටිනාකම පෙන්වා දුන් අයුරු එතුමාගේ පාර්ලිමේන්තු නිල වාර්තාවල ද සඳහන් වේ.

දැව සඳහා වනාන්තර වගා කිරීමේ ව්‍යාපෘතිය ද එතුමාගේ යෝජනාවක් අනුව ඇති වූවකි. එතුමා මුල් වී ඇරඹූ කිරම ඔය සංවර්ධනය උඩුකිරිවල ජලාශ්‍රිත යෝජනා ක්‍රමය තංලුවෙල්ල, බැරගම අඟුණකොලපැලැස්ස කෘෂි හා වාරියෝජනා ක්‍රම මගින් දැනුදු ජනතාවට සැලසෙන සෙත සුලු පටු නොවේ. චන්ද්‍රිකා වැව යෝජනා ක්‍රමය සාර්ථක කිරීම සඳහා පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ රාජපක්ෂ මහතා අප රටේ පේෂකර්මාන්තය නැංවීමේ බණ්ඩාරනායක මහතාගේ සංකල්පය ක්‍රියාවට නැංවීම සඳහා ගත් වෙහෙස ද සිහිපත් කළ යුතු ය.

මෙසේ රුහුණේ ගිරුවා දනව්වෙන් පැමිණි රෝහණ පුත්‍රයෙකු ගොවි නායකයෙකු පොදුජන නායකයෙකු රදල වාදයට එරෙහිව ක්‍රියා කළ සමාජ ශෝධකයෙකු 56 යේ පෙරලියේ පුරෝගාමියෙකු රට දැය සසුනට හිතවත් අභිජාත දරුවන්.බිහි කළ ශ්‍රේෂ්ඨ පියෙකු වශයෙන් ඩී. ඒ. රාජපක්ෂ සිදු කළ සේවය පමණ කළහැකි නොවේ.

වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් මහින්ද චින්තනය අනුව අප රටේ ඒකීයභාවය, භෞමික අඛණ්ඩතාවය පිළිගනිමින් අපේ කමට දේශීයත්වයට මුල් තැන දෙමින් සම්මා සම්බුද්ධ ශාසනය ප්‍රමුඛ කරගනිමින් සිදු කර ගෙන යන අති උත්කෘෂ්ඨ ජාතික මෙහෙවර ගැන අවධානය යොමු කරන විට අපට නින්නාද වනුයේ ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන්ගේ ස්වරයම ය.

ඩී.ඒ. රාජපක්ෂයන් කිසිදු විජාතික පරදේශක්කාර හෝ අගතිගාමී බලවේගයකට හිස නැමුවෙක් නොවේ. 1947 සෙනෙට් මණ්ඩලයේ සභාපති තෝරන දිනයට පෙර දිනයේ යම් ධනවත් රදල පිරිසක් එතුමා හමුවීමට ශ්‍රාවස්ති මන්දිරයට පැමිණියේ විශාල මුදලක් පිරිනමා යම් කුමන්ත්‍රණයකට හවුල් කර ගැනීමට ය. එහෙත් ඔවුන් එලවා ගනිමින් රාජපක්ෂ මැතිඳුන් පවසා ඇත්තේ පහත එන ප්‍රකාශයයි.

මම මගේ දුප්පත් රුහුණු ජනතාව විකුණා සල්ලි හම්බ කරන්නට මෙහි පැමිණියේ නැහැ. ඔහු එදා නැගූ ඒ රෝහණ සිහ රාවය පමණක් වුව ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට රට දැය සසුනේ චිර පැවැත්ම වෙනුවෙන් කොටි ත්‍රස්තවාදයට හෝ දෙස් විදෙස් කවර බලවේගයකටවත් හිස නොනමා සිදු කරගෙන එන අභීත පාලනය එසේම ඉදිරියටත් පවත්වා ගෙන යාමට මහත් ප්‍රතිඵලයක් වනු නොඅනුමානයි. ඩී. ඒ. රාජපක්ෂ මහතාට කළහැකි ඉහළම ප්‍රණාම දැක්වීම වනුයේ ත්‍රස්තවාදය පරාජය කර අප මව්බිමේ ඒකීයභාවය තහවුරු කර මහජාතියේ අයිතිවාසිකම් කඩ නොවන සෙසු ප්‍රජාවන්ට නිසි තැන ලැබෙන රටක් බිහිකර ගැනීම සඳහා සිදු කර ගෙන යන වැඩපිළිවෙල කවර හෝ බාධකයක් නිසාවත් නතර නොකර කර ගෙන යෑමයි.

*ජාතික හෙළ උරුමයේ මහලේකම්*
*ආචාර්ය ඕමල්පේ සෝභිත හිමි.*

# ජන හදගැස්ම හඳුනාගත් ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා

**රත්නසිරි වික්‍රමනායක**
**අග්‍රාමාත්‍ය**
**2007 ඔක්තෝබර් මස 08 වැනි දින**

දිවංගත එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් සමඟ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවීම සඳහා මුල් වූ කීපදෙනාගෙන් එක් අයෙකු වූ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා ගැමි සුවඳ වහනය වන ගැමි නායකයෙකු අවංක දේශපාලනඥයකු වශයෙන් සැමරුම් ලැබිය යුතු ජනතා පුත්‍රයෙකු බව කිව යුතු ය.

පිදියයුත්තන් පිදීම බොදු පිළිවෙතයි. ඒ අනුව ජනතාව වෙනුවෙන් විශාල මෙහෙවරක් ඉටු කළ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා වෙනුවෙන් ගුණ සමරු උත්සව පවත්වමින් එතුමාට කෘතවේදී උපහාර දැක්වීම අගය කළ යුතු ය. දිවංගත ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා දේශපාලනයට පිවිසියේ අහම්බෙනි.

සිය සොහොයුරු ඩී.ඇම් රාජපක්ෂ මැතිතුමා ගේ අභාවයත් සමඟම හිස් වූ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ හම්බන්තොට අසුනට ඉදිරිපත් වන්නැයි



6 – H 29785

හම්බන්තොට ජනතාව එතුමා වෙතින් දැඩිව ඉල්ලා සිටීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා 1945 දී මන්ත්‍රීවරයෙකු වශයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට පිවිසියේ ය. හේනේ, කුඹුරේ, පැලේ, පිලේ, ගැමියන් සමඟ ළෙන්ගතුව සහජීවනයෙන් පිරි ජීවිතයක් ගෙවූ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා ගේ ගැමි දිවියේ සංකේතය වූයේ කුරහන් සාටකයයි.

ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා අවුරුදු දෙකක කාල සීමාවක් හැර එක දිගටම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් කටයුතු කොට ඇත. එම කාල වකවානුවේ දී එතුමා උප ඇමතිවරයෙක්, නියෝජ්‍ය කතානායකවරයෙක් සහ වැඩබලන අමාත්‍යවරයෙක් වශයෙන් ද කටයුතු කොට ඇත. දුෂ්කර හම්බන්තොට ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්න විසඳීම සඳහා පාර්ලිමේන්තුවෙන් හඬක් නැංවූ එතුමා එමඟින් විශාල මෙහෙවරක් ඉටුකළේ ය. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉතිහාසය දෙස බලන විට ගිරුවාපත්තුව ඉතා දුෂ්කර ප්‍රදේශයක් වශයෙන් හැඳින්විණි. එම ප්‍රදේශය පාලනය කළ මුදලි මුහන්දිරම්වරුන් වෙත කප්පම් ගෙවීමට පවා ගැමි ජනතාවට එදා සිදුව ඇත. මෙවැනි අසාධාරණයන් ට එරෙහිව නැගී සිටි තරුණ ඩී.ඇම්. රාජපක්ෂ සහ ඩී.ඒ. රාජපක්ෂ යන දෙසොහොයුරෝ පීඩාවට පත්ව සිටින ප්‍රදේශවාසීන් ට විශාල මෙහෙවරක් ඉටු කළ හ.

වී, කුරක්කන් ඇතුළු ගොවි නිෂ්පාදන ද ගැමියන් විසින් නිපදවනු ලබන අත්කම් භාණ්ඩ ද කඩ පොළවලට සහ සති පොළවලට ද ගෙන යාමේ අසීරුතාවයන්ට ගිරුවාපත්තුවේ ජනතාව එදා මුහුණ පා සිටියහ. කුල, මල, භේදවලින් පීඩාවට පත් තවත් පිරිසක් ද සිටිය හ. රාජපක්ෂ සොහොයුරෝ එවකට ගිරුවාපත්තුවේ ජනතාව මුහුණ පෑ එවන් ගැටළුවලින් මුදා ගැනීමට සමත් වූ ඩී.එම් සහ ඩී.ඒ. රාජපක්ෂවරු

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවට උදාර යුග මෙහෙවරක් ඉටු කරන්නට සමත් වූහ.

කුලී ගොවියාට කුඹුරේ අයිතිය සහතික කෙරෙන කුඹුරු පනත ගෙන ඒමට නියෝජ්‍ය ඇමතිවරයා ලෙස මෙතුමාගේ මග පෙන්වීම හා දිරිගැන්වීම මෙන්ම යෝජනා අතිශය වැදගත් විය.

අතිදුෂ්කර කටුක දිවි පෙවෙතක් එවකට ගත කළ ඇඹිලිපිටිය ප්‍රදේශයේ ගොවි ජනතාව සඳහා 1957.10.07 වැනි දින ආරම්භ කෙරුණු වලවේ ගඟ සංවර්ධන ව්‍යාපාරයේ ප්‍රථම පියවර වන චන්ද්‍රිකා වැව හා වාරි ව්‍යාපාරය සමඟ බැඳුණු බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රම සහිත ගොවිජන ව්‍යාපාරයේ යෝජනාව, ඉඩම් හා ඉඩම් සංවර්ධන උප අමාත්‍ය ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමාගේ ය. එතුමාගේ ආරාධනයෙන් අග්‍රාමාත්‍ය ඇස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් හා ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය සී.පී. ද සිල්වා මැතිතුමා විසින් ඒවා ක්‍රියාත්මක කරවන ලද්දා හ.

කුඩා වැව් සංවර්ධනය කිරීමේ වැදගත්කම අවධාරණය කොට ක්‍රියා කළ එතුමා මුරුතවෙල ජලාශය ඇති කරවා ප්‍රදේශයේ ජනතාව නගා සිටුවීමට කටයුතු කර ඇත. වී ගොවිතැන මෙන්ම ගොඩ ගොවිතැන සඳහා ද ඉඩම් ලබාදුන් එතුමා අපනයන භෝග වගාවට ද ජනතාව උනන්දු කරවී ය. පොල් ඉඩම්වල සහ නිසරු බෑවුම් ඉඩම්වල පැඟිරි භෝගය වගා කරවා අමතර ආදායම් ලබා ගැනීමට ජනතාව දිරිගැන්වීම ද එතුමාගේ මූලිකත්වයෙන් සිදු විය. පිදුරු භාවිතා කරමින් කඩදාසි නිෂ්පාදනය සඳහා ඇඹිලිපිටියට කඩදාසි කම්හලක් ලබාදුන් එතුමා යල කන්නයේ අහස් දියෙන් කපු වගා

කිරීම සඳහා හම්බන්තොට කපු වගාවක් ඇති කොට ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරවී ය. අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තය, රන් රිදී, පිත්තල වැනි ග්‍රාමීය ශිල්පීය නිපුණතා භාණ්ඩ නිෂ්පාදන ආදියෙහි සංවර්ධනය සඳහා ද එතුමාගේ මග පෙන්වීම හා සහයෝගය ලැබිණි.

දේශීය වෛද්‍යවරයා හා වෙදකම ගෞරවනීය තැනකට ගෙන එමින් දේශීය බෙහෙත් ශාලා හා ආරෝග්‍යශාලා පිහිටුවීම ද එතුමා අතින් සිදු විය. අළුතෙන් පාසැල් ගොඩනංවමින් ප්‍රදේශයේ දරු දැරියන් අතුරින් ම ගුරුවරුන් පත් කර ගනිමින් ද, ඊට අමතරව පිටතින් පුහුණු හා විශේෂඥ ගුරුවරුන් ලබා ගනිමින් ද අධ්‍යාපන ප්‍රබෝධයක් ඇති කරවීම ද, වෛද්‍යවරුන් හා බටහිර ආරෝග්‍යශාලා ඇති කරමින් සෞඛ්‍ය වැඩිදියුණු කරවීම ද එතුමා අතින් සිදු වූ තවත් සේවාවන් වේ. මංමාවත්, විදුලිය ආදී යටිතල පහසුකම් ලබා දෙමින් ප්‍රදේශයේ සංවර්ධන මාවත වේගවත් කරවීමට එතුමා කටයුතු සැලැස්වී ය.

සැබෑ අරුතෙන් ම බෞද්ධයෙකු වූ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා දැහැමි දිවි පෙවෙතක් ගත කළ දේශපාලඥයෙකි. එඩිතර තීරණ ගැනීමේ ශක්තියක් තිබූ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා කම්කරු සහ ගොවි සටන්වල ද පෙරමුණ ගෙන කටයුතු කිරීමට අමතක නො කළේ ය. ආදර්ශමත් දූ පුතුන් බිහි කළ එතුමන් එදා අපේක්ෂා කළ ජනතා මඟ ගත් ජ්‍යෙෂ්ඨ පුතුන් වන අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාත්, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාත්, බැසිල් රාජපක්ෂ මැතිතුමාත් ඊට අමතරව වත්මන් ආරක්ෂක ලේකම්වරයා වශයෙන් කටයුතු කරන ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ද විශිෂ්ට සේවයක් ඉටු කරමින් ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා මෙන් ම රට වෙනුවෙන් ඉටු කරනු ලබන සේවය ද අගය කළ යුතු ය.

ඩී.ඒ. රාජපක්ෂයන් වැනි ජනතා පුත්‍රයන් විරලය. ජනතාවගේ හදගැස්ම නිසියාකාරව තේරුම්ගත් ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා ගිරුවාපත්තුවෙන් ඇරැඹි ජනතා මෙහෙවර ගිරුවාපත්තුවට පමණක් සීමා නො කොට සමස්ත ශ්‍රී ලංකාවට ම ලබා දීමට එතුමාගේ දරුවන්ට හැකිවීම වාසනාවකි. කියා නිම කළ නොහැකි ගුණ සමුදායකින් හෙබි ඩී.ඒ. රාජපක්ෂ සැබෑ ජනතා පුත්‍රයෙකු බව මෙහි ලා සනිටුහන් කරන්නේ හද පිරි සතුටිනි. අති දුෂ්කර පළාතක්ව පැවැති හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගිරුවාපත්තුවේ ජනතාවගේ ඕනෑ එපාකම් කෙරෙහි සිය මුළු කාලයම මිඩංගු කළ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා ප්‍රදේශයේ ගමින් ගම පාසල්, බෙහෙත් ශාලා, මහාමාර්ග ආදිය ඉදිකරමින්, ඉටුකොට ඇති සේවාව අමිල ය. නිරහංකාර ගති පැවතුම්වලින් හෙබි එතුමන් විසින් ගෙන ගිය මහත්මා දේශපාලනය මුළු රටට ම ආදර්ශයක් බව කිව යුතු ය. ඩී.ඒ. රාජපක්ෂයන් වැනි අවංක දේශපාලකයන් විරල ය.

තම ජීවදත්ත තොරතුරුවලට විනෝදාංශ ලෙස එතුමා දක්වා ඇත්තේ ගොවිතැන හා සත්ව පාලනය යි.

අවංක දේශපාලනඥයකු, ගැමි නායකයෙකු වූ එතුමා හම්බන්තොට ජනතාවගේ හදවත් හි අදත් ජීවත්වන්නේ එම විශේෂ ගුණාංග නිසා බව මගේ විශ්වාසය යි.

ඩී.ඒ. රාජපක්ෂයන්ගේ ප්‍රතිපත්ති එදාටත් අදටත් මතු අනාගතයටත් එක සේ ගැලපෙන්නේ ය.

**රත්නසිරි වික්‍රමනායක**
**අග්‍රාමාත්‍ය**
**2007 ඔක්තෝබර් මස 08 වැනි දින**

# ඩී.ඒ. රාජපක්ෂ චරිතය

දී.මු. ජයරත්න,
වැවිලි කර්මාන්ත අමාත්‍ය හා
පොදු ජන එක්සත් පෙරමුණේ මහ ලේකම්

දේශපාලනයේ දී රාජ්‍ය සභාවේ දී කෘතහස්ත බුද්ධිමත් දේශපාලනඥයා ඩී.ඒ. ගමේ දී කාර්යශූර, ක්‍රියාශීලී ගොවියා හා ගොවි නායකයා විය. පන්සලේ දී භක්තිමත් සිල්වත් බෞද්ධයා ය. නිවසේ දී හොඳ සෙනෙහෙබර පියා ය. ආදරණීය ස්වාමියා ය. සමාජයේ දී හොඳ හිතවතා ය. උණුවන හිතක් ඇති දානපතියා ය. නැති බැරිකම දුටුවිට එයට උපකාර කරන කල්‍යාණ මිත්‍රයා ය. බතක් නොඉදෙන ගෙදරක් වී නම් මේ ගෙදර ඔවුන්ට භෝජනාගාරයකි. රාජපක්ෂවරුන් ගේ විශේෂත්වය එයයි. ඔවුන් ගේ නියෝජනය තවමත් ජනතාව අපේක්ෂා කරන්නේ ඒ නිසා ය.

සෝල්බරි කොමිසමේ නිර්දේශ මත පාලනය සඳහා අපට නිදහස දෙන හදිසි තත්වයක් නිර්මාණය විය. දෙවැනි ලෝක යුද්ධයෙන් පසු ඇති වූ ලෝක තත්වයන් ඉන්දියාවට නිදහස දීම නොදී බැරි වූ නිසාත් ලංකාව ද දේශප්‍රේමී අරගලවල පන්නරය ලබමින් ඉදිරියට ගිය නිසාත්

මෙය හඳිසි විය. එහිදී පාලන බලය පැවරීමට නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට සාමාජිකයින් පත් කිරීමට දේශපාලන පක්ෂ අවශ්‍ය විය. කලින් පැවති නියෝජන ක්‍රමය ජාතිමූල නියෝජනයක් වූ නිසා සංවිධාන බිහි වී තිබුණේ එයට අනුරූප වන ආකාරයටයි. එනම් ලංකා ජාතික සංගමය, සිංහල මහා සභා සංවිධානය, ද්‍රවිඩ සංගමය, බර්ගර් සංගමය සහ මැලේ සංගමය වශයෙනි. මේ සියල්ල එකතුව නිදහස් පාර්ලිමේන්තුව සඳහා එක්සත් ජාතික පක්ෂය බිහි කරන්නට යෙදුනි.

මෙහි වැඩි බලය එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක සභාපතිත්වය දැරූ සිංහල මහා සභා සංවිධානයට හිමි වූ නිසා පළමු නිදහස් පාර්ලිමේන්තුවේ අගමැති තනතුර එතුමාට හිමි විය යුතු වුවත් වයස්ගත ඩී.එස්. සේනානායක මැතිතුමාගේ අභාවය නිසා තරුණ බණ්ඩාරනායක ශ්‍රීමතුන් පළමු පදවි පූජාවෙන් ම එතුමාට ඉඩකඩ සළසා දුනි.

එහෙත් ටික කාලයකින් ම බණ්ඩාරනායක ශ්‍රීමතුන්ට සැබෑව පසක් විය. එනම් එතුමා නියෝජනය කළ දේශප්‍රේමී ජනතා සිතුම් පැතුම්වලට හා සැබෑ නිදහස වෙනුවෙන් කිසිවක් ඉටු නොවන බවයි. සුද්දා වෙනුවට කළු සුද්දා නියෝජනය කරන වැඩ පිළිවෙලක් එ.ජා.ප. ය තුළින් සිදුවන බව තේරුම්ගත් බණ්ඩාරනායක ශ්‍රීමතුන් නියෝජනය කළ මතවාදයේ සිටි සියල්ලන් ම අන් මගක් ගැනීමට තීරණය කෙරුණි. මෙසේ තීරණය කරගත් ප්‍රබලයින් අට දෙනෙකු ආණ්ඩුවෙන් පිටතට පැමිණ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය 1951-09-02 පිහිටුවා ගැනුණි. මා ද එදින ම මෙම පක්ෂයට එක්වුණු ප්‍රථම සාමාජිකයෙකි.

මෙහිදී විශේෂත්වය වූයේ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා සමග කිසිදු සාකච්ඡාවක් හෝ ප්‍රමාණවත් කතිකාවක් සිදු වී නොතිබියදී

බණ්ඩාරනායක ශ්‍රීමතාණන් ඓතිහාසික ප්‍රකාශයක් කර පාර්ලිමේන්තුවේ විපක්ෂයට ගමන් කරන විට තමන් සමඟ තමා සමීපයෙන් ම ඩී.ඒ. ගමන් ගැනීමයි. තමන් සමග සිටි ප්‍රථමයා බවට එය ඉතිහාසගත විය. පසුකලෙක බණ්ඩාරනායක ශ්‍රීමතුන් ම ප්‍රකාශ කර ඇති පරිදි මෙය තමාගේ සෙවනැල්ල ලෙස පසුපස ගමන් කිරීමක් නොව, තමා සමඟ එකට එක්ව ගමන් කිරීමකි.

බණ්ඩාරනායක පවුලත්, රාජපක්ෂ පවුලත් දේශපාලනයේ දී මෙන්ම පෞද්ගලිකවත් සමීපයන් වූයේ මේ ගමන් මග සමඟ ය. එමෙන් ම ඩී.ඒ. ගේ දුර දක්නා නුවණත්, විචක්ෂණශීලි බවත්, ජනහිතවාදී බවත් දේශප්‍රේමී බවත් ප්‍රකට කළ මේ සිද්ධිය වර්තමාන ගමන් මගට පෙර ගමන්කරුවෙකු කළේ ය.

1951-09-02 පිහිට වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලකුණ, අත ලකුණ ලෙස තෝරා ගැනුණි. මෙහි විශේෂත්වය වන්නේ එම පක්ෂය ආරම්භ කිරීමටත් මත්තෙන් වැඩි ඡන්ද 8022 කින් අත දිනවා තිබුණේ 1947 පළමු පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත්වෙමින් ඩී.ඒ ය.

1952 පැවති මැතිවරණයේ දී එවකට කීර්තිමත් දේශපාලන පක්ෂයක්ව කටයුතු කළ ශ්‍රී ලංකා මධ්‍යම පාන්තික විශිෂ්ඨ උගත් තරුණයින්ගේ නායකත්වයේ පැවති සම සමාජ පක්ෂය ආසන 10 ක් ලබාගන්නා විට ගැමි සම්ප්‍රදායික නායකයින් සමන්විත වසරකටත් අඩු ආයුෂක සිටි ලාබාල ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 10 ක් හිමි කර ගත්තේ ගොවියෙකු වූ ඩී.ඒ. ද සමඟින් ය. 1956 ජනතා ජයග්‍රහණයක් හා පරිවර්තන යුගයක් සේ ඉතිහාස ගත වී ඇත. මහජන එක්සත් පෙරමුණ ආණ්ඩුව පිහිටුවීමේ දී ඩී.ඒ. ට මුලින් ම ඇමතිකමක් සඳහා

අගමැතිතුමා විසින් ආරාධනා කෙරුණි. එහෙත් ඩී.ඒ. කීවේ තම ඥාති පුත්‍රයා වූ ලක්ෂ්මන් රාජපක්ෂ තරුණයාට ඒ තැන ලබා දෙන ලෙසයි. කෙසේ වෙතත් ලක්ෂ්මන් රාජපක්ෂටත් තනතුරක් ලැබෙමින් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යතුමාගේ දෙවැනියා ලෙස එතුමාට කටයුතු කිරීමට අවස්ථාව ලැබිණි.

අනාගතය නියෝජනය කළ බණ්ඩාරනායක ශ්‍රීමතුන් චන්ද්‍රිකා යුගයක් ගැන කල්පනා කරමින් තම දියණියට නම තබමින් අති දුෂ්කර ප්‍රදේශයක් සශ්‍රීක කරමින් (ඇඹිලිපිටිය) ජනපදයක් හා විශිෂ්ඨ ජනාවාසයක් ඇති කරමින් චන්ද්‍රිකා වැව හා වාරි ව්‍යාපාරය ස්ථාපිත කෙරුණි. එහි යෝජකයා හා ආරාධිතයා මෙන්ම ක්‍රියාත්මක සහකරු වුයේ ද ඩී.ඒ. ය.

වියලි කලාපයේ නියඟයෙන් හා සාගතයෙන් බේරා ගැනීමට දුරදක්නා නුවණින් කුඩා වාරියෝජනා ක්‍රමයක් සංවර්ධනය කිරීමට ඩී.ඒ. උත්සුක විය. මුරුතවෙල ජලාශය ආශ්‍රිත යෝජනා ක්‍රමය, කිරිම ඔය සංවර්ධනය, උඩුකිරිවිල ජලාශය ආශ්‍රිත වාරියෝජනා සංවර්ධනය, තංගලුවේල්ල, බැරගම හා අගුණකොළපැලැස්ස ආදී කෘෂි වාරියෝජනා ක්‍රමයන් මෙයට උදාහරණ ලෙස දැක්විය හැකිය.

ප්‍රදේශයට නොගැලපෙන ලුණුගම්වෙහෙර ව්‍යාපාරය වැනි අසාර්ථක යෝජනා ක්‍රම වෙනුවට ජල ගබඩා, සුළු වාරිමාර්ග ලෙස ගම්වැව් සංවර්ධනයට මෙතුමා වැඩිපුර අවධානය යොමු කර ඇත.

ඉඩකඩම් හා යමක් කමක් ඇති හැකි අයෙකු ලෙස දේශපාලනයට පිවිසි ඩී.ඒ. දිවංගත වූයේ තම නිවසක උකසට බැඳුනු දුප්පතකු

ලෙසයි. එමෙන්ම තම මරණ මංචකයේද ඉතාම සන්සුන්ව තෘප්තිමත්ව එතුමා තම ආදරණීය බිරිඳ හා දරුවන් පිරිවරා ගෙන කීවේ කුමක්ද, මා නුඹලාට ඉතිරි කළ මිළ මුදලක් හෝ වතුපිටි සහිත වස්තූන් නැත. එහෙත් ප්‍රදේශයේ ජනතාව ගේ ප්‍රසාදය හා හොඳ හිත ඕනවටත් වඩා උපයා සපයා මා ඉතිරිකර ඇත. එය අනාගතයේ දී භාරගෙන කටයුතු කරන්න. එතකොට සැමදා ඔබ හැම වාසනාවන්ත වෙනු ඇත. අද සිදුවී ඇත්තේ එය නොවේද?

.1947 සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ (උත්තර මන්ත්‍රී මණ්ඩලය) සභාපති තෝරන දිනට පෙර දිනයේ දී ධනවත් වංශවත් නියෝජිතයන් තිදෙනෙකු ඩී.ඒ. නැවති සිටි ශ්‍රාවස්ති මන්දිරයට පැමිණ රාත්‍රී 8.00 ට පමණ ඔහු එක්තරා සුප්‍රකට සාකච්ඡාවකට සහභාගි කරවා ගෙන කිසියම් අයුතු දෙයකට යොදා ගැනීමේ උත්සාහයක යෙදී ඇත. එවිට තම තැන්පත් ශාන්ත දාන්ත පෙනුම පසෙක ලා කිපුණු සිංහරාජයෙක් සේ ගෝරනාඩු කොට ඔවුන් පලවා හැරියේ තම ප්‍රදේශයේ ජනතාවගේ අභිමානවත් ආත්ම ගරුත්වය ආරක්ෂා කරමිනි. මම මගේ දුප්පත් ජනතාව විකුණා සල්ලි හම්බ කරන්නට මෙහි පැමිණියේ නැතැයි කියා ඔහු නැගූ ප්‍රතාපවත් සිංහනාදය කෙතරම් වටිනවාද (1976 9 වැනි ඩී.ඒ. ගුණසමරුවේ අභිවාදන සමරු කළඹ 37 පිටුව)

කුල, ආගම් භේදවලින් තොර වර්ගවාදී ආකල්ප බිඳ දමා ඇති කරන ලද සංස්කෘතික පිබිදීම මෙහි විශේෂයෙන් දැක්විය හැකිය. දිවයිනේ විශාල ආකාරයේ පැතිරුණ ඥාති පරපුරක ජාලයක් මේ රාජපක්ෂ පවුල වටා ගොඩ නැගී ඇත්තේ ඒ නිසාය. වර්තමානයේ දේශපාලන නායකත්වයේ සිටින කිසිම පවුලකට මෙතරම් පැතිරුණු ඥාති හිතමිත්‍රාදීන් පිරිසක් විවිධ ශ්‍රේණි හා ක්ෂේත්‍ර තුළ නැති තරම්ය.

රුහුණේ ගිරුවායෙන් රටටම දායක කොට දුන් සම්ප්‍රදාය හා උරුමය ක්‍රියාකාරිත්වයේ බලවේගයෙන් තේරුම්ගැනීමට රාජපක්ෂ ක්‍රියාකාරිත්වයේ සාධක නිවරැදිව තේරුම් ගෙන හිමි නිසි තැන අහුරා නොසිටීම මඟින් සැබෑ ජනතා අපේක්ෂාවන් මල්ඵල ගැන්වීමට ඉවහල් වනු ඇතැයි පැවසීමට හැකි වීම සතුටට කාරණයකි.

දිවංගත ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා හා එම මැතිණියත් සමඟ එතුමන්ලාගේ වැඩිමහල් දියණිය දිවංගත ජයන්ති රාජපක්ෂ හෙට්ටිආරච්චි මැතිණිය අපට මෙහිදී කෘතවේදීව සිහිපත් වේ.

එමෙන්ම දේශපාලනයේ යෙදෙමින් පොදු ජනතාවට නායකත්වය දෙමින් ජාති ආගම් කුල ආදී වර්ගවාදී භේදයකින් තොරව ජනතා මෙහෙවරේ යෙදී සිටින අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ වරාය ගුවන්සේවා හා වාරිමාර්ග ජල කළමණාකරන ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිතුමාට, යෝධ ශක්තියක්ව සිටිමින් සහයෝගය දක්වන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී බැසිල් රාජපක්ෂ, රාජ්‍ය ආරක්ෂක ලේකම් කර්නල් ගෝඨාභය රාජපක්ෂ, චන්ද්‍රා, ඩඩ්ලි හා නීතිඥ ප්‍රීති හා ගාන්ධිනි යන සහෝදර සහෝදරියන් ද සිහි කරනුයේ ඩී.ඒ හා එම මැතිණිය ආරම්භ කළ යුග මෙහෙවර අර්ථාන්විතව ඉදිරියටම ගෙන යන බැවිනි.

***දී.මු. ජයරත්න,***
වැවිලි කර්මාන්ත අමාත්‍ය හා
පොදු ජන එක්සත් පෙරමුණේ මහ ලේකම්.

# ගැමියන් අතර ගැමියෙක් වූ ඩී.ඒ. රාජපක්ෂ මැතිඳු

**මෛත්‍රීපාල සිරිසේන**
**ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මහ ලේකම්**
**කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍ය**

රුහුණ අපේ ඉතිහාසය පුරා ජනතා නායකයන් බිහි කළ දේශයකි. ඒ රුහුණු දේශයෙන් මෑත ඉතිහාසයේ බිහි වූ ජන නායකයන් අතර ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන්ට හිමි වන්නේ මුල් තැනකි.

ඩී.ඒ. රාජපක්ෂ මහතා ගේ දේශපාලන ආගමනය ද අහම්බෙන් මෙන් සිදු වූවකි. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ හම්බන්තොට මන්ත්‍රීවරයා ලෙසින් කටයුතු කළ සිය සහෝදර ඩී.ඇම්. රාජපක්ෂ මහතා 1945 මැයි 18 දා අභාවප්‍රාප්ත වීමෙන් හිස් වූ හම්බන්තොට මන්ත්‍රී තනතුර සඳහා ජනතා ඉල්ලීම් පරිදි ඉදිරිපත් වීමට ඩී.ඒ. රාජපක්ෂ මහතාට සිදු විය. වීරකැටිය මිශ්‍ර පාසලෙහි (වත්මන් රාජපක්ෂ මධ්‍ය මහා විද්‍යාලය) සිය අධ්‍යාපනය ආරම්භ කළ ඩී.ඒ. රාජපක්ෂ පසුව උසස් අධ්‍යාපනය සඳහා ගාල්ලේ රිච්මන්ඩ් විද්‍යාලයට ඇතුළත් විය. එදා රිච්මන්ඩ් විදුහලෙහි වූයේ විදේශීය පරිසරයකි. විදුහල තුළ භාවිතා

වූයේ ඉංග්‍රීසි භාෂාවයි. එදා සමාජය තුළ ඉහළට නැගීමට නම් එම සමාජ ක්‍රමය වැළඳගත යුතු වුවත් ඩී.ඒ. රාජපක්ෂ සිසුවාගේ ගැමි සුවඳ මකාලීමට රිච්මන්ඩ් විදුහල සමත් නොවීය. විදුහලේ සිට වීරකැටියට පැමිණි විට ගැමියන් අතර ගැමියෙක් වූ ඩී.ඒ. රාජපක්ෂ බොහෝ විට අන් ගැමියන් සමඟ කුඹුරු වැපිරීමේ කටයුතුවල ද නිරත වූයේය.

තරුණ වියේදීම නියම ගැමි නායකයෙකු ලෙසින් ගිරුවාය පුරා නමක් දිනාගත් ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් ගේ දේශපාලන පුනරාගමනය අනපේක්ෂිත සිද්ධියක් බඳු විය.

1932 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයෙන් බිහි වූ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ හම්බන්තොට අසුන නියෝජනය කරන ලද්දේ ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන්ගේ වැඩිමහල් සොයුරා වූ ඩී.එම්. රාජපක්ෂ මැතිඳුන් විසිනි. ඔහු රුහුණු ජනතාව අතර මහත් පිළිගැනීමකට ලක් වූ ජන නායකයින් අතර රුහුණේ සිංහයා යන විරුදාවලියෙන් ද පිදුම් ලැබීය. මේ ශ්‍රේෂ්ඨ රුහුණු පුත්‍රයා 1945 මැයි 18 දා අභාවප්‍රාප්ත විය. එයින් හිස් වූ මන්ත්‍රී පදවිය සඳහා ඉදිරිපත් වන සේ රුහුණු ජනතාව ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන්ගෙන් ඉල්ලා සිටියහ. මන්ත්‍රී පදවියක් දැරීමට වඩා නිදහස්ව සිට රුහුණු ජනතාවට සේවය කිරීමට ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් අදිටන් කළ ද, සිය මන්ත්‍රීවරයා වශයෙන් ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් පත්කර ගැනීමට රුහුණු ජනතාවට අවශ්‍ය විය.අතුරු මැතිවරණය සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් ගේ කැමැත්ත ලබා ගන්නා ලද්දේ අපහසුවෙනි. කුඹුරේ ලියැදි බඳිමින් සිය වක්කඩෙන් ගලා එන දිය පහරින් දෙඅත් සෝදාගත් ඩී.ඒ. රාජපක්ෂ මැතිඳු කුඹුරේ දී නාම යෝජනා අත්සන් කළ ආකාරය වියපත් රුහුණු වැසියෝ අදත් සිහිපත් කරති. එදා ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් හා තරග

බිමට බැසීමට ප්‍රතිවාදියෙකු ඉදිරිපත් නොවුයෙන්, 1945 අගෝස්තු 08 දා එතුමෝ රාජ්‍ය මන්ත්‍රණ සභාවට නිතරගයෙන් තේරී පත් විය.

එය රුහුණේ නව යුගයක ආරම්භය විය. ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන්ගේ පරම අභිප්‍රාය වූයේ රුහුණු ජනතාවට සේවය කිරීමය. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කෘෂිකර්ම හා ඉඩම් විධායක කමිටුවේ සාමාජිකත්වය එතුමන්ට පිරිනැමිණි. මෙරට රුහුණු ජනතාවට සේවය කිරීම පිළිබඳ එතුමන්ගේ පරම අභිප්‍රාය ඉටුකර ගැනීම සඳහා එය රුකුලක් විය.

1947 මහ මැතිවරණය සඳහා ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් තරග බිමට පිවිසියේ බෙලිඅත්ත ආසනයෙනි. එතුමාගේ ඡන්ද ලකුණ අත විය. එය තව වසර කීපයකින් සිදු වූ යුගයේ මහා දේශපාලන පෙරළියේ දෛවෝපගත පූර්ව නිමිත්තක් වී යයි මට සිතේ. එසේ බෙලිඅත්ත ආසනයට තරග කළ එතුමා වැඩි ඡන්ද 8022 කින් වාර්තාගත ජයග්‍රහණයක් අත්කර ගත් හ.

1947 පිහිට වූ රජයේ පළාත් පාලන අමාත්‍ය පදවිය මෙන්ම සභා නායක පදවිය ද ඉසිලූ එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිඳුන් හා ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් අතර වූයේ මහත් සබැඳියාවකි.

පොදු ජනතාවට සේවය කිරීම හා දේශීයත්වයට මුල් තැනක් දීම වැනි සම අදහස් මේ නායක දෙපලගේ සබැඳියාව පුළුල් කිරීමට හේතු වූවා නිසැකය. 1951 දී බණ්ඩාරනායක මැතිඳුන් අමාත්‍ය පදවියෙන් හා සභා නායක පදවියෙන් ද එක්සත් ජාතික පක්ෂයෙන් ද ඉල්ලා අස්වෙමින් පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ අසුන් ගත්හ. ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් ද ඒ මොහොතේම බණ්ඩාරනායක මැතිඳුන්

අනුගමනය කරමින් එතුමන් සමඟම එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත්ව විරුද්ධ පක්ෂයේ අසුන් ගත්තේය.

ඩී.ඒ. පිටුපසින් පැමිණෙමින් මා අනුගමනය කළා පමණක් නොව මා සමඟ මගේම සෙවණැල්ල සේ එකට එක් වී සිටියේ යැයි පසු කලෙක බණ්ඩාරනායක මැතිඳුන් මේ සිද්ධිය පිළිබඳව සඳහන් කළේය. ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන්ගේ ජනහිතකාමී බවත්, දුර දක්නා නුවණත්, විචක්ෂණශීලී බවත්, දේශප්‍රේමයත් ප්‍රකට කළ මේ සිද්ධිය එතුමාගේ දේශපාලන ගමන් මගෙහි විශිෂ්ට සන්ධිස්ථානයක් විය. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක සිරිමතුන් විසින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවන ලද අවස්ථාවේ එතුමන් ගේ ආසන්නතම අනුගාමිකයෙක් වූ ඩී.ඒ. රාජපක්ෂ මැතිඳු නව පක්ෂයේ සංවිධානය කිරීම සඳහා දිවා රෑ නොබලා වෙහෙසුණේය. ඉන් අනතුරුව 1952 මහ මැතිවරණයේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් බෙලිඅත්ත අසුනට තරග කළ ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් සිය ප්‍රතිවාදියාට වඩා වැඩි ඡන්ද 8022 ක් ලබා ගනිමින් විශිෂ්ට ජයග්‍රහණයක් අත්පත් කර ගත්තේය. එය එකල වාර්තාගත වැඩි ඡන්ද සංඛ්‍යාවක් විය.

1956 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයෙන් සිදු වූ ජනතා ජයග්‍රහණ නව පරිවර්තන යුගයක ආරම්භයක් විය. බණ්ඩාරනායක අගමැතිඳුන්ගේ රජයේ ඉඩම් හා කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍ය පදවියෙන් පිදුම් ලද ඩී.ඒ. රාජපක්ෂ මැතිඳු විවිධ වාරිමාර්ග යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරමින් රුහුණ යළි දේශයේ සාර භූමියක් බවට පත්කර ගැනීමට දැඩි වෙහෙසක් ගත්හ.

චන්ද්‍රිකා වැව හා මුරුතවෙල ජලාශය ඉදි වූයේත් තංගලු වෙල් යාය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූයේත් එතුමන්ගේ අප්‍රතිහත

ධෛර්යයෙන් උඩවලව සංවර්ධන ව්‍යාපාරය ආරම්භ කිරීමෙහි ලා මහත් දායකත්වයක් සැපයූ ඩී.ඒ. රාජපක්ෂ මහතා අඹ කොළ වැව, උඩු කිරි වැව, පල්ලිකාර වැව ආදී කුඩා වාරි යෝජනා ක්‍රම රාශියක් ද ප්‍රතිසංස්කරණය කර වූයේය.

රුහුණේ කෘෂිකර්මය නඟා සිටුවීම සඳහා ඩී. ඒ. රාජපක්ෂ මැතිඳුන්ගෙන් සිදු වූ මෙහෙය වී වගාවට පමණක් සීමා නොවීය. රුහුණට පමණක් සීමා වී පැවති පැඟිරි වගාව ව්‍යාප්ත කිරීමට ද එතුමෝ මහත් වෙහෙසක් ගත්හ. හොරේවෙල, වලස්මුල්ල, පල්ලෙකන්ද, ගැටමාන්න, කටුවන, කිරම, කැකිරිබව, වරාපිටිය හා අහලබොඩ යන ගම්මානයන්හි අක්කර 35,000 කට අධික පැඟිරි වතු බිහිවූයේත්, එමඟින් ගම් වැසි ජනතාවගේ ආර්ථිකය දියුණු වූයේත් ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන්ගේ සංවර්ධන උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙනි.

ඉඩම් හිමියාගේ ප්‍රවේණිදාසයන් ලෙස, කුඹුරු වගාකල අඳ ගොවීන්ගේ අයිතිය සුරක්ෂිත කරලීම සඳහා 1956 බලයට පත් රජය විසින් ක්‍රියාත්මක කරන ලද කුඹුරු පනතෙහි සාර්ථකත්වයට ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් විසින් අගනා මෙහෙයක් ඉටු කරන ලද්දේය.

සිය පාරම්පරික ඉඩම් ද අසල්වැසි ගොවි ජනතාවගේ යහපත පිණිස යොදවමින් කුඹුරු පනතෙහි සාර්ථකත්වය සඳහා එතුමන් විසින් සිදු කළ කැප කිරීම ඉතිහාසයට එක් වී තිබේ.

1960 මහ මැතිවරණයෙන් ද විශිෂ්ට ජයග්‍රහණයක් ලත් ඩී.ඒ. රාජපක්ෂ මහතා 1950-1965 කාලය තුළ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායක පදවිය හා කාරක සභා සභාපති පදවිය හෙබවූයේය.

කෘෂිකාර්මික නවෝදයක් පදනම් කොටගත් කර්මාන්ත සංවර්ධනයක් ද රුහුණේ ඇති කළ යුතු බව එතුමෝ විශ්වාස කළහ. ග්‍රාමීය මට්ටමෙන්



7- H 29785

පැඟිරි තෙල් කර්මාන්තය නඟා සිටුවීමට කටයුතු කළ එතුමා ඇඹිලිපිටිය කඩදාසි කර්මාන්ත ශාලාව පිහිටුවීම සඳහා ද මහත් දායකත්වයක් සැපයූහ.

මේ සියල්ල අතර ප්‍රදේශයේ අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා වර්ධනය කිරීමටත්, මාර්ග පද්ධතිය වැඩි දියුණු කර ගැනීමටත් එතුමෝ මහත් වෙහෙසක් දැරූහ. මෙසේ රුහුණු දේශයට නොමැකෙන සේවාවක් කළ ඩී.ඒ. රාජපක්ෂ මැතිඳු අදින් තිස්නව වසරකට පෙර 1967 නොවැම්බර් 07 වන දා තමා ආදරය කළ ගිරුපත්තු ජනතාවගෙන් ද මුළු මහත් දේශයෙන් ද සදහට සමුගත්ත ද රාජපක්ෂ නාමය වර්තමානයේ තව තවත් බැබළෙමින් පවතී. ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමාගේ ජනතා සේවය අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛව රාජපක්ෂ දරුවන් විසින් ඉදිරියට ගෙන යමින් රුහුණු දේශයටත්, මුළු මහත් රටටත්, ඩී.ඒ. රාජපක්ෂ නාමයටත් කළ හැකි උපරිම ගෞරවය ලබා දී තිබීම ආඩම්බරයට කරුණකි.

***මෛත්‍රීපාල සිරිසේන***
ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මහ ලේකම්.

# රුහුණේ ප්‍රතාපවත් පාලකයා
# අමරසිරි දොඩන්ගොඩ (පා.ම)
### අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය

ප්‍රතාපවත් නර විරුවන්ගේ තෝතැන්නක් බඳු රුහුණේ පෞඩ ඉතිහාසය නොකඩවා රැක දෙනු පිණිස වරින්වර නර ශ්‍රේෂ්ඨයෝ බිහි වුහ. ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා ද මෑත ඉතිහාසයේ රුහුණේ බිහි වූ එවන් නර ශ්‍රේෂ්ඨයෙකි. රුහුණේ සිංහයා යන විරුදාවලියෙන් මහජන සම්මානීයත්වයට පත් වූ ඩී.එම් රාජපක්ෂ මැතිතුමාගේ හදිසි අභාවය නිසා අනාථ වූ රුහුණ යළි සනාථ කළේ අන් කිසිවකු නොව ඩී.ඒ. යි. රාජ්‍ය මන්ත්‍රණ සභා රැස්වීමකට සහභාගී වෙමින් සිටිය දී රෝගාතුර වූ ඩී.එම්. අවසන් හුස්ම හෙලන විට එතුමාගේ දරුවන් වූ ලක්ෂ්මන් හා ජෝර්ජ් වැනි අය වයසින් මුහුකුරා නොසිටිය හෙයින් ගිරුවායේ බර කරට ගැනීමට ඩී.ඒ. ට සිදු විය.

ඩී.ඒ. රාජපක්ෂ කියා කියන්නේ ඉතා දූරදක්නා නුවණින් යුතුව රුහුණ පාලනය කරමින් රට එක්සේසත් කිරීමට උපරිම වශයෙන් දායක වූ ප්‍රතාපවත් පාලකයෙක් වූ කාවන්තිස්ස මහ රජතුමාගේ ආදර්ශයක්යැයි මට සිතේ.

එදා සිට අද දක්වා සිංහලේ ඓතිහාසික වංශ කතාව ලියැවී ඇති මහාවංශය ඇතුළු සියලුම ඓතිහාසික මූලාශ්‍ර කටු ගා දමා ඉතිහාසය නැවත ලියන්නට විචාරාත්මක බුද්ධියකින් හෙබි මධ්‍යස්ථ මතධාරී ඉතිහාසඥයෙකුට පැවරුවහොත් වන්දිභට්ටකමින් තොරව ඔහු විසින් ලියනු ලබන ඓතිහාසික ග්‍රන්ථය ඉහත මා සඳහන් කළ සිතිවිල්ල නැවත නැවතත් සනාථ කරනවාට කිසිදු සැකයක් නැත.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ගේ දහසකුත් එකක් නොපහත්කම් ඉදිරියේ ඩී.ඒ. අභීත කේසර සිංහයෙක් විය. එමෙන්ම එතුමා පොදු මහත් ජනතාව ගේ කුළුපග මිතුරෙක් විය. මුළු මහත් රුහුණට පියෙක් විය. එවකට පැවති පාලනයේ විෂමතාවන් තුළ මිරිකී සිටි ජනතාව ඉන් බේරා ගැනීමට එතුමා නොකල පරිත්‍යාගයක් නැත.

එමෙන්ම බටහිර සංස්කෘතියේ නොවැදගත් අංගයන් මධ්‍යම පන්තිය ඔස්සේ පොදු ජන සිත් සතන් ගිල ගැන්ම එතුමා ඉවසුවේ නැත. දේශීය සාර ධර්මවලට ඉන් වන හානිය වටහා ගත් එතුමා ඊට එරෙහිව දියත් කළ සටන සුළු පටු නොවී. මුල්කිරිගල රජ මහා විහාරය ප්‍රමුඛ ප්‍රදේශයේ විහාරවල වාසය කළ මහා සංඝරත්නය හා ඉතාමත් කුළුපගව කටයුතු කළ එතුමා එමඟින් රුහුණු තරුණ පරපුර ඒම ආගාධයෙන් ගලවා ගත්තේය. ගිරිවායේ කුරහන් සුවඳ හා සිංහල කැකුළු බත රාජ සභාවටත් මන්ත්‍රී නිල නිවාසයටත් ඇතුළු කළ එතුමා හැම විටෙකම සිංහල කමත්, බෞද්ධාගමත් රැක ගත්තේ ය.

සමකාලීන මන්ත්‍රීවරුන්ට ආදර්ශයක් වූ එතුමාගේ නිහතමානීකම වඩාත් ප්‍රකට විය. ක්ෂණික තීරණ ගැනීමට සමතෙක් වූ ඩී.ඒ. ගත් කිසිම තීරණයක් පිළිබඳව පසුතැවුනේ නැත. ඊට හේතුව එතුමා ගත්

සියළු තීරණ හැම අතින්ම අංග සම්පූර්ණ වීමයි. 1951 වර්ෂයේ දී එතුමා ගත් ක්ෂණික තීරණය අන් සියලුම තීරණයන් අභිබවා පොදු ජන හදවත්වලට සමීප වීම රුහුණු ජනතාවට මහත් ආඩම්බරයකි.

අපි ආණ්ඩුවෙන් ඉවත් වෙලා වෙනත් පක්ෂයක් පිහිටවමු කියාවත් අපි ආණ්ඩුවෙන් ඉවත් වනවා ඔබත්, එනවාද කියාවත් බණ්ඩාරනායක මැතිතුමා ඩී.ඒ. ගෙන් අසා නැත. අඩුම වශයෙන් එවැනි ක්‍රියාවක් පිළිබඳ ඉඟියක් පමණක් කර ඇත. ඩී.ඒ. නිවරැදිව හා ක්ෂණිකව එඩිතර පියවර ගැනීමට හැකි දුර දක්නා නුවණක් ඇති යුග පුරුෂයෙක් බව ඒ අනුව ඉතාමත් පැහැදිලි කරුණකි.

දිවංගත අගමැති බණ්ඩාරනායක මැතිතුමා ගේ සෙවනැල්ලක් මෙන් කටයුතු කළ එතුමා එදා ගත් ප්‍රගතිශීලී ක්‍රියාමාර්ගය මේ රටේ දුක් විඳින මුළු මහත් ජනතාවට කෙදිනකවත් අමතක කළ නොහැක. කුලවාදී හැඟීම්වලින් දූෂිතව පැවති බලවතුන්ගේ අදහස් පා දුහුවිලි කොට සැලකූ එතුමා නිතරම පීඩිත ජනතාව ගේ ගැලවුම්කරු ලෙස කටයුතු කළේය. විසි වසරකට ආසන්න වූ එතුමා ගේ ක්‍රියාකාරී දේශපාලන ජීවිතය ගිරුවයේ සිහිල් සුළං රැල්ලක් බඳු වූයේ එහෙයිනි.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ උප කතානායකවරයා වශයෙන් සභාව හසුරුවා අවසානයේ දී කතානායක අසුනෙන් එතුමා බැස්සේ ගිරුවායේ කුඹුරකටය. අම්බල කුඹුරක වක්කඩ බඳින ගොවියෙක් සමඟ ටික වේලාවක් කතා කරමින් සිටි ඩී.ඒ. ඊට පසු කතා කළේ බොහෝ විට රටේ අගමැතිවරයා සමඟය. පොදු ජනතාව හා ඉතාමත් සමීප ඇසුරක් තිබුණු ඩී.ඒ. ට ගොවියාට වඩා වැඩි කෙනෙක් හිටියේ නැත. මුරුතවෙල ව්‍යාපාරය, තංගල්ලේ ධීවර වරාය, බෙලිඅත්තේ ආයුර්වේද රෝහල,

එදා සිට අද දක්වා සිංහලේ ඓතිහාසික වංශ කතාව ලියැවී ඇති මහාවංශය ඇතුළු සියලුම ඓතිහාසික මූලාශ්‍ර කටු ගා දමා ඉතිහාසය නැවත ලියන්නට විචාරාත්මක බුද්ධියකින් හෙබි මධ්‍යස්ථ මතධාරී ඉතිහාසඥයෙකුට පැවරුවහොත් වන්දිභට්ටකමින් තොරව ඔහු විසින් ලියනු ලබන ඓතිහාසික ග්‍රන්ථය ඉහත මා සඳහන් කළ සිතිවිල්ල නැවත නැවතත් සනාථ කරනවාට කිසිදු සැකයක් නැත.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ගේ දහසකුත් එකක් නොපහත්කම් ඉදිරියේ ඩී.ඒ. අභීත කේසර සිංහයෙක් විය. එමෙන්ම එතුමා පොදු මහත් ජනතාව ගේ කුළුපග මිතුරෙක් විය. මුළු මහත් රුහුණට පියෙක් විය. එවකට පැවති පාලනයේ විෂමතාවන් තුළ මිරිකී සිටි ජනතාව ඉන් බේරා ගැනීමට එතුමා නොකල පරිත්‍යාගයක් නැත.

එමෙන්ම බටහිර සංස්කෘතියේ නොවැදගත් අංගයන් මධ්‍යම පන්තිය ඔස්සේ පොදු ජන සිත් සතන් ගිල ගැන්ම එතුමා ඉවසුවේ නැත. දේශීය සාර ධර්මවලට ඉන් වන හානිය වටහා ගත් එතුමා ඊට එරෙහිව දියත් කළ සටන සුළු පටු නොවී. මුල්කිරිගල රජ මහා විහාරය ප්‍රමුඛ ප්‍රදේශයේ විහාරවල වාසය කළ මහා සංඝරත්නය හා ඉතාමත් කුළුපගව කටයුතු කළ එතුමා එමගින් රුහුණු තරුණ පරපුර එම ආගාධයෙන් ගලවා ගත්තේය. ගිරිවායේ කුරහන් සුවඳ හා සිංහල කැකුළු බත රාජ සභාවටත් මන්ත්‍රී නිල නිවාසයටත් ඇතුළු කළ එතුමා හැම විටෙකම සිංහල කමත්, බෞද්ධාගමත් රැක ගත්තේ ය.

සමකාලීන මන්ත්‍රීවරුන්ට ආදර්ශයක් වූ එතුමාගේ නිහතමානීකම වඩාත් ප්‍රකට විය. ක්ෂණික තීරණ ගැනීමට සමතෙක් වූ ඩී.ඒ. ගත් කිසිම තීරණයක් පිළිබඳව පසුතැවුනේ නැත. ඊට හේතුව එතුමා ගත්

සියළු තීරණ හැම අතින්ම අංග සම්පූර්ණ වීමයි. 1951 වර්ෂයේ දී එතුමා ගත් ක්ෂණික තීරණය අන් සියලුම තීරණයන් අභිබවා පොදු ජන හදවත්වලට සමීප වීම රුහුණු ජනතාවට මහත් ආඩම්බරයකි.

අපි ආණ්ඩුවෙන් ඉවත් වෙලා වෙනත් පක්ෂයක් පිහිටවමු කියාවත් අපි ආණ්ඩුවෙන් ඉවත් වනවා ඔබත්, එනවාද කියාවත් බණ්ඩාරනායක මැතිතුමා ඩී.ඒ. ගෙන් අසා නැත. අඩුම වශයෙන් එවැනි ක්‍රියාවක් පිළිබඳ ඉඟියක් පමණක් කර ඇත. ඩී.ඒ. නිවරැදිව හා ක්ෂණිකව එඩිතර පියවර ගැනීමට හැකි දුර දක්නා නුවණක් ඇති යුග පුරුෂයෙක් බව ඒ අනුව ඉතාමත් පැහැදිලි කරුණකි.

දිවංගත අගමැති බණ්ඩාරනායක මැතිතුමා ගේ සෙවනැල්ලක් මෙන් කටයුතු කළ එතුමා එදා ගත් ප්‍රගතිශීලී ක්‍රියාමාර්ගය මේ රටේ දුක් විඳින මුළු මහත් ජනතාවට කෙදිනකවත් අමතක කළ නොහැක. කුලවාදී හැඟීම්වලින් දූෂිතව පැවති බලවතුන්ගේ අදහස් පා දුහුවිලි කොට සැලකූ එතුමා නිතරම පීඩිත ජනතාව ගේ ගැලවුම්කරු ලෙස කටයුතු කළේය. විසි වසරකට ආසන්න වූ එතුමා ගේ ක්‍රියාකාරී දේශපාලන ජීවිතය ගිරුවයේ සිහිල් සුළං රැල්ලක් බඳු වූයේ එහෙයිනි.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ උප කතානායකවරයා වශයෙන් සභාව හසුරුවා අවසානයේ දී කතානායක අසුනෙන් එතුමා බැස්සේ ගිරුවායේ කුඹුරකටය. අම්බල කුඹුරක වක්කඩ බඳින ගොවියෙක් සමඟ ටික වේලාවක් කතා කරමින් සිටි ඩී.ඒ. ඊට පසු කතා කළේ බොහෝ විට රටේ අගමැතිවරයා සමඟය. පොදු ජනතාව හා ඉතාමත් සමීප ඇසුරක් තිබුණු ඩී.ඒ. ට ගොවියාට වඩා වැඩි කෙනෙක් හිටියේ නැත. මුරුතවෙල ව්‍යාපාරය, තංගල්ලේ ධීවර වරාය, බෙලිඅත්තේ ආයුර්වේද රෝහල,

උඩවලවේ ව්‍යාපාරය අදත් සංකේතවත් කරන්නේ ඩී.ඒ. පොදු ජනතාව හා ධීවර ජනතාව දෙස බැලූ ආකාරයයි. මේ ආකාරයෙන් රුහුණු ජනතාවට උසස් ජීවන තත්ත්වයක් ළඟා කර දීමට තම ශ්‍රමය, ධනය හා කාලය කැප කළ ඩී.ඒ. ඉටු කළ මෙහෙය කවදාවත් අමතක කළ නොහැක.

එතුමා ඉතාමත් හොඳ පියෙකි. ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා සිය දරුවන් මෙහෙය වූ එතුමා යුගයේ අවශ්‍යතාව මැනවින් ඉටුකළ සත් පුරුෂයෙකි. එදා කාවන්තිස්ස රජතුමා ද ඉටුකළේ යුගයේ අවශ්‍යතාවයයි. ඩී.ඒ. ද කාවන්තිස්ස රජතුමා මෙන්ම යුගයේ අවශ්‍යතාවය ඉටුකළ ගුණ යහපත් පියෙකි. එහෙත් පියා නිසා දරුවන් ද, දරුවන් නිසා පියා ද ජනප්‍රිය වන්නේ කලාතුරකින් බව අපි දනිමු. ඩී.ඒ. රාජපක්ෂ මහතා නිසා දරුවන් ද, දරුවන් නිසා ඩී.ඒ. රාජපක්ෂ මහතා ද ජනප්‍රියත්වයේ හිනි පෙත්තට පත් වූ බව අමුතුවෙන් කිව යුතු නැත.

යුගයේ අවශ්‍යතාව මැනවින් වටහාගෙන ඒ අනුව කටයුතු කරමින් සිය දරුවන් ද ඒ මගට යොමු කළ ඩී.ඒ. රාජපක්ෂ නම් වූ අසාමාන්‍ය යුග පුරුෂයාට මම නිවන් සුව පතමි.

*අමරසිරි දොඩන්ගොඩ (පා.ම)*
අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

## Rajapaksa Tradition and the Mahinda Chintana

*by*
**Prof. Wiswa Warnapala**
**Minister of Higher Education**

In all emergent States, the political leadership, which played a significant role in the nationalist struggle against colonial domination, was faced with the challenge of coming to terms with the new situation of the post- colonial State. The political leadership, which made use of the traditional symbols and authority to mobilize people to fight colonialism, has to face a situation where they, with the limited resources at their disposal, are expected to arouse continuous public interest in a wide variety of complex political and social issues, and this is necessary to mobilize support for their political programmes. Secondly, they, as the emerging leaders of the new State, need to acquire and maintain power, for which popular support among the citizenry needs to be generated, and this could be effectively done through a quick understanding and identification of the political, social and economic issues affecting the people. One who can immediately

identify with such fundamental issues is certain to emerge as a leader who is capable of generating support for a cause of action which, in the end, would pave the way for him to reach the national political leadership. The traditional political and social institutions, including those social structures, need to be utilized to understand the relevance of the immediate social and economic issues in the immediate environment, from which the emerging leader has to derive inspiration.

In Sri Lanka, there were leaders who, by articulating local issues of significance and making use of the traditional institutions, managed to enter the national political stage; D.A.Rajapaksa, though a local provincial politician with a comparable popular acceptance, was able to emerge as a leader in the province because of the fact that he, as many a politician in Sri Lanka, was able to identify with the major issues of the day, which primarily impinged on the social and economic problems of a people who suffered due to both social oppression and economic backwardness. Hambantota district, which included Giruwa and Magam pattus, was a backward district which, during colonial times, remained neglected and the social and economic status of the province came to be highlighted in Leonard Woolf's writings, and his Village in the Jungle, and Christopher Ondatjee's Woolf in Ceylon are two works which described the nature of the suffering of the poor peasantry in the area. D.A.Rajapaksa, who imbibed socialist ideas through and understanding of the suffering of the

oppressed peasantry, saw the plight and the exploitation of the peasantry and advocated the need for public policies to ameliorate the conditions of the peasant, who, through chena cultivation in an environment dominated by thick jungle, struggled day and night to eke out an existence. The arid climate, the jungle, struggled day and night to eke out an existence. The arid climate, the jungle, the jungle ecology and the social backwardness interfered with the lives of the peasantry who, for their own emancipation and livelihood, was looking for a leadership that is capable of understanding the nature of their struggle for a living. It was in this economic and social scenario that D.A,Rajapaksa representing the peasantry of the Giruwapattuwa, entered the political arena, and he was guided by the need to ameliorate the conditions of the peasantry; every available opportunity was seized to articulate the burning social and economic issues affecting them, and it was this background and experience in the Hambantota district, with its own backwardness and jungle ecology, which created a strong political base for the Rajapaksas who, due to their commitment to safeguard the needs and right of the backward peasantry, were successful in maintaining this base for three generations of theirs. This, in my view, provides ample testimony to the fact that Rajapaksas contributed a great deal to the social and political transformation of the area and it was this commitment, made in the thirties, forties and fifties, is now a popular public policy posture for the complete economic transformation of the district.

With the introduction of the adult suffrage in 1931, there emerged a group of politicians who, making use of the traditional sources of influence, entered politics by articulating the grievances of the common masses; D.A. and D.M.Rajapaksas came with in this category, and they, while articulating the grievances of the peasantry, looked at issues from the point of view of the people, and this aspect of the politics of the senior Rajapaksas helped all Rajapaksas to build and maintain a strong political base in the district, which, despite the passage of time, still remain a formidable political base, which at the last Presidential poll as well, came to the assistance of the President Mahinda Rajapaksa as well.

In most of our districts, where aristocratic elements dominated the political and social life, leaders emerged primarily on the basis of the articulation of the aspirations of the common man; Dr.N.M.Perera in the Three Korales, Phillip Gunawardene in the Hapitigam Korales and Dr.S.A. Wickramasinghe in the Matara District, used the same methods and techniques to articulate and mobilize the peasantry to dethrone those citadels of aristocratic political dominance. The political and social power of the aristocracy was broken and the peasantry, who remained oppressed for ages, was given the opportunity to assert themselves, and a new political culture came into being with a plethora of realistic socialistic slogans. D.A.Rajapaksa, though could not be brought exclusively within this analysis, was yet another social revolutionary who, extending enormous sympathy

to the oppressed peasantry of his own district, came to be motivated by some kind of idealism to champion their cause with vigour and vitality. The need to espouse their cause and the need for immediate amelioration of their economic and social conditions, made them arch enemies of both.

colonialism and imperialism. They were opposed to both colonial oppression and imperialistic domination, and the nationalism originated in ancient Ruhuna probably reinforced it. Inspirational guidance came from the ancient heritage of the place. They, unlike others, obtained first hand experience of the nature of colonial oppression, and was this which motivated them to align themselves with the anti-impreialistic forces of the thirties and forties. As Leonard Woolf explained in his diaries, this was a district where, people depended on dry agriculture which, as in ancient times, depended on irrigation. Irrigation, which, in fact, was the basis of the ancient civilization, came to be neglected during the British period, and the general neglect led to the impoverishment of the peasantry. The experienced near-famines in the region. The poverty-stricken villages in the district which came to be described in the Village in the Jungle, showed the nature of the backwardness of the area. It was in this background of neglect and poverty that Both DM and DA Rajapaksa entered the political arena with the prime objective of alleviating the poverty of the oppressed peasantry in the area. It was in 1936 that DM entered the portals of the legislature, and he, as his brother in the

subsequent period, made use of the woes of the peasantry to emerge as advocates of the emancipation of the peasantry. Giruwapattu, which comprised of twelve thousand small harmlets and villages, due to the impact of the jungle ecology, suffered; they managed their lives with Kurakkan, which, in the end, became the symbol of emancipation of the oppressed peasantry. The speeches inside the State Council indicated that the line of thinking was to emancipate the peasantry and the same commitment came to be displayed by D.W.Rajapaksa as well when he entered Parliament as the elected representative of Beliatta, which he contested as a member of the Sinhala Maha Sabha which was precursor of the Sri Lanka Freedom Party. This was a political organization which, again, focused its attention on the issues of the peasantry and it, subsequently, created the base for the formation of the SLFP, the main constituency of which, as subsequent history amply demonstrated, was a rural sector of the country. By this time, Rajapaksas have begun to dominate the politics of the Hambantota district, and a formidable mass base had been created largely on the basis of their commitment to articulate the grievances of the oppressed peasantry. Two things dominated their political thinking; one was the need to emancipate the peasantry and the other was to rejuvenate the self-sufficient village economy. In an area which is affected by the jungle economy, these issues were important as they, impinged on social

and economic problems of the day. People were suffering due to the failure to mobilize the available resources and they have been exploited by the forces of the traditional aristocracy as well as the forces of imperialism. Even the second layer of the traditional aristocracy and its potentates were exploiters in this region. It was in this background of neglect and exploitation that the Rajapaksas were able to identify themselves with the immediate needs, grievances and interests of the down-trodden peasantry, and they, in addition, aligned themselves with the emerging nationalist and progressive forces of the country. It was this scenario which gave Mahinda Rajapakṣa a unique role in history, and the fund of goodwill, which Rajapaksas built for more than half a century, paid immense political dividends at the last Presidential Poll. He inherited the experience and commitment of his elders, and he, as his elders, always thought in terms of the emancipation of the peasantry and the re-surrection of the ancient glory of the village. He saw the need to tap the social and economic potential of the Sri Lankan village which, since the colonial days, has been exploited by various forces. President Mahinda Rajapaksa, deriving inspiration from this heritage and the Rajapaksa political tradition which recognized the peasantry as the live-wire of social and economic transformation; rightly inherited this political legacy, and it was via this route that he reached national political stage, and Mahinda Chintana – the realistic package of economic and social politics – evidently demonstrated his

commitment to the amelioration of the conditions of the rural peasantry of Sri Lanka. The central concept in this compendium of policies was the need to change the economic and social environment of the village; in other words, he focused on the need to improve the infrastructure of the village and it was his concerned view, obtained primarily on the basis of his own experience among the rural poor, that the economic and social development of the country could be accelerated through a massive programme of rural reconstruction. In relation to this political posture of President Mahinda Rajapaksa, one can say that he remained loyal to his elders and to those causes they championed in the thirties and forties, and he, on the basis on that perception, wanted the introduction of public policies to rejuvenate the village. This line of thinking is in keeping with the tradition of the Sri Lanka Freedom Party which derived energy and strength from the rural Sri Lanka. The history, as anticipated by the genuine supporters of the Sri Lanka Freedom Party who still derive inspiration from the rural peasantry, has assigned him a unique political role, according to which President Mahinda Rajapaksa, as the elected Head of State, is expected to bring about a complete transformation on the rural sector. Therefore, he, unlike his predecessors, has rightly focused on the developed of the village and its infrastructure and today all development programmes have been devised in such a way so as to bring about this transformation as a way of accelerating the process of economic

development. In other words, the emphasis is on the development of rural productive forces, and it is through such a transformation that the exploitation of the rural economy by the urban economy could be prevented. Development strategies need to change in favour of the rural economy. Therefore the Mahinda Chintanaya with its numerous programmes focusing on the development of the infrastructure of the village, is the basis for a fundamental change in the rural economy of Sri Lanka, and it is through this formula that his political base could be further strengthened. A development strategy based on the needs of the rural economy has been formulated on the basis of the Mahinda Chintana and those programmes, if properly implemented, is certain to lay the foundation for an accelerated form of social and economic development in the country. The development strategy, based on the need to transform the rural economy into a productive sector, shows that President Mahinda Rajapaksa, influenced by the experience of his elders, has rightly understood where the political power lies; it was the rural Sri Lanka which gave him the required mandate to emerge as the national leader with a vision of his own for the 21st century. He, as the ancient rulers of Ruhuna, has been assigned a historical task, the central element of which is to provide leadership to a new kind of political change, under which the political dynasticism has disappeared into the limbo of history. In other words, a new kind of political awakening has been inaugurated where dynasticism has been replaced with democracy. Mahinda Rajapaksa's singular historic political

achievement was the replacement of dynastic politics with democratic politics, and this remarkable achievement of his, which is a twenty first century phenomena, needs to be further consolidated. Yet another important achievement of his is that he was instrumental in destroying the foundation of elective feudalism in Sri Lanka.

***Prof. Wiswa Warnapala***
Minister of Higher Education

# පොදුජන හිතකාමී ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා

ලක්ෂ්මන් ජයකොඩි - ජනාධිපති උපදේශක

සැබෑ පොදුජන නායකයකු මෙන් ම, සැබෑ දේශප්‍රේමියෙකු, අව්‍යාජ ගැමියකුලෙසින් මෙන් ම පොදුජන හිතකාමී දේශපාලනඥයකු ලෙසින්, රාජ්‍ය මන්ත්‍රණ සභාව හා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කළ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා, 1967 නොවැම්බර් මස 07 වැනිදා අපෙන් සඳහට ම සමුගත්තේ ය.

එදා රුහුණේ සිංහයා යැයි විරුදාවලියලත් ඩී.එම්. රාජපක්ෂ මැතිතුමාගේ අකල් වියෝවින් පසුව, ජනතාවගේ බලවත් ඉල්ලීම මත හම්බන්තොට නියෝජනය සඳහා ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා කැමතිකරවා ගත්තේ මහා අසීරුතාවයකිනි. ඩී.එම්. රාජපක්ෂ මැතිතුමාගේ අවමංගල උත්සවයට සහභාගිවීම සඳහා මමද මගේ පියා සමඟ ගියෙමි. අප එහි ළඟා වන විට ඩී.ඒ. තම සොහොයුරාගේ අවමංගල්‍ය කටයුතු සංවිධානය කරමින් සිටි අන්දම මට තවමත් හොඳින් මතක ය. එකල අද මෙන් නොව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් අප රට යටත් කරගනිමින් යටත්විජිත පාලනයකට අපිව නතුකර සිය පාලනය තහවුරු කරගැනීම පිණිස නොයෙකුත් උපක්‍රම භාවිතා



8 – ෆ 29785

කරමින් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයන් සිදුකරමින් අධිරාජ්‍ය පාලනය ගෙන ගියහ. ඒ අතරම, මෙම වකවානුව දී ජාත්‍යන්තර දේශපාලන කරලියේ සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී කඳවුර ශක්තිමත් වෙමින් පැවති අතර, එහි බලපෑම් ලෝකය පුරාම දැනෙන්නට විය.

එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් සමග එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් ව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවීමට පුරෝගාමී වූ, එම අරගලයට විශාල ශක්තියක් ලබාදුන් අය අතර ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා ද ප්‍රධාන ය.

ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා කිසිලෙසකින් ධනවත් පුද්ගලයෙකු නොවූ අතර, පොදු ජනතාවට කැපවීමෙන් යුතු ව අවංක ව සේවය කළ අයෙකි. සියලු කැපකිරීම් මත පවුලේ විශාල බරක් තිබියදී ත් අනාගත ජනතා අවශ්‍යතා වෙනුවෙන් කැප කිරීම් කළ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතානන්ට සෙවනැල්ලක් මෙන් ක්‍රියා කළේ ය. 1956 මහමැතිවරණයෙන් ඉතා විශිෂ්ට ජයග්‍රහණයක් ලද ඩී.ඒ. ට බෙලිඅත්ත කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ලෙස තේරුණු අතර, බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ගේ රජයේ ඉඩම් හා ඉඩම් සංවර්ධන නියෝජ්‍ය ඇමතිවරයා ලෙස පත්විය.

ඩී.ඒ. කෘෂිකර්මාන්තයට ඉමහත් ලැදියාවකින් කටයුතු කළ අයෙකි. ඔහු රාජ්‍ය මන්ත්‍රණ සභාව තුළත්, පාර්ලිමේන්තුව තුළත්, පාර්ලිමේන්තුවෙන් පිටතදීත් කරන ලද කථාවලින් ඒ බව මනාව සනාථ වේ. ඉඩම් නොමැති ගොවීන්ට ඉඩම් ලබාදීමට ඔහු පාර්ලිමේන්තුව තුළ සටන් කළේය. දකුණු පළාතට ම සුවිශේෂී වූ

වාර්ක්‍රමයක් හඳුන්වාදීමට ක්‍රියාකළ ඔහු පාර්ලිමේන්තුව නියෝජනය කළ රාජපක්ෂවරු 10 දෙනා අතුරින් කෘෂිකර්මය පිළිබඳ හසල දැණුමක් ඇති ප්‍රමුඛයා විය. මඩගොවිතැන, හේන්ගොවිතැන, ගොඩගොවිතැන මෙන් ම, රටට විදේශ විනිමය ඉපයිය හැකි දුර්ලභ ධාන්‍ය වර්ග ප්‍රචලිත කිරීමේ වැදගත්කම එතුමා අවධාරණය කළේ ය. දකුණ පළාතට සුවිශේෂ වූ කපු වගාව වීරවිල ප්‍රදේශයේ ඇති කිරීමේ පුරෝගාමියා ද ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා ය. එමෙන්ම, හම්බන්තොට දිස්ත්‍රික්කයේ පැඟිරි වගාව සම්බන්ධයෙන් ද එතුමා විශාල උනන්දුවක් දැක්වී ය.

එසේම, ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමාගේ අවධානයට ලක්වූයේ කෘෂිකර්මාන්තය පමණක් නොවේ. එතුමා පාර්ලිමේන්තුව තුළ දී සටන් කළේ අදහස් දැක්වූයේ නැති බැරි පීඩිත ජනතාව වෙනුවෙනි. රටේ සංවර්ධනය වෙනුවෙනි. අනාගත පරපුර වෙනුවෙනි. එතුමාගේ තියුණු ඇසට, රටේ මංමාවත් ඇතුලු යටිතල පහසුකම්, අධ්‍යාපනය, සෞඛ්‍යය, විශේෂයෙන් රාජ්‍ය ආයතනවලින් මහජනතාවට සිදුවන අකටයුතුකම් වැළැක්වූ අතර ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව තුළ හඬ නැංවී ය.

මෙම සියලුදෙයට වඩා ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා රටට දායාද කළ අගනා දායාදය වන්නේ එතුමාගේ පුත් රුවනක් වන වත්මන් ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ය. ශ්‍රී ලංකාද්වීපය ආරක්ෂාකර ගැනීමට ඉතිහාසයේ ඉතාමත් ම තීරණාත්මක අවස්ථාවක මහින්ද රාජපක්ෂ නැමති පොදුජන නායකයා, දේශපාලඥයා කෙරෙහි අචල විශ්වාසයකින් යුතු ව සියලු ජාතින්, සියලු ජන කොටස් කටයුතු කරනුයේ ඉතාමත් ම බලාපොරොත්තු

සහගතව ය. ගිරුවාපත්තුවේ රාජපක්ෂවරුන් ශ්‍රී ලංකාද්වීපයට ඉටුකරන ලද සහ ඉටු කරන කාර්යභාරය ඉතිහාසයේ රන් අකුරින් ලියවෙන බව මම තරයේ විශ්වාස කරමි. අවංකත්වයේ සහ නිහතමානිත්වයේ ප්‍රතිමූර්තියක් බඳු ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන්ගේ 31 වැනි ගුණ සමරුව වෙනුවෙන් මෙම අදහස් ප්‍රකාශ කිරීමට ලැබීම මම මහත් භාග්‍යයක්කොට සලකමි.

ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා ට නිවන්සුව අත්වේවා යි ප්‍රාර්ථනය කරමි.

*ලක්ෂ්මන් ජයකොඩි,*
ජනාධිපති උපදේශක.

# ගොවි දිවිය සරුකළ රුහුණේ නායකයා

ඇස්. ඩී. බණ්ඩාරනායක,
හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී - ගම්පහ

ශ්‍රී ලංකා ඉතිහාසයේ ආරම්භයේ පටන් ම රුහුණු දේශයේ ගිරුවා පත්තුවේ ජනතාව විසින් ඉටුකර ඇති ඓතිහාසික යුග මෙහෙවර අපේ වංශ කථාවන් හි පැහැදිලිව ම සඳහන් වී ඇති සිංහල ශිෂ්ඨාචාරයේ ආරම්භකයා ලෙස සැලකෙන පණ්ඩුකාභය රජතුමා සිය ළමා අවධියේ දී කුමන්ත්‍රණකාරින්ගෙන් ගලවාගෙන ආරක්ෂා කර පෝෂණය කළේ ගිරුවා පත්තුවේ මාමඩුව, වීරකැටිය වැසියන් විසිනි. මාගම බිහිවූ දුටුගැමුණු කුමරුන් අනුරාධපුරය ජයගෙන ජාතිය එක්සත් කළේය. සොලී ආක්‍රමණය ට එරෙහි ව වලගම්බා රජුට සිය දුෂ්කර අවස්ථාවේ දී ශක්තිය ලබාදුන්නේ කසාගල සිත්තම්ගල්ල හා කටුවන වැනි පෙදෙස් ආශ්‍රිතවය. පසුකාලීනව මහා විජයබාහු රජු නැවතවරක් ආක්‍රමිකයන්ගෙන් බේරාගෙන සිංහල දේශය එක්සත්කිරීමේ ජාතික අරගලයට නායකත්වය දුන්නේ රුහුණේ රම්මලේ, ගොංගල, කිරම, වලස්මුල්ල ප්‍රදේශය කේන්ද්‍රකර ගනිමිනි.

මෙවැනි ඓතිහාසික යුග මෙහෙවරක මෑත අවධිය නියෝජනය කළාහු වීරකැටියේ රාජපක්ෂ පරපුරෙන් බිහි වූ දේශමාමකයන් විසිනි. ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමාගේ දේශපාලන භූමිකාව අපේ යුගයේ දේශපාලන වංශ කථාවට විශේෂ අරුතක් දනවන්නේ මෙම ඓතිහාසික වාර්තාව සාපේක්ෂ ව සළකා බැලීමේ දී ය.

මෙවැනි විරෝධාර ජාතික උරුමයකට හිමිකම් කියන රුහුණේ, බුද්දියාගම දොන් දාවත් රාජපක්ෂ විදානාරච්චි රාළහාමිගේ පුතුන් තිදෙනාගෙන් කණිෂ්ඨතමයා ලෙස 1905 මාර්තු මස 30 වැනි දින උපන් ඩී.ඒ. රාජපක්ෂ දරුවා ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයෙන් ස්වකීය අධ්‍යාපනය ලැබී ය. පසුකාලීන ව සිය වැඩිමහලු සොහොයුරු වූ රුහුණේ සිංහයා යැයි විරුදාවලිලත් ඩී.ඇම්. රාජපක්ෂ මැතිතුමාගේ දේශපාලන සටන්වල තිරයෙන් පිටුපස කාර්යභාරය ඉටුකරමින් තමාගේ සමාජයීය යුගමෙහෙවර ආරම්භ කළේ ය. රුහුණේ හා සමස්ථ ශ්‍රී ලාංකික ජනතාවට අපරිමිත මෙහෙයක් ඉටුකරමින් සිටිය දී හදිසියේ ම ඩී.එම්. ගේ අභාවය සිදුවූ නිසා එම උත්කෘෂ්ඨ ජනතා සේවය අතර මග ඇනහිටීම සැමට අසීමිත පාඩුවක් වුයේ ය. මෙයට විසඳුමක් වශයෙන් අභිමිවීගිය එම උදාර නායකයාගේ ක්‍රියා මාර්ගයන් පෙරට මෙහෙයවීම පිණිස අවිවාදයෙන් තෝරාගනු ලැබුවේ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා ය.

ඩී.ඇම්. රාජපක්ෂ මැතිතුමාගේ අභාවයෙන් හිස්වූ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ හම්බන්තොට ආසනයේ අතුරු මැතිවරණය සඳහා ඉදිරිපත්වන්නැ යි ඉමහත් ජනතා ඉල්ලීමක් ගොඩනැඟුනේ නිරායාසයෙන්ම ය. තනතුරු හෝ බලය නොපැතූ අයෙකු වූ ඩී.ඒ. එම ඉල්ලීම නිහතමානී ව ප්‍රතික්ෂේප කළේ ය. එහෙත් නාමයෝජනා

දිනයේ මහජන ඉල්ලීමට අකමැත්තෙන් හෝ එකඟවූයේ කුඹුරේ වගා කටයුතු කරමින් සිටිය දී බව ඩී.ඒ. මා සමඟ පවසා ඇත. මෙම අවස්ථාව සෑම් විජේසිංහ මහතා විස්තරකර ඇත්තේ බලයෙන් ම කුදලාගෙන යාමක් වශයෙනි. නාමයෝජනා දිනයේ දී එතුමා නිතරඟයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත්විය. මඩ සෝදාගත් ගොවියා රජ සබයට ත් ගියේ ඒ අයුරිනි.

1952 මැතිවරණය ජයග්‍රහණය කිරීමෙන් පසු මම ගම්පහ ආසනයේ මන්ත්‍රීවරයා වශයෙන් පාර්ලිමේන්තුවට පත්වීම් ලැබුවෙමි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ජයග්‍රාහකයින් වූයේ නවදෙනෙක් පමණි. අපේ නායක ඇස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා (අත්තනගල්ල) හා මා හැරුනුවිට ඩී.ඒ. රාජපක්ෂ (බෙලිඅත්ත), සී.ආර්. බෙලිගම්මන (මාවනැල්ල), සී.ඇස්. මරික්කාර් (කඩුගන්නාව-2), බර්නාඩ් අළුවිහාරේ (මාතලේ) එච්.බී. තැන්න (දඹුල්ල), හෙන්රි අබේවික්‍රම (බද්දේගම), සී.පී ද සිල්වා (පොළොන්නරුව) යන මහත්වරු අපේ කණ්ඩායම ට අයත් වූහ. මා ආධුනික තරුණයකු වූ අතර, ඩී.ඒ. රාජපක්ෂ මහත්මා ඒ වනවිට පරිණත ජ්‍යෙෂ්ඨයෙකු වූයේ ය. නිසැකව ම ඔහු දෙවෙනි වූයේ ඇස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා ට පමණි. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සහ පළමු පාර්ලිමේන්තුවේ දී කටයුතු කිරීමෙන් මෙතුමා ලබා තිබුණු අත්දැකීම් බොහෝ විය.

1955 සැප්තැම්බර් මස මාගේ සංවිධායකත්වය යටතේ පැවැත්වුනු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගම්පහ සම්මේලනයේ දී එතුමා ක්‍රියාකළ ආකාරය මෙහිදී මට සිහිපත් වේ. පක්ෂයේ ඉදිරි ක්‍රියාකාරිත්වය සංවිධානය කිරීම පිණිස විවිධ ක්ෂේත්‍රයන් සඳහා

අනුකමිටු පිහිටුවා ඒවා වෙන වෙනම රැස් වී සාකච්ඡා කිරීමෙන් ප්‍රතිපත්ති සකස් කිරීම හා ඉදිරි වැඩපිළිවෙල සැලසුම්කිරීම සිදුවිය. කෘෂි කර්ම අංශයේ අනුකමිටුවේ නායකත්වය පැවරුනේ ඩී.ඒ. මැතිතුමාට ය. එතුමා එම කටයුතු සඳහා ඉතා සක්‍රිය දායකත්වයක් පිරිනැමුවා පමණක් නොව, බොහෝදෙනා මවිත කරමින් එතුමා ඉදිරිපත් කළ සමහර යෝජනා අතිශයින් ම ප්‍රගතිශීලි ඒවා වූයේය. එම යුගයේ හැටියට විප්ලවකාරී යැයි හැඳින්වීම වුවද සාවද්‍ය නොවේ. ජනතාව පක්ෂය තුළට සංවිධානය කිරීමේදී දේශපාලන දැනුමෙන් සන්නද්ධ කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළ ඒ මහතා ස්ථිරව ම ක්‍රියාත්මකවන දේශපාලන පාඨමාලාවක් සහිත ව පුහුණුකිරීමේ මධ්‍යස්ථානයක් ඇති කළ යුතුයැයි යෝජනා කළේ ය. මේ සඳහා හම්බන්තොට ප්‍රදේශයෙන් ස්ථානයක් නිර්දේශ නොකරන්නේ නම් ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම සුදුකන්ද නම් ප්‍රදේශය මේ සඳහා යොදාගත හැකි බව මම පැවසීමි. රජයේ රැකියා ලබාදීමේ දී ගොවි ජනතාවගේ දරුවන් ට ප්‍රමුඛතාව දිය යුතු ය. යන්න, තවත් නිර්දේශයක් විය. වී බුසල් සියයකට වඩා අස්වැන්න ලබා ගන්න, ගොවීන්ට විශේෂ දීමනා පිරිනැමීමේ වැඩ පිළිවෙලක් ද මේ අතර විය. එවැනි දක්ෂතා දක්වන ගොවින්ගේ දරුවන්ට විශේෂ වරප්‍රසාද ලබාදීමට ද අදහස් කළේය. බණ්ඩාරනායක මහතා ද මෙම යෝජනාවලට බෙහෙවින් සහාය පළ කළ නමුදු, 1956 රජය ඉක්මණින් අස්ථාවරවීම සහ අගමැති ඝාතනය ආදී හේතු නිසා මෙවැනි ජනතාවාදී යෝජනා ක්‍රියාවට නැංවීමට නොහැකිවීම ජාතියේ ම අභාග්‍යයක් වූයේය. බණ්ඩාරනායක ප්‍රතිපත්ති සමග රාජපක්ෂ දර්ශනයේ සුසංයෝගය නිසි අයුරින් ක්‍රියාත්මක කිරීමට එදා වාසනාව ලැබුනානම් මේ රටේ වර්තමානය මෙයට වඩා බොහෝ සෙයින් වෙනස් වීමට ඉඩ තිබුණු බව මාගේ වැටහීම යි.

ප්‍රායෝගික ව කෘෂිකර්මාන්තය ගැන මනා දැණුමක් ඇතිව සිටි ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා රුහුණේ ගොවි හා ගැමි ජනතාවගේ අසහාය නායකයෙකු ද වූයේය. කෘෂිකර්ම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ එතුමාගේ විෂය දැනුම වඩාත් කැපී පෙනුනේ 1956 ජයග්‍රහණයෙන් පසුව කෘෂිකාර්මික කටයුතු කරද්දී යැයි මම සිතමි. සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච මහා බලවේග ඒකරාශි වෙමින් සැදුන එම යෝධ පෙරළිය සංවිධානය කිරීමේ දී ගොවිජන නායකත්වය නියත වශයෙන් ම දැරුයේ ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් ය. 1956 රජයෙන් සිදු කෙරුණු ඉතාමත්ම ජනතාවාදී සමාජ ප්‍රතිසංස්කරණය කුඹුරු පනත බව එකල සියලු විචාරකයන් අවිවාදයෙන් පිළිගත් සත්‍යයකි. පිලිප් ගුණවර්ධන මහතාගේ නායකත්වයෙන් එම පනත ඉදිරිපත් වූ අතර, ඩී.ඒ. රාජපක්ෂ මහතා එයට නොමද සහායක් ලබා දුන්නේ ය. කුඹුරු වගාවේ අස්වැන්න විශාල වශයෙන් වැඩිකරගැනීම ඉලක්ක කර ගනිමින් එසේ වැඩිවන අස්වැන්නෙන් ගොවියාගේ අඳපංගුව ඉහළ නැංවීම ත්, අඳ අයිතිය සුරැකීම ත්, ගොවිකම උදෙසා සංවිධාන ව්‍යුහයක් වශයෙන් ගොවි කාරක සභා ඇති කිරීමත්, එමගින් අපේක්ෂා කරන ලදී. ආණ්ඩුව තුළ සහ පිට සිටි කඩාකප්පල්කාරීන් එයට ලබා දුන් වැරදි අර්ථ නිරූපන නිසා කුඹුරු හිමි පංතිය උසි ගැන්වීම ට ලක් විය. ඒ නිසා පනතේ සමහර අරමුණු බිඳ වැටුණි.

වියළි කලාපයේ හේන් ගොවිතැනින් දිවි රැකගන්නා දුප්පත් ගොවි ජනතාවගේ හඬ නිරන්තරයෙන් ම ව්‍යවස්ථාදායකය තුළ නියෝජනය කළේ එතුමා විසිනි. අමු, මෙනේරි, කුරක්කන් ආදී කටුසරබෝග වගාකරමින් කාෂ්ඨක පොළව සමඟ හැපෙන

ගොවියාට තමාගේ ම ඉඩම් කැබැල්ලක් හිමිකරදීමේ අවශ්‍යතාවය රාජපක්ෂ මහතා නිතරම පාහේ පෙන්වා දුන්නේ ය.

වලවේ ගඟ ඔස්සේ මහ සමුදුරට ඇදී යන අප්‍රමාණ ජලකඳ හරස් කොට රුහුණු මාගම ඓතිහාසික රාජධානි සමයේ මෙන් මහා වැව් කර්මාන්තයක් ඇතිකොට උඩවලව යෝජනා ක්‍රමය ඇතිකිරීමේ ප්‍රමුඛයා රාජපක්ෂ මහතා ය. එමඟින් රුහුණේ ඓතිහාසික සමෘද්ධිය නැවත උදාකරලීම එතුමාණන්ගේ උදාර ප්‍රාර්ථනාව වූයේ ය. චන්ද්‍රිකා වැව ව්‍යාපෘතිය ද තවත් එවැනි යෝධ පියවරකි. මෙවැනි තවත් සංවර්ධනාත්මක හා ජාතික කර්තව්‍යයන් රැසකට ද හෙතෙම නායකත්වය දුන්නේ ය. තවත් වැදගත් කරුණක් මගේ සිහියට නැඟේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යැයි කී පමණින් කෙනෙකුගේ මතකයට නැගෙන ප්‍රධානතම සාධකයක් නම් අත සළකුණ යි. පක්ෂයේ ඉතා ජනප්‍රිය ඡන්ද සළකුණ වශයෙන් ප්‍රචලිත ව පැවතියේ එම ලාංඡනයයි. සමගි පෙරමුණ සහ සන්ධාන ගොඩනැඟිමේ ප්‍රවණතා නිසා මේ වනවිට ටික කලක් භාවිතයෙන් ඉවත්ව පැවතිය ද ජනතාවගේ ආදරය දිනාගත් මේ ලාංඡනය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අනන්‍යතාව ප්‍රකාශ කරන්නක් බව මම සිතමි.

මෙම සලකුණ පක්ෂයට උරුම කළේ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා විසින් බව දන්නේ ටික දෙනෙකි. 1947 මැතිවරණයේ දී බෙලිඅත්ත ආසනයට ඉදිරිපත්වීමේ දී එතුමා තෝරාගෙන තිබුණේ අත ලකුණ යි.

1951 දී ශ්‍රී.ල.නි.ප. ය පිහිටුවීමෙන් පසු එම පක්ෂයේ ලකුණ වශයෙන් එය පිළිගතයුතු යැයි එතුමා පක්ෂයට යෝජනා කළේ ය. මම එම යෝජනාව ස්ථිර කළෙමි. බණ්ඩාරනායක මැතිතුමා එය ඉතා සතුටින් පිළිගත් අතර, මේ අත දෙස හැමෝ ම බැලිය යුතු යැයි ද පැවසී ය. එය ජාතිය ගමන් කරන නිවැරදි අතවීම භාග්‍යයකි.

දීර්ඝ කාලයක් එතුමා සමඟ සමීප සමකාලීන සටන් සගයෙකු හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස ද අප සම්බන්ධ වූ කටයුතු බොහෝ ය. මේ රටේ දියුණුවටත් විශේෂයෙන් ගිරුවාගම් දොළොස් දහසේ ජනතාවටත් අප්‍රමාණ සේවාවක් ඉටු කළ ඩී.ඒ. රාජපක්ෂ මැතිඳුන් 1967 නොවැම්බර් මස 07 වැනි දින දිවංගතවීම අප කාටත් සුවිශාල පාඩුවක් වුයේ ය. එහෙත් එතුමාගේ පුත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ශක්තිමත් නායකත්වය යටතේ ශ්‍රී ලංකාව සංවර්ධනයේ පෙරට ම මෙහෙයවනු දැකීම පියාගේ සමකාලීනයෙකු වශයෙන් බලවත් සතුටට කරුණකි. මහින්ද චින්තනය උපයෝගි කරගනිමින් දුරදක්නා නුවණින් යුතුව, ජනාධිපතිතුමා විසින් ගෙන යන මෙම ජනහිතකාමී ක්‍රියාමාර්ගය ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමාණන්ගේ කීර්තිනාමය ට පුදකරනු ලබන හොඳම උපහාරය යැයි මම විශ්වාස කරමි.

ඩී.ඒ. රාජපක්ෂ ශ්‍රීමතාණන් ට නිවන් සුව අත් වේවා.

*ඇස්.ඩී. බණ්ඩාරනායක,*
හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී - ගම්පහ.

## ஜனாதிபதியின் தந்தை அமரர் டீ.ஏ.ராஜபக்ஷ

செல்லமுத்து சோமசந்திரன்
இணைப்புச் செயலாளர்.
கிழக்கு மாகாண சிங்கள, தமிழ், முஸ்லிம்
சமாதான ஒன்றியம்.

1945 ஆம் ஆண்டில் சட்ட சபைக்கு அம்பாந்தோட்டைத் தொகுதி உறுப்பினராகப் போட்டியின்றித் தெரிவு செய்யப்பட்ட இவர் பாராளுமன்ற உறுப்பினரென்ற வகையில் பெலியத்த தொகுதியை பிரதிநிதித்துவப் படுத்தி, உப அமைச்சர், பிரதி அமைச்சர், அமைச்சரவை அந்தஸ்துள்ள அமைச்சர் மற்றும் பிரதிச் சபாநாயகர் என்றவாறு பல்வேறு பதவிகளையும் ஏற்று மக்கள் சேவையில் அர்ப்பணிப்புடன் ஈடுபட்டார்.

இவர் அரசியலிலும் சட்ட சபை மற்றும் பாராளுமன்றத்திலும் திறமைவாய்ந்த புத்தி சாதுரியம் மிக்க அரசியல்வாதியாகவும், கிராமத்தில் செயலாற்றல்மிக்க விவசாயியாகவும், விவசாயத் தலைவராகவும், விளங்கினார். பௌத்த விகாரையில் சீலம் பேணும் பௌத்தராகவும், குடும்பத்தில் அன்புமிக்க தந்தையாகவும், அன்புக்குரிய

கணவராகவும், சமூகத்தில் சிறந்த நண்பராகவும், உள்ளம் கசிகின்ற கொடை வள்ளலாகவும், எளியோரைக் காண்கின்ற போது உதவி செய்யக்கூடிய ஆப்த நண்பராகவும் விளங்கினார். சமையல் நடக்காத ஒரு வீடிருப்பின் அவர்களுக்கு இவருடைய வீடு ஒரு உணவகமாக இருந்தது. ராஜபக்ஷ பரம்பரையின் சிறப்பியல்பு இதுவாகும். இவருடைய பிரதிநிதித்துவத்தை இதன் காரணத்தினாலேயே மக்கள் தொடர்ந்தும் எதிர்பார்த்தனர்.

சோல்பரி ஆணைக்குழுவின் விதப்புரையின் மீது எமக்கு சுதந்திரமளிக்க வேண்டிய அவசர நிலைமையொன்று உருவாகியது. இரண்டாவது உலக மகா யுத்தத்தின் பின்னர் உருவாகிய உலக நிலைமைகளின் காரணமாகவும் இந்தியாவுக்கு சுதந்திரம் வழங்காதிருக்க முடியாதிருந்ததன் காரணமாகவும், இலங்கை தேசப்பற்றுமிக்க போராட்டங்களால் வலுவடைந்து முன்னேறிச் சென்றமையாலும் இது அவசர தேவையாயிருந்தது. இங்கு ஆட்சி அதிகாரத்தை ஒப்படைக்கும் பொருட்டு பிரதிநிதிகள் சபைக்கு அங்கத்தவர்களை நியமிக்க அரசியற் கட்சிகளுக்கு அவசியமிருந்தன.

முன்னர் நிலவிய பிரதிநிதிகள் முறையானது இன அடிப்படையிலான பிரதிநிதித்துவமாயிருந்தமையால், இதற்கு ஏற்புடையவாறே அமைப்புக்களும் உருவாகியிருந்தன. அதாவது இலங்கை தேசிய சங்கம், சிங்களப் பேரவை அமைப்பு, முஸ்லிம் லீக், தமிழ் காங்கிரஸ், பர்கர் சங்கம் மற்றும் மலேயர் சங்கம் என்றவாறாகும். இந்த அனைத்து அமைப்புக்களும் ஒன்று சேர்ந்து சுதந்திர பாராளுமன்றத்தின் பொருட்டு ஐக்கிய தேசியக் (UNP) கட்சியை உருவாக்கிக் கொண்டன.

இதில் பெரும்பான்மை அதிகாரம் எஸ். டபிள்யு ஆர். டீ. பண்டாரநாயக்க அவர்கள் தலைமை வகித்த சிங்களப் பேரவை அமைப்புக்கு உரித்தாயிருந்தமையால், முதலாவது சுதந்திரப்

பாராளுமன்றத்தின் பிரதம அமைச்சர் பதவி அவருக்கு கிடைக்க வேண்டியிருந்த போதிலும், வயதில் மூத்த டி. எஸ். சேனாநாயக்க அவர்களின் வேண்டுகோளின் காரணமாக இளைஞரான பண்டாரநாயக்க அவர்கள் தலைமைப் பதவியைக் காணிக்கையாகக் கொடுத்ததன் மூலம் அவருக்கு அதற்கான வாய்ப்பை ஏற்படுத்திக் கொடுத்தார்.

ஆயினும் சிறிது காலத்திலேயே பண்டாரநாயக்க அவர்கள் உண்மையைப் புரிந்துகொண்டார். அதாவது, அவர் பிரதிநிதித்துவப் படுத்திய தேசப்பற்றுமிக்க மக்கள் எதிர்ப்பார்ப்புக்கள் சார்பாகவும் உண்மையான சுதந்திரத்தின் சார்பாகவும் எதுவும் நிறைவேற்றப்படுவதில்லையென்பதைப் புரிந்துகொண்டார். வெள்ளைக்காரனுக்குப் பதிலாக கறுப்பு வெள்ளைக்காரனை பிரதிநிதித்துவப்படுத்துகின்ற வேலைத்திட்டம் ஐக்கிய தேசிய பாதையில் செல்வதற்குத் தீர்மானித்தனர். இவ்வாறு தீர்மானித்த பலம் பொருந்திய எட்டுப் பேர் அரசாங்கத்திலிருந்து வெளியேறி, 1951.09.02 ஆம் திகதி ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியை நிறுவினார்கள்.

இங்கு டி. ஏ. ராஜபக்ஷ அவர்களுடன் எவ்விதக் கலந்துரையாடலோ அல்லது போதியளவு உரையாடலோ நடைபெறாதிருக்கையில், பண்டாரநாயக்க அவர்கள் வரலாற்றுப் புகழ் மிக்க உரையொன்றைப் பாராளுமன்றத்தில் நிகழ்த்திவிட்டு பாராளுமன்றத்தின் எதிர்க்கட்சியின் பக்கம் செல்கின்றபோது அவரோடு அவருக்குப் பக்கத்திலேயே டி. ஏ. ராஜபக்ஷ அவர்களும் சென்றமை சிறப்பியல்பாயிருந்தது. தன்னுடனிருந்த முதலாவது மக்கள் பிரதிநிதி என்ற வகையில் இது வரலாற்றில் பதிவாகியுள்ளது. பின்னொரு காலத்தில் பண்டாரநாயக்க அவர்கள் கூறியுள்ளது, இது தன்னுடைய நிழலாகத் தன்னைத்

தொடர்ந்து சென்ற பயணமாகவன்றி, தம்முடன் ஒன்றாக சேர்ந்து சென்றதொரு பயணமாக இருந்தது.

இப் பயணத்தைத் தொடர்ந்தே பண்டாரநாயக்க குடும்பமும் ராஜபக்ஷ குடும்பமும் அரசியலிலும் அதேபோன்று தனிப்பட்ட வாழ்க்கையிலும் நெருக்கமானவர்களாக மாறினர். அதே போன்று டீ. ஏ. அவர்களின் தொலைநோக்குடனான அறிவையும் செயற்றிறமையையும் மக்கள் மீதுள்ள அன்பையும், தேசப்பற்றையும், வெளிக்காட்டுகின்ற இச் சம்பவம் தற்போதைய பயணத்தின் முன்னோடியாக அவரை மாற்றியது.

1951.09.02 ஆந் திகதி நிறுவப்பட்ட ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியின் சின்னமாகக் கைச்சின்னம் தெரிவுசெய்யப்பட்டது. இக் கட்சி ஆரம்பிக்கப்படுவதற்கு முன்னரே 1947 ஆம் ஆண்டு முதலாவது பாராளுமன்றத் தேர்தலில், டீ. ஏ. ராஜபக்ஷ அவர்கள் "கை" சின்னத்தில் போட்டியிட்டு வெற்றியீட்டியிருந்தமை இதிலுள்ள சிறப்பியல்பாகும்.

1952 ஆம் ஆண்டு நடைபெற்ற தேர்தலில் இலங்கையின் மத்திய வகுப்பைச் சேர்ந்த மிகச் சிறந்த, கல்விகற்ற இளைஞர்களின் தலைமைத்துவத்துடனான புகழ்பெற்ற அரசியல் கட்சியான சமசமாஜக் கட்சி 09 தொகுதிகளில் வெற்றி பெறுகின்றபோது, கிராமிய மரபுவழித் தலைவர்களைக் கொண்ட, ஒரு வருடம் கூட நிலைவெய்திருக்காத, இளம் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி, விவசாயியான டி. ஏ. ராஜபக்ஷ அவர்களுடன் சேர்த்து 09 தொகுதிகளில் வெற்றியீட்டியது.

1956 இல் மக்கள் வெற்றியாகவும் யுகப் புரட்சியாகவும் வரலாற்றில் பதிவாகியுள்ள மக்கள் ஐக்கிய முன்னணி அரசாங்கம் நிறுவப்பட்டபோது

முதன்முதலாக டி. ஏ. ராஜபக்ஷ அவர்களுக்கு அமைச்சுப் பதவியொன்றுக்காக பிரதம அமைச்சர் அவர்களால் அழைப்பு விடுக்கப்பட்டது. ஆயினும், தமது உறவுமுறை மகனான, இளைஞர் லக்ஷ்மன் ராஜபக்ஷ அவர்களுக்கு அப்பதவியை வழங்கும்படி டி. ஏ. ராஜபக்ஷ அவர்கள் வேண்டிக் கொண்டார்கள். எவ்வாறாயினும் லக்ஷ்மன் ராஜபக்ஷ அவர்களுக்கும் பதவியொன்று கிடைத்ததோடு, கமத்தொழில், காணி அமைச்சரின் உதவி அமைச்சராகச் செயலாற்றுவதற்கான பதவியொன்று இவருக்குக் கிடைத்தது.

காலத்தை பிரதிநிதித்துவப்படுத்திய பண்டாரநாயக்க அவர்கள் மிகவும் கஷ்டப் பிரதேசமொன்றைச் செழிப்புறச் செய்து (எம்பிலிபிட்டிய) குடியேற்றத்திட்டமொன்றை உருவாக்கி சந்திரிக்கா குளத்தையும் நீர்ப்பாசனத் திட்டமொன்றையும் அமைத்தார். இதனை முன்மொழிந்தவராகவும், இதற்கு அழைப்பு விடுத்தவராகவும், அதே போன்று இதன் செயற்பாட்டு உதவியாளராகவும் டி. ஏ. ராஜபக்ஷ அவர்களே விளங்கினார்.

உலர் வலயத்தை வரட்சியிலிருந்தும், பட்டினியிலிருந்தும் பாதுகாக்கும் பொருட்டு தொலைநோக்குடனான அறிவுடன் சிறு நீர்ப்பாசனத் திட்டங்களை அபிவிருத்தி செய்வதற்கு டி. ஏ. அவர்கள் முன்வந்தார்கள். முருதவெல நீர்த்தேக்கத்தைக் தழுவியதான திட்டம், கிராம ஓயா அபிவிருத்தி, உடுகிரிவில நீர்த்தேக்கத்தைத் தழுவியதான நீர்ப்பாசன அபிவிருத்தித் திட்டம், தங்கலுவேல்ல, பெரகம, அங்குணுகொலபெலஸ்ஸ ஆகிய கமநல மற்றும் நீர்ப்பாசன திட்டங்களை இதற்கான உதாரணங்களாகக் காட்டலாம்.

காணி, சொத்துக்களுடன் வசதிபடைத்த ஒருவராக அரசியலில் பிரவேசித்த டி. ஏ. ராஜபக்ஷ அவர்கள் காலமாகின்ற போது தமது வீட்டைக்கூட ஈடுவைத்திருந்த ஒரு ஏழையாகவே இருந்தார்.



9 – H 29785

அதே போன்று தான் மரணப்படுக்கையில் இருக்கின்ற போது மிக அமைதியாகவும், திருப்தியுடனும் அவர் தனது அன்பு மனைவியும் பிள்ளைகளும் சூழ இருக்கையில் என்ன கூறினார் தெரியுமா? நான் உங்களுக்காகச் சேமித்து வைத்துள்ள காசு பணமோ, காணி பூமிகளுடன் கூடிய சொத்துக்களோ கிடையாது ஆனால் பிரதேசத்திலுள்ள மக்களின் நன்மதிப்பையும், அன்பையும் நிறையவே சம்பாதித்து வைத்துள்ளேன். அதனை எதிர்காலத்தில் ஏற்றுச் செயலாற்றுங்கள். அப்போது நீங்கள் அனைவரும் எப்போதுமே அதிர்ஷ்டசாலிகளாகவே இருப்பீர்கள். இன்று நடைபெற்றுள்ளது அதுவல்லவா?

1947 செனேற் சபையின் தலைவர் தெரிவு செய்யப்படுவதற்கு முந்திய நாள், பணக்காரர்களாகவும் உயர் குலத்தைச் சேர்ந்தவர்களுமாயிருந்த மூவர் டி. ஏ. அவர்கள் தங்கியிருந்த "சிராவஸ்தி" இல்லத்திற்கு இரவு 8.00 மணியளவில் வந்து, இவரை ஒரு பிரசித்தி பெற்ற கலந்துரையாடலில் கலந்துகொள்ளச் செய்து, ஏதேனுமொரு முறைகேடான விடயத்துக்குப் பயன்படுத்துவதற்கு முயற்சித்துள்ளனர். அப்போது தனது அமைதியும் அடக்கமுமான போக்கை மாற்றி கொதித்தெழுந்த சிங்கத்தைப் போன்று கர்ஜித்து, தமது பிரதேச மக்களின் மதிப்புமிக்க சுய கௌரவத்தைப் பாதுகாக்கும் வகையில் அவர்களைத் துரத்திவிட்டார். "நான் எனது ஏழை ருகுணு மக்களை விற்றுப் பணம் சம்பாதிப்பதற்கு இங்கு வரவில்லை" என அவர் எழுதிய சிங்க கர்ஜனை எவ்வளவு பெறுமதி வாய்ந்தது? (1976 ஒன்பதாவது டி. ஏ. நினைவு தின மலர் ஆம் பக்கம்)

இன, குல, மத, சாதி, பேதங்களின்றி – இனவாத கருத்துக்களை ஒடுக்கி உருவாக்கிய கலாசார மலர்ச்சியினை இங்கு குறிப்பாகச் சுட்டிக்காட்டுதல் வேண்டும். நாடு பூராகவும் பெருமளவு வியாபித்துள்ள உறவினர் வலையமைப்பொன்று இந்த ராஜபக்ஷ குடும்பத்தைச் சூழவும்

அமையப் பெற்றுள்ளது இதனாலாகும். இன்று அரசியல் தலைமைத்துவத்திலுள்ள எந்தவொரு குடும்பத்திற்கும் பல்வேறு தராதரங்களிலும் துறைகளிலும் இவ்வளவு வியாபித்துள்ள உறவினர்களும் நண்பர்களும் இல்லையெனக் கூறலாம்.

ருகுணையின் கிருவாவிலிருந்து நாட்டுக்கு அளிக்கப்பட்டுள்ள வழக்கங்கள் மற்றும் மரபுரிமைகளின் செயற்பாடு சக்தியினைப் புரிந்து கொள்வதற்கு, ராஜபக்ஷ செயற்பாட்டின் காரணிகளை சரிவரப் புரிந்து கொண்டு அதற்குரித்தாயுள்ள இடத்துக்குக் குறுக்கே நிற்காதிருப்பதானது, உண்மையான மக்கள் எதிர்பார்ப்புகளை நிறைவேறச் செய்வதற்கு உதவியாயிருக்கும்.

காலஞ்சென்ற டி. ஏ. ராஜபக்ஷ அவர்களை நினைவுகூரும் இவ்வேளையில் அவரது ஆத்மா சாந்தியடைய பிரார்த்திப்போமாக!

செல்லமுத்து சோமசந்திரன்
இணைப்புச் செயலாளர்.
கிழக்கு மாகாண சிங்கள, தமிழ். முஸ்லிம்
சமாதான ஒன்றியம்.

# හෙළය එළිකළ රුහුණු මහ පහන

විමල් රූබසිංහ

"ඉන්දියන් සාගරයේ මුතු ඇටය" යන විරුදාවලියෙන් ලෝවැස්සන් අතර දැනහැඳිනීමට ලක්වූ මේ උතුම් දිවයිනේ රුහුණු මහ පෙදෙස නැතහොත් පැරණි බෙදීම අනුව "රෝහණ දේශය" දුරාතීතයේ පටන් ශ්‍රේෂ්ඨ නරපතියන්, උගතුන්, වියතුන්, රණවිරුවන් ඉපිද හැදුන වැඩුන දස්කම්-විස්කම් පෙන්වූ පුණ්‍යවන්ත පෙදෙසකි. සැත්තෑ වසරක් දැහැමෙන් සෙමෙන් රජකම් කරමින් සිරිලක සමෘද්ධිමත් කළ පණ්ඩුකාභය රජතුමා වීරකැටියේ බුද්ධියාගම හැදුන වැඩුන හා සිප්සතර හදාළ බව ප්‍රකට ය. යොවුන්වියට පත් පණ්ඩුකාභය කුමරු රජකම ගැන්මට යුදපිටියට යාම සඳහා කසාගලින් එකතු කළ සේනාව රැස් කළේ වීරකැටියට යි. "වීරයන් කැටිකළ" ස්ථානය පසුකලෙක, වීරකැටිය යන ග්‍රාම නාමයෙන් ප්‍රකට විය. සිරිලකට අනන්‍යවූ බෞද්ධාගමික උරුමයන් විනාශකරමින්, ජාතික සමගියට ද බාධා කරමින්, කලක් සිරිලක ඒකීයභාවය බිඳ දමා මෙරට පාලනය කළ ද්‍රවිඩයන්ගෙන් රට මුදාගෙන ඒකීය ශ්‍රී ලංකාවක් ඇතිකිරීමට ක්‍රියාකළ වීර දුටුගැමුණු කුමරු රුහුණේ මාගම උපන්නේ ය. එතුමාට යෝධ ශක්තියක් වූ දශ මහ යෝධයන්ගෙන් අට දෙනෙකු ම රුහුණේ ජන්ම දායාදය

ලද්දෝ ය. මොවුන් අතර, මිද්දෙනියේ උපන් කංචදේව, කරඹගල ආරණ්‍ය සේනාසනය අසල අන්දරවැව නම් ගමේ උපන් මහාසේන ගඟ හෙවත් වර්තමාන වලවේ ගඟ අසල උපන් වේළුසුමන, වර්තමාන නෙටොල්පිටියේ උපන් ගෝඨයිම්බර, සිතුල්පව්ව අසල ගමක උපන් ඵුස්සදේව සහ රන්මල වරාපිටියේ උපන් ලභියවසභ ආදීන් ප්‍රධාන ය.

ලංකාවේ සොලී බලය බිඳහෙලා එක්සේසත් කළ මහාවිජයබාහු රජතුමා ද රුහුණේ උපන්නෙකි. බෞද්ධාගමික, සංස්කෘතික හා කලා අංගවලින් ද ගත්කල මුල්කිරිගල, නයිගල, කසාගල, සිත්තම්ගල්ලෙන, තිස්සමහාරාමය, සිතුල්පව්ව, කතරගම, කිරිවෙහෙර ආදී චිර ප්‍රසිද්ධ පූජනීය වෙහෙර විහාර සිය ගණනක් ද රුහුණු නරපතීන්ගේ අගනා නිර්මාණයන් ය.

මේ ඓතිහාසික රුහුණු මහ පෙදෙස මෑත දී වැඩියෙන් කථා බහට ලක්වන ජනප්‍රිය කරුණාවන්නේ දෑහිතකාමී රාජපක්ෂ පවුලේ උදාව යි. මේ බව 1976 ජූනි මස අගදී සිදුවූ ගරු ධීවර හා සෞඛ්‍ය අමාත්‍ය ජෝර්ජ් රාජපක්ෂ මැතිතුමාගේ ආදාහන උළෙල දා වීරකැටියේ රාජපක්ෂ ක්‍රීඩාංගනයේ දී එවකට අග්‍රාමාත්‍යව සිටි ගරු සිරිමාවෝ ආර්.ඩී බණ්ඩාරනායක මැතිණිය පැහැදිලි ව ප්‍රකාශ කළා ය. රුහුණු සිංහයා යන විරුදාවලියෙන් හැඳින්වූ ඩී.එම්. එදා මෙරට රාජ්‍ය මන්ත්‍රණ සභාවට පත්වෙමින් ආරම්භ කළ මේ ගමන ඉන්පසුව සාර්ථකව ඉදිරියට ගෙනගියා, මගේ සැමියා වූ දිවංගත එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ හෙවනැල්ල මෙන් එදා රුහුණු නායකත්වය ගත්තා. අද අවසන් ගමන් යන ජෝර්ජ් ද එපරිද්දෙන් ම මගේ ආණ්ඩුවේ දක්ෂ ඇමතිවරයකු ව සිටිමින් මට අයෝමය ශක්තියක් ගෙනදුන්නා. මොහුගේ හදිසි වියෝව මට දරා ගත නොහැකි යි. (ගරු අගමැතිනිය කඳුළු සලයි) මේ අනුව අද

පිරවිය නොහැකිමුත් ඒ සඳහා මේ රාජපක්ෂ පවුලෙන් මෙරට තව තවත් ජන නායකයින් බිහිවනු ඇත. එදා ඒ ගරු අගමැතිනියගේ කථාවේ හරය යි. දේශයේ ආරක්ෂාවට, ආර්ථිකයට හා සමාජ ප්‍රගමනයට අභියෝගාත්මක අවස්ථාවන් උදාවූකල්හි, ඒ දුර්භාග්‍යයන්ගෙන් රට, ජාතිය ගලවා ගැනීමට පුණ්‍ය පුත්‍රයන් බිහිකිරීම, සුරැකීම හා ඔවුන් ජාතියට දායාද කිරීම රුහුණු ඉතිහාසයේ පෙරසිට ම විද්‍යාමාන ය. කාවන්තිස්ස, දුටුගැමුණු, සද්ධාතිස්ස, වලගම්බා මහා විජයබාහු ආදී ශ්‍රේෂ්ඨ නරපතියන් රැසක් මෙලෙස රුහුණින් බිහිවූ, රුහුණේ ඇති දැඩි වූවෝ වෙති.

ඒ අනුව, ශතවර්ෂ කිහිපයක සාභිමානී ඉතිහාසයක් ඇති රුහුණු රාජපක්ෂ පරපුර ද යුගයට අවශ්‍ය නායකයන් රැසක් බිහිකර ඇත. මේ යුගමෙහෙවරෙ හි කැපීපෙනෙන නාමයන් අතර, ඩී.එම්. රාජපක්ෂ, ඩී.සී. රාජපක්ෂ, ඩී.ඒ. රාජපක්ෂ, ලක්ෂමන් රාජපක්ෂ, ජෝර්ජ් රාජපක්ෂ, නීල් රාජපක්ෂ ආදී දිවංගත ජන ප්‍රධානින්ගේ නම් රැසක් එක්වර ම සිහියට නැගේ. මින්, ඩී.එම්. රාජපක්ෂ මැතිතුමා හා ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා රාජ්‍ය මන්ත්‍රණ සභා මන්ත්‍රීන් ලෙස හම්බන්තොට අසුන නියොජනය කළහ. ඩී.ඒ. රාජපක්ෂ, ලක්ෂමන් රාජපක්ෂ හා ජෝර්ජ් රාජපක්ෂ මැතිඳුන් ද පාර්ලිමෙන්තු මන්ත්‍රීවරුන් ලෙස හම්බන්තොට දිස්ත්‍රික්කය හා එහි මැතිවරණ කොට්ඨාස කිහිපයක් නියෝජනය කරමින් මැති ඇමැති ආදී සම්භාවනීය නිලතල රැසක් හෙබවූහ. දිවංගත අමාත්‍ය ජෝර්ජ් රාජපක්ෂ මැතිඳුන්ගේ දියණිය, නිරුපමා රාජපක්ෂ මැතිණිය ද හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරමින් අද පාර්ලිමේන්තු මන්ත්‍රිනියක ලෙස කටයුතු කරන්නී ය. එඩිතරභාවය, නිහතමානිත්වය, පොදු ජනතා මෙහෙවරට ඇපකැපවීම ආදී ශ්‍රේෂ්ඨ මානව ගතිගුණයන්ගෙන් පිරිපුන්වීම නිසා මෙකී නායකයින් විශේෂයෙන් ම රුහුණු පෙදෙස්

වැසියන්ගේ මතකයේ සදා නොවෙනස් ව සටහන් ව ඇතිබව මගේ අත්දැකීම යි.

ශ්‍රී ලංකාවේ වත්මන් ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ද, වරාය, ගුවන්සේවා, වාරිමාර්ග හා ජලකළමනාකරණ අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා, පාර්ලිමේන්තු මන්ත්‍රී බැසිල් රාජපක්ෂ මැතිතුමා සහ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා යනාදී දැනට සෘජු ව දක්ෂ ව ක්‍රියාකාරී සමාජ මෙහෙවරෙහි යෙදෙන සිව්දෙනා ද, ඇතුළුව වටිනා දූදරුවන් නව දෙනෙකු ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා මෙරටට දායාද කළේ ය. ඉහත නම් සඳහන් කළ තම සොහොයුරන් සිවු දෙනාට ද සිය කලත්‍රයන් හා බන්ධු මිත්‍රාදීන් සමග දැඩි සමගියෙන් සවියදීමට අනිකුත් සහෝදර සහෝදරියන් ට පුරුදු පුහුණු කළේ ඔවුන්ගේ දිවංගත මව්පියන් වන ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා හා දෝන දන්දිනා සමරසිංහ දිසානායක මැතිණිය විසිනි.

දිවංගත ජනතා නායක ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමාගේ 40 වැනි ගුණ සමරුව සිදුකරෙන මේ අවස්ථාවේ එතුමන්ගේ මාහැඟි ගුණ කඳින් බිඳක් හෝ මෙනෙහිකර සටහන් කිරීම යුතුකමක්, සේවයක් මෙන් ම භාග්‍යයක් ලෙස ද මම සලකමි. 1905 මාර්තු මස 30 වැනි දින වීරකැටියේ දී උපන් ඩී.ඒ. රාජපක්ෂ කුමරුවා ගමේ පාසල වූ මංඩාඩුව විදුහලින් සහ ගාල්ල රිච්මන්ඩ් විදුහලින් අධ්‍යාපනය ලැබී ය. පාසැලේ දී අධ්‍යාපනයට මෙන්ම බාහිර ක්‍රියාකාරකම්වලට ද එකසේ දස්කම් පෑ එතුමා අති දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙකු වූ අතර, ගුරු සිසු දෙපිරිස ම අතර දැඩි ජනප්‍රියතාවයක් ලැබ ඇත. පාසැල් අධ්‍යාපනය හමාර කිරීමෙන් පසුව එතුමා හුරුපුරුදු ගම් දනව්වට පැමිණියේ රටට, ජාතියට, ආගමට ප්‍රබල

මෙහෙයක් ඉටු කිරීමට ය. ශ්‍රී ලංකාව මේ යුගය වනවිට පැවතියේ එංගලන්තයේ යටත් විජිතයක් ලෙස ය. නිදහස් නිවහල් දේශයක් සඳහාවූ සටනේ පුරෝගාමීත්වය ගත් රාජපක්ෂ පවුලේ ප්‍රබලයෙකු වූ මෙතුමාගේ ශක්තිය එයට ද ජවයක් විය. ගමේකම ඇගයූ එතුමා ගැමියන් සමග සුහද ව සමීප ව සිය කටයුතු කරමින් සිටිය දී 1945. 05. 18 වැනි දින එවකට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ හම්බන්තොට අසුන නියෝජනය කළ සිය සොහොයුරු ඩී.එම්. රාජපක්ෂ මැතිඳුන්ගේ හදිසි වියෝව සිදුවිය. කෙත, නියර, නගුල, උදැල්ල, දෑත, දෙපයට හුරු ඩී.ඒ. රාජපක්ෂ මහතා ගොවි පිරිසක් සමග වෙල් යායේ වප් මෙහෙයේ යෙදී සිටිය දී එතැනට පැමිණි පක්ෂ සංවිධායකයින් අතුරු මැතිවරණ නාම යෝජනාපතට එහි දී අත්සන් ලබා ගත්හ. අතුරු මැතිවරණය කැඳවිනි. එතුමා නිතරගයෙන් හම්බන්තොට අසුනට තේරී පත්විනි. 1945 අගෝස්තු මස 08 වැනි දින රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අසුන්ගත් එතුමා එතැන්සිට පාර්ලිමේන්තුවේ තනතුරු රැසක් හෙබවී ය. තමන්ට වඩාත් හුරුවූ ප්‍රදේශයට විශේෂයෙන් ම වැදගත් වූ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ විධායක කාරක සභාවේ සාමාජික ධුරයකට 1945 අගෝස්තු මස 08 වැනි දින එතුමා පත් කෙරිනි. ඉන්පසුව එනම්, ඔක්තෝබර් මස 14 වැනි දා සිට ප්‍රථම පාර්ලිමේන්තුවේ බෙලිඅත්ත ආසනයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ලෙසින් 1964 නොවැම්බර් මස 26 වැනි දින දක්වා දශක දෙකක් එතුමා හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ජනතාව නියෝජනය කළේ ය. මෙකී කාලය තුළ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, කෘෂිකර්ම ඉඩම් අමාත්‍යවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, වැඩ බලන කෘෂිකර්ම අමාත්‍ය, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍ය, පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කාරක සභාපති, නියෝජ්‍ය කථානායක ආදී තනතුරු රැසක් දක්ෂ

හා විචක්ෂණලෙස හොබවන ලදී. ගම, නගරය යන දෙකෙහි ම යහසිරිත් අගය කළ මෙතුමා රාජපක්ෂ පරපුරට ආවේනික සමානාත්මතාවයෙන් බැඳි නිහතමානිත්වය ද, දේශ හා ජාතිමාමකත්වයෙන් ද, බුදු දහමින් ඔපවත් වූ ආගමික සංස්කෘතික බැඳියාවෙන් ද, ගොවිකම්, වාරිකම් හා බැඳි ජීවන රටාවෙන් ද ඔදවැඩී,එකී ක්ෂේත්‍රයන් ට ප්‍රබල ජවයක් දුන්නේ ය. රුහුණු දනව්ව බතින් බුලතින් සරු කෙරෙන වලවේ ගඟ ව්‍යාපාරයේ ප්‍රථම පියවර වන චන්ද්‍රිකා වැව, ගිරුවාපත්තුව හා මාගම්පත්තුව සරු කෙරෙන මුරුතවෙල ව්‍යාපාරය යන මහා වාරිමාර්ග රැසක් පිළිබඳ යෝජනා මෙතුමා ඉදිරිපත් කළ අතර, දැඩි පරිශ්‍රමයකින් ඒවා ක්‍රියාත්මක කරවී ය. හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ග්‍රාමීය වැව් විශාල සංඛ්‍යාවක් මේ යුගය වනවිට නටඹුන් ව තිබුණි. කෘෂිකර්ම හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා ලෙසින් දක්ෂ ලෙස කටයුතු කළ මෙතුමා ඒවා රැසක් පිළිසකර කරවී ය. ගොවිතැන ම ජීවනෝපාය කරගත් හම්බන්තොට දිස්ත්‍රික් ගොවි ජනතාව එතුමා දේවත්වයෙන් සලකන්නට පුරුදු වූයේ ඔවුන් නිසගයෙන් ම කළගුණදන්නන් වූ බැවිනි. පාරම්පරික ව අඳයට වැඩ කරගෙන එන කුඹුරේ නීත්‍යානුකූල අයිතියක් ගොවියාට ගෙන ඒමට පැනවූ නීතිය කුඹුරු පනත යි. මේ ඓතිහාසික පනත පාර්ලිමේනතුව ට ගෙනවිත් සම්මතකර බලාත්මක කිරීමට අමාත්‍ය පිලිප් ගුණවර්ධන මැතිතුමා සමග එම අමාත්‍යාංශයේ උප ඇමතිවරයා ලෙස පියවර ගත්තේ ය. දිවංගත අග්‍රාමාත්‍ය එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාට 1956 විප්ලවයට යෝධ හස්තයක් වූ මෙතුමා ක්‍රියාවෙන් ම සිය දේශපාලන එඩිතර භාවය ප්‍රකට කළේ ය. ගරු අමාත්‍ය සී.පී ද සිල්වා වැනි අතිදක්ෂ ඇමතිවරුන් ද මෙතුමා සිය ශක්තිය කර ගත්හ.

වී ගොවිතැන, එළවලු වගාව, පොල් වගාව, අපනයන කෘෂි භෝග වගාව, කජු වගාව, ධීවර කර්මාන්තය, කඩදාසි නිෂ්පාදනය ඇතුළු විවිධ කාර්මික නිෂ්පාදනයන්, අත්යන්ත්‍ර පේෂකර්මාන්තය, රන් රිදී පිත්තල ආදී ශිල්පීය නිපුනතා කර්මාන්ත යනාදී සෑම ක්ෂේත්‍රයක ම නියැලෙන්නන්ට මෙතුමාගෙන් ලැබුනු පිටුබලය යෝධ ශක්තියක් විය. බුද්ධාගම, මුස්ලිම් ආගම යන දෙක ම ප්‍රදේශයේ පවතිනි. ආගමික සමානත්වය ඇගයූ මෙතුමා මෙකී ආගම්වල දියුණුවට එකසේ උනන්දු විය. විශේෂයෙන් ම බෞද්ධ වෙහෙර විහාරවලට නිතර ගමන් කළ මෙතුමා එවායේ භික්ෂූන් වහන්සේලාගේ සුවපහසුව විචාරා විහාරස්ථාන සංවර්ධනයට සුවිශේෂ මෙහෙවරක් ඉටුකළේ ය. ප්‍රදේශයට අවශ්‍යව තිබූ අධ්‍යාපනය දියුණු කිරීමට අළුතින් පාසැල් කිහිපයක් ම ඇරඹීමටත්, පැවති පාසල් වැඩිදියුණු කිරීමටත්, ඒවාට අවශ්‍ය පහසුකම් සැලැස්වීමටත්, ඇප කැපවී ක්‍රියාකළේ ය. දේශීය මෙන්ම බටහිර වෛද්‍ය පහසුකම් ද ප්‍රදේශය තුළ වැඩි දියුණු කරමින් හා ඇතිකරමින් සෞඛ්‍ය සේවාව ඉහළ නැංවී ය. මාර්ග සංවර්ධනය, විදුලිය ආදී යටිතල පහසුකම්, තැපැල් හා දුරකථනසේවා ඇතුළු සෑම සංවර්ධන අවශ්‍යතාවයක් ම එතුමාගේ බැල්මට යොමු වී සංවර්ධනය විය.රටට, දැයට, සමයට මේසාවිශාල යුගමෙහෙවරක් කළ ගරු ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා 1967 නොවැම්බර් මස 07 වැනි දින දිවංගත වූයේ තවත් දීර්ඝකාලීන දේශපාලන, ආර්ථික සමාජ මෙහෙවරකට වටිනා දරු පිරිසක් රටට දායාද කරමිනි. එතුමාගේ අභාවය පිළිබඳ පුවත විශේෂයෙන් රුහුණට ත් පොදුවේ මුළු රටට ත් එදා විශාල කම්පනයක් ම විය. එතුමාගේ සුවිශේෂී සේවාව දෙසත්, අසහාය පෞරුෂය හා උතුම් චරිතාංග දෙසත් බලන කල දිවංගත ඩී ඒ රාජපක්ෂ මැතිතුමා මහා ප්‍රදීපස්ථම්භයකි.

වීරකැටියෙන් දැල්වුන එම ප්‍රදීපය මැදමුලනෙන් ප්‍රභාෂ්වර විය. එහි සුපසන් ආලෝකය පළමුව රුහුණ එළිය කළේ ය. එතුමා ට උප ඇමතිධුර හා ඇමතිධුරද, උප කථානායක පදවිය ද පිරිනැමුණ කල්හි, වී ප්‍රදීපාලෝකය රටට ම එළිය ගෙනදුනි. තම පුතුන් රාජ්‍ය පාලන ප්‍රධානීන්, මන්ත්‍රීවරුන්, ඇමතිවරුන්, අගමැතිවරයා සහ ජනාධිපතිවරයා ත් වනකල් හි ඒ රුහුණු මහ පහනේ එළිය ලොව බබුළුවනවා නොවේද?

වැනිය නොහැකි ඩී.ඒ. රාජපක්ෂ ශ්‍රීමතානන්ගේ ගුණ කදම්භයට උපහාරයක් ලෙස සුභාෂිතයේ මතු දැක්වෙන කවිය ද සටහන් කරමි.

පහනින් පහන් සිය ගණනක් දැල්වුව ද
එපහන් සිළෙහි අළු අඩුනොව දිලෙන ලෙද
ලොව අන් සතුන් ගුණ පළ කෙරෙමින් නිබඳ
සුපහන් ගුණෙන් වැජඹෙති සුදනෝ පබඳ

පහනින් තවත් පහන් සිය ගණනක් දැල්වූවත් වී පහන් දැල්ලෙ හි ආලෝකය අඩුනොවී දිලිහෙන්නාක් මෙන් ම ප්‍රසිද්ධ වූ සත් පුරුෂයෝ නිරන්තරයෙන් අන්‍යයන්ගේ ගුණය ප්‍රකාශ කරමින් ඉතා ප්‍රසන්න ගුණයෙන් වැජඹෙන්නා හ.

මේ අනුව ඒ මහා සත්පුරුෂයාණන්ගේ ගුණ මෙනෙහි කිරීම ද කළගුණ සැලකීමේ උතුම් සත්පුරුෂ ගුණය නිසි ලෙස විදහාපාන ප්‍රසන්න වු ක්‍රියාවක්ම ය.

**විමල් රූබසිංහ**

# ඩී.ඒ. රාජපක්ෂ මහතා ගේ ජාතික මෙහෙවර අද වඩාත් දීප්තිමත්ව තිබේ

මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ

රුහුණේ, මැදමුලනේ රාජපක්ෂ පරම්පරාව මෑත ඉතිහාසයේ අත්‍යාවශ්‍ය ජාතික මෙහෙවරක නායකත්වය හිමිකරගෙන සිටී. 1985 සිට මන්ත්‍රීවරයෙකු ලෙස රාජ්‍ය මන්ත්‍රණ සභාවට ගිය ඩී.ඒ. රාජපක්ෂ මහතා සිය සහෝදරයා වූ ඩී.ඇම්. රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ අභාවයෙන් හිස් වූ රුහුණේ නායකත්වය වෙනුවෙන් පෙනී සිටියේ ය. ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබා මන්ත්‍රීවරයෙකු මෙන් ම ඇමතිවරයෙකු වූ එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා ගේ දේශපාලනදැක්ම වටහා ගැනීමට තරම් බුද්ධියක් තිබූ රාජපක්ෂ මහතා, 1951 දී බණ්ඩාරනායක මහතා සමග එක්සත් ජාතික පක්ෂයෙන් අස්ව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවාගෙන නව දේශපාලන මාවතකට පිවිසියේ එක්සත් ජාතික පක්ෂයේ බ්‍රිතාන්‍ය ගැති දේශපාලන ආර්ථික වශයෙන් සම්පූර්ණ ස්වාධීනත්වයට පත්කරගැනීමේ වැදගත්කම වටහාගෙන යි. එවැනි දේශපාලන දැක්මක් එකල එක්සත් ජාතික පක්ෂයේ රැඳීසිටි අයට නොවී ය. ඩී.ඒ. රාජපක්ෂ මහතා පමණක්

නොව ඔහුගේ පුතුන් සිව් දෙනා ද ඒ නිවැරදි දේශපාලන මාවතේ ගමන් කරනු දක්නට ලැබීම මේ රටේ ජාතික ආරක්ෂාව හා දියුණුව පතන කාගේත් සතුටට කරුණකි.

1815 න් පසු ලංකාව පූර්ණ ස්වාධීන රටක් බවට පත්කර ගැනීමට ත් බලකඳවුරු ශක්තිමත් නොකර තම රටේ දේශපාලන, ආර්ථික, ආගමික හා සමාජ සංවර්ධනය සඳහා ත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් 1956 සිට එහි නායකත්වය යටතේ මහජන එක්සත් පෙරමුණත් ගොඩනගාගෙන සිදුකළ යුග මෙහෙවර අතිවිශිෂ්ට වෙයි. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා හා සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය යන දෙදෙනා ගේ නායකත්වය යටතේ රටට සිදු වූ මහඟු සේවාවට මුළු රටම ණය ගැති ය. එහෙත් අවාසනාවකට මෙන් සිරිමා බණ්ඩාරනායක මැතිණිය පරදවා 1977 දී ජේ.ආර්. ජයවර්ධන මහතා අගමැති හා පසුව ජනාධිපති වීමෙන් මේ රට යලිත් භයානක තත්ත්වයකට පත් විය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉවසීමෙන් රැඳී සිටිමින් ප්‍රථම උත්සාහයෙන් ම රටේ ජනාධිපති වීමට සුදුසු පුත්‍රයෙකු රටට බිහිකර තනාදීමට ඩී.ඒ. රාජපක්ෂ මහතා ට හැකිවී තිබීම ජාතියේම වාසනාවක් විය. ඒ පුත්‍රයා මහින්ද රාජපක්ෂ මහතා ය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එහි නිර්මාතෘවරුන් වූ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක හා යලිත් එය නිවැරදිමගට ගැනීමට මහින්ද රාජපක්ෂ මහතාට ශක්තිය හා ධෛර්යය තිබීම ජාතියේත් රටේත් භාග්‍යයකි. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ත්, ජනතාව ත්, රට ත් අද මුහුණපාන භායනක ම ත්‍රස්ත්‍රවාදී උවදුරෙන් බේරා ගැනීමට කටයුතු කරන වේලාවක එම ප්‍රයත්නය දුර්වලකිරීමට දේශද්‍රෝහී බලවේග දරන නින්දිත උත්සාහයන් ගැන මහජනයා අවධියෙන් සිටිය යුතු ව තිබේ.

රටට ත්, සමාජයට ත් ආරක්ෂාව සඳහා කැපවී වැඩකරන රාජපක්ෂවරුන් ගේ ඒ ප්‍රයත්නය බිඳදැමීමට විරුද්ධ පක්ෂය උත්සාහ කරන්නේ රටත්, සමාජයත් ගැන නිවැරදි දැක්මක් නැති, බලය ගැන පමණක් කෑදරකමින් අන්ධවූවන් ලෙස බව මහජනයා වටහා ගත යුතු ය. මේ බලකාමය එක්සත් ජාතික පක්ෂයේ දැක්ම වී තිබේ. එය අනුමත නො කරන එම පක්ෂයේ කොටසක් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට සහය දැක්වීම අගය කළ යුතු ය.

ඩී.ඒ. රාජපක්ෂ, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක, සිරිමා බණ්ඩාරනායක සහ සමාජ හිතෛෂීන්ගේ දේශපාලන දර්ශනය ඇති ප්‍රබල පුතුන් සිව්දෙනෙකු ජාතියට දායාදකළ ඩී.ඒ. රාජපක්ෂ යුවලට මුළු ජාතියම ණයගැති ය. ඒ අනුව ඩී.ඒ. රාජපක්ෂ මහතා දීර්ඝකාලීන ව රටේ ආරක්ෂාවත් අනතුරුව ආර්ථික හා සමාජ සංවර්ධනයත් වෙනුවෙන් සිය පවුල ම කැප කළ පුද්ගලයෙකි.

මෑත ඉතිහාසයේ මේ රටේ දේශපාලන නායකයින් ලෙස ක්‍රියාකළ බොහෝ දෙනෙකුන් සමාජයට අමතක වී ඇත්තේ ඔවුන් දේශපාලනය කළේ ආත්ම තෘප්තිය සඳහා පමණක් වීම නිසයි. තවත් දේශපාලන නායකයන් ජීවත්ව සිටිය දී හොරුන් ලෙස හඳුනාගනු ලැබීම සිදුවිය. එවන් දේශපාලන වාතාවරණයක දිනෙන්දින වැඩි වැඩියෙන් සම්මානයට පත්වන දේශපාලන නායකයින් ලෙස, ඩී.ඒ. රාජපක්ෂ, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක, සිරිමා බණ්ඩාරනායක, මහින්ද රාජපක්ෂ වැනි කිහිප දෙනෙකුන්වත් සිය කාර්යභාරය ඉටු කිරීම සැනසීමට කරුණකි.

REFERENCE

2 136



ඩී.ඒ. රාජපක්ෂ මහතා දේශපාලනය මුවාවෙන් ජාතික දේපළ මංකොල්ලකා පොහොසත් වූවෙක් නොවී ය. ගොවියෙකු වශයෙන් සිට දේශපාලන නායකයෙකු ව තම ප්‍රදේශයට විශේෂයෙනුත්, මුළු රටට සාමාන්‍යයෙනුත් දිගු කලක් පවතින සමාජ මෙහෙවරක්කොට එයින් සතුටට පත් වූවෙකි. ඒ පූර්වාදර්ශය දරුවන් විසින් ද අනුගමනය කිරීම එතුමාගේ අපේක්ෂාව වූවට සැකයක් නැත. මෙසේ බොහෝ දෙනාගේ සිතසුව වෙනුවෙන් තම ජීවිතය කැපකර වැඩ කිරීම මානව ඉතිහාසයේ ලොව පහළ වූ ශ්‍රේෂ්ඨ ජනනායකයින් ගේ පොදු ලක්ෂණය වී තිබේ. එම ජනනායකයන් ට තිබූ සමාජ දැක්ම වටහාගෙන කටයුතු කිරීමට තරම් මානවදයාවක් හා බුද්ධියක් රුහුණේ මැදමුලනේ රාජපක්ෂ පරම්පරාවේ මැණිකක් බඳු වූ ඩී.ඒ. රාජපක්ෂ මහතා ට තිබීම ගැන එතුමා ගේ ගමට ආසන්න ගමක උපත ලැබූ මට මහත් ආඩම්බරයට කරුණකි

***මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ***

REFERENCE
ජනාධිපති කාර්යාලය
පුස්තකාලය
REFERENCE
ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# ඩී.ඒ.රාජපක්ෂ ගුණ සමරු ගීතය

මනරම් - ගුණදම්
සමරම් - බැතියෙන්
රාජපක්ෂ - මැතිඳුන්
ඩී.ඒ.රාජපක්ෂ මැතිඳුන්

නිබඳ නිහඬ බව
පලකළ ගැමිකම
පහල නිමල ගුණ
චඩිතර ඉවසුම
කුරහන් පැහැසර
සාටක මතකය
පුබුදයි යුගයෙන්
යුගයට අප හද

ගිරුවායේ ජන
දිවියට පණ නල
පිඹ පිඹ මතුකළ
උරුමය නව මඟ
මතු මෙබිමේ - උපදින පරපුරකට
යන ගමනේ - තිර ශක්තිය වනු ඇත

පැගිරි සුවඳ මුසු ඇල් පවනැල්ලක
ගම කිරිවදිනා කුරහන් පේනක
අදත් ඇසෙනවා රුහුණේ ගම්දොර
මෘදුබව කැටි කළ ඔබගේ කටහඬ

ගී පද රචනය : සුනිල් සරත් පෙරේරා
ස්වර රචනය : අමරසිරි පීරිස්
ප්‍රථම ගායනය : අමරසිරි පීරිස් ඇතුළු පිරිස

---

**සංස්කරණය**
**අමරසිංහ කුඩගල්ආරච්චි**